සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியச் சபை

Employees' Trust Fund Board




වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2025

# ජාතියේ හදගැස්ම සවිබල ගැන්වීම

***‘ජාතියේ හද ගැස්ම සවිබල ගැන්වීම’*** සඳහා නිරන්තර පරිණාමය සහ අවධානය අවශ්‍ය වේ. ඩිජිටල් පරිවර්තනය, විනිවිදභාවයෙන් යුත් පාලනය සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගැනීමට අප කැපවී සිටින්නෙමු.

2025 වසරේදී ද අප පෙනී සිටින්නේ අපගේ සාමාජිකයින් අප කෙරෙහි තබා ඇති නොසැලෙන විශ්වාසයේ සුරක්ෂිතකරු ලෙසයි. අප හුදෙක් අරමුදලක් කළමනාකරණය කරනවාට වඩා එහා ගොස්, ශ්‍රී ලංකාවේ හද ගැස්ම පෝෂණය කරමින්, රට සෞභාග්‍යය කරා යන ගමනේදී රට ගොඩනැගූ දෑත් සැබවින්ම සවිබල ගැන්වෙන බව සහතික කරමු.

# පටුන



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම

016 ආයතනික භාරකාරීත්වය

071 මූල්‍ය තොරතුරු

120 අතිරේක තොරතුරු

## 004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම

005 අන්තර්ගතය
006 අප කවුරුන්ද යන වග
007 ප්‍රධාන මූල්‍ය තත්ත්වයන්
008 ප්‍රධාන සන්ධිස්ථාන
010 අගය නිර්මාණය කිරීමේ මාදිලිය
012 මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්
014 කාර්ය සාධන සමාලෝචනය

## 016 ආයතනික භාරකාරිත්වය

017 සභාපතිවරයාගේ සමාලෝචනය
021 අධ්‍යක්ෂ මණ්ඩලයේ පණිවිඩය
023 කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ
040 අධ්‍යක්ෂ මණ්ඩලය
045 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිතවය
052 කළමනාකාරිත්ව කණ්ඩායම
054 ආයතනික පාලනය
064 අවදානම් කළමනාකරණය

## 071 මූල්‍ය තොරතුරු

072 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
074 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
075 සාමාජික ආදායම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
077 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
078 භාණ්ඩාගාර බැඳුම්කර කළඹේ වෙළෙඳපොල අගය
080 ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොල අගය
081 ස්කන්ධ අයෝජන ප්‍රකාශය
085 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

## 120 අතිරේක තොරතුරු

121 විගණකාධිපති වාර්තාව 2025
130 විගණකාධිපති වාර්තාව 2025 සම්බන්ධයෙන් මණ්ඩලීය නිරික්ෂණ
415 දස වසරක සංක්ෂිප්තය
417 සංඛ්‍යා ලේඛණ ඇමුණුම්
420 අපේ ළගාවීම්

# 45වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම



www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

# වාර්ෂික වාර්තාවේ **අන්තර්ගතය**

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 45 වන වාර්ෂික වාර්තාව වන අතර, මෙමගින් ආයතනය 2025 වසරේදී එහි ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දී ඇති ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයයි.**

2025 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 2025 ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය පුරා ක්‍රියාත්මක වන මෙහෙයුම් ආවරණය කරයි. නවතම වාර්තාව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතර, ඒ සඳහා මෙම වාර්තාව පුරාම සංසන්දනාත්මක තොරතුරු ලබා දී ඇත. මෙම වාර්තාවේ අන්තර්ගතය සංවිධානයට මෙන්ම එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට ද වැදගත් වන කරුණු අවධාරණය කරමින් සංවර්ධනය කර ඇත.

## වාර්තාවේ අරමුණ

අපගේ අනර්ඝ පාර්ශවකරුවන් සමග කෙටිකාලීන, මධ්‍යම හා දිගුකාලීනම වටිනාකම් නිර්මානය කිරීමේ අද්විතීය කාර්යභාරය බෙදාහදා ගැනීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණයි. එමෙන්ම එමගින් උපාය මාර්ග, පාලනය සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත සන්නිවේදනයක්ද ඉදිරිපත් කරන අතර, එහි මූල්‍ය කාර්ය සාධනය සහ සංවිධානය විසින් නිර්මාණය කරන ලද සමාජමය මං සලකුණු අතර සම්බන්ධතාවයද පෙන්නුම් කරයි.

වාර්තාව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත වලින් සමන්විත වන අතර සැසැඳීම් සහ වැඩිදුර විශ්ලේෂණයන් සඳහා පහසුකම් සැපයීම සඳහා හැකි සෑම තැනකම ප්‍රමාණාත්මක දත්ත සැපයීම අපගේ අරමුණයි. මූල්‍ය ප්‍රකාශන සහ අදාළ සටහන් රජයේ විගණක විසින් විගණනය කරනු ලබන අතර සහතික කිරීමේ වාර්තාවද මෙම වාර්තාව තුළ ඇත.

## වාර්තාවේ අනුකූලතාවය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ හොඳම චර්යා ආචාර ධර්ම සංග්‍රහය හා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත සමග ආයතනය අනුකූල වන්නේ කෙසේද යන්න පිළිබඳව පාලන වාර්තාව සාකච්ඡා කරයි.

## උපාය මාර්ගික දිශානතිය

වසර පුරා කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කිරීමට අමතරව, මෙම වාර්ෂික වාර්තාව පාර්ශවකරුවන්ගේ අභිවෘධිය සඳහා මණ්ඩලයේ වත්මන් සහ අනාගත කාර්යයන් පිළිබඳ අවබෝධයක් ලබාදෙයි.

**විමසීම් කළයුතු නිලධාරීවරයා**

**කේ.ඩී.ඒ.පී. කරුණාරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල්)

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
දුරකථන: +94 11 7747250
ෆැක්ස්: +94 11 7747209
විද්‍යුත් ලිපිනය: finance@etfb.lk

# අප කවුරුන්ද යන වග



සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනත යටතේ පිහිටුවන ලද අතර 1981 මාර්තු 1 වන දින සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී. එය කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද අතර, දැනට ක්‍රියාත්මක වන්නේ මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ය. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොපාන සියලුම රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම පෞද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ සේවා යෝජකයින් විසින් සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 3ක් මාසිකව අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. එබැවින් සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, මෙයට සේවකයා/ සාමාජිකයා වෙනුවෙන් දායකත්වය සපයන්නේ සේවායෝජකයා පමණක් වන අතර, එබැවින් එය සාමාජිකයා දායක නොවන ප්‍රතිලාභයකි. ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ගේ සහ සංක්‍රමණික සේවකයින්ගේ ස්වේච්ඡා සාමාජිකත්වය වැඩි කිරීම සඳහා විශේෂ අවධානය යොමු කෙරේ.

**මණ්ඩලයේ අරමුණු**
(1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 07 වගන්තිය අනුව)

අ) මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගි වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම;

ආ) ව්‍යවසායයන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම;

ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා විධි විධාන සැලැස්වීම: සහ

ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවැසි විය හැකි අන් සියලු ක්‍රියා හෝ දෑ ඉටු කිරීම.

## අපගේ වගකීම් හි ප්‍රස්තුතය

### දැක්ම

ආයතනික විශිෂ්ටත්වය තුළින් සමස්ත පාර්ශ්වකරුවන් සඳහා වූ ක්‍රියාශීලි හා ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම.

### මෙහෙවර

සාමාජිකයින් සඳහා වූ පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා විශිෂ්ට සේවාවක් සලසන සුහදශීලි හා විචක්ෂණශීලි භාරයක් වීම.

### වටිනාකම්

- නිර්මාණශීලි, නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය
- ජනතාවට සුහදශීලි සේවා වටපිටාව
- සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්
- විශිෂ්ට ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්
- ඉහළ මූල්‍ය ස්ථාවරත්වය
- තෘප්තිමත් පාරිභෝගිකයින්



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

# ප්‍රධාන මූල්‍ය තත්ත්වයන්

| | 2025 | 2024 | වෙනස |
|---|---|---|---|
| | රු. 000. | රු. 000. | % |
| **මෙහෙයුම්** | | | |
| මුළු ආදායම | 71,277,599 | 65,987,907 | 8.02 |
| මුළු පොලි ආදායම | 68,766,748 | 61,819,095 | 11.24 |
| මෙහෙයුම් වියදම් | 2,767,476 | 2,811,307 | (1.56) |
| බදුවලට පෙර ලාභය | 68,510,122 | 63,176,600 | 8.44 |
| බදු වියදම | 9,611,094 | 8,678,062 | 10.75 |
| බදුවලට පසු ලාභය | 58,899,028 | 54,498,538 | 8.07 |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය** | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 661,831 | 794,613 | (16.71) |
| FVTPL හි මූල්‍ය වත්කම් | 2,936,878 | 2,646,191 | 10.99 |
| FVTOCI හි මූල්‍ය වත්කම් | 14,893,209 | 14,708,973 | 1.25 |
| ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් | 644,575,893 | 563,248,506 | 14.44 |
| සාමාජික අරමුදල් සහ සංචිත | 667,406,942 | 585,984,840 | 13.89 |
| **සාමාජික දෘෂ්ටි කෝණය** | | | |
| සාමාජික අරමුදල | 637,443,057 | 564,326,576 | 12.96 |
| පොලි සහ ලාභාංශ | 55,303,829 | 51,301,803 | 7.80 |
| පොලි හා ලාභාංශ ප්‍රතිශතය (%) | 9.50% | 10% | (0.50) |
| සාමාජික ප්‍රතිලාභ | 403,573 | 452,742 | (10.86) |
| ආයෝජන මත ප්‍රතිලාභ | 11.36% | 11.92% | (0.56) |
| ස්කන්ධ මත ප්‍රතිලාභ | 9.80% | 10.20% | (0.40) |
| වත්කම් මත ප්‍රතිලාභ | 9.32% | 9.77% | (0.45) |

**1** **මුළු වත්කම** (රු. මිලියන)
**673,228**
591,256 (2024)

**2** **වර්ෂයේ ලාභය** (රු. මිලියන)
**58,899**
54,498 (2024)

**3** **සාමාජික අරමුදල** (රු. මිලියන)
**637,443**
564,327 (2024)

# ප්‍රධාන සන්ධිස්ථාන

**1986**

**මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු.100,000**

**1989**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය:
**නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු.200,000**

**1991**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
**හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාරය රු.200,000**

**1992**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
**අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය රු.18,000**

**1994**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
**පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් 9,000 ක් සඳහා රු. 15,000/= බැගින් මූල්‍යාධාර**

**1997**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මූල්‍යාධාර
| **ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය වසරකට රු.25,000 බැගින් රු.50,000 ක් උපරිමයක් දක්වා මුළු සේවාකාලය තුළදී**

**2002**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
**"වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය**



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

## 2006

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දූදරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය

**වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර: රු.300,000**

## 2010

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දූදරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර |

**අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මූල්‍යාධාර රු.12,000 බැගින් ශිෂ්‍යත්ව 5,000**

## 2016

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දූදරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර | අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මූල්‍යාධාර

**අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය රු.30,000 ක් දක්වා වැඩි කරන ලදි**

## 2022

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දූදරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය | අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මූල්‍යාධාර

**හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර රු.350,000 ක් දක්වා වැඩි කරන ලදි වකුගඩු බද්ධ කිරීම සඳහා මූල්‍යාධාර රු.350,000 ක් දක්වා වැඩි කරන ලදි**

## 2023

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දූදරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර |

**අ.පො.ස. උසස්පෙළ සඳහා පෙනී සිටි දූදරුවන්හට වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාරය "නිපුනතා සවිය" රු.50,000**

## 2024

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දූදරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර | අ.පො.ස. උසස්පෙළ සඳහා පෙනී සිටි දූදරුවන්හට වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාරය "නිපුනතා සවිය" රු.50,000

**රජයේ විශ්වවිද්‍යාල වලට ඇතුලත් වීමට සුදුසුකම් ලැබූ දරුවන් සඳහා මූල්‍යාධාරය (විශ්ව යාත්‍රා - රු.25,000)**

## 2025

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | පහ වසර ශිෂ්‍යත්ව සමත් දූදරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර |

**අ.පො.ස. උසස්පෙළ සඳහා පෙනී සිටි දූදරුවන්හට වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාරය "නිපුනතා සවිය" රු.50,000 | රජයේ විශ්වවිද්‍යාල වලට ඇතුලත් වීමට සුදුසුකම් ලැබූ දරුවන් සඳහා මූල්‍යාධාරය (විශ්ව යාත්‍රා - රු.25,000) ද අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය රු.50,000 ක් දක්වා වැඩි කරන ලදි.**

# අගය නිර්මාණය කිරීමේ මාදිලිය

## අගයන් සබලකාරක (ආදාන)

### ආයෝජන ප්‍රාග්ධනය

- සාමාජික අරමුදල - බිලියන 564

### සාමාජික ප්‍රාග්ධනය

- මුළු සේවායෝජකයන් 84,578
- මුළු සක්‍රිය සාමාජික ගිණුම් 2,654,811
- ස්වයං රැකියා හා සංක්‍රමික සේවා 45,728 සේවකයින්

### සේවක ප්‍රාග්ධනය

- මුළු කාර්ය මණ්ඩලය 847
- කාර්ය මණ්ඩලයෙන් 35% වැඩි පිරිසකට මණ්ඩලය සමග වසර 20 කට වැඩි පළපුරුද්ද ඇත
- දක්ෂ, පුහුණු සහ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය

### හවුල්කාර ප්‍රාග්ධනය

- මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
- සේවක අර්ථසාධක අරමුදල (EPF)
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

### සමාජ සහ ප්‍රජා ප්‍රාග්ධනය

- වැඩකරන පුද්ගලයින්



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

## අගය නිර්මාණය (ක්‍රියාවලි)

### දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

### ඉලක්ක හා අරමුණු

### උපාය මාර්ග සහ කටයුතු

### මූලික කටයුතු

- දායක මුදල් රැස්කිරීම්
- ක්‍රියාත්මක කිරීම්
- සේව්‍ය සම්බන්ධතා
- සාමාජික සේවා
- ආයෝජන

### ද්විතීය කටයුතු

- මූල්‍ය
- තොරතුරු තාක්ෂණය
- මානව සම්පත්
- අභ්‍යන්තර විගණන
- සංඛ්‍යා ලේඛන

### 1980 අංක 46 දරණ පනත

- ආයතනික යහපාලනය
- ආයතනික අවදානම් කළමනාකරණය

## නිර්මාණය කල වටිනානම (නිමැවුම්)

### අයෝජකයන්

- සාමාජික අරමුදල — බිලියන 637
- අයෝජන මත ප්‍රතිලාභ — 11.36%

### සාමාජිකයන්

- පොලිය — 3.00%
- ලාභාංශ — 6.50%

### සේවකයින්

- පුද්ගල වියදම් — බිලියන 1.5
- පුහුණු හා සංවර්ධන පිරිවැය — මිලියන 3.8
- සේවක පිරිවැටුම — 5% ට අඩු

### ප්‍රජාව

- හිමිකම් ගෙවීම (පොලි හා ලාභාංශ ඇතුළුව) — බිලියන 30
- හෘද සැත්කම් — මිලියන 168
- මරණ ප්‍රතිලාභ — මිලියන 98
- වසර 5 ශිෂ්‍යත්වය — මිලියන 94
- උසස් අධ්‍යාපනික දීමනාව — මිලියන 54
- නිපුනතා සවිය — මිලියන 0.44
- ශ්‍රම සුව යෝජනා ක්‍රමය — මිලියන 17
- නිත්‍ය දුබලතා — මිලියන 25
- වකුගඩු බද්ධ කිරීම් — මිලියන 6
- අභ්‍යන්තර අක්ෂි කාච — මිලියන 9.8




# මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

## දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා

පුද්ගලික අංශයෙහි සහ විශ්‍රාම වැටුපක් නොගෙවන රාජ්‍ය ආයතනවල සේවයෙහි නිරත සේවකයන්ගේ දළ ඉපැයීම්වලින් 3%ක් වූ ප්‍රමාණයකින් දායක මුදල් ගෙවීම අදාළ සේවායෝජකයා විෂයෙහි අනිවාර්ය කරුණක් වන්නේ ය. එම සේවායෝජකයන් වෙතින් කලට වේලාවට දායක මුදල් රැස්කර ගැනීම, අධිභාර වෙතොත් ඒවා අයකර ගැනීම, ගෙවීම් පැහැර හරින්නන් හා දායක මුදල් නොගෙවන්නන් සොයා බැලීම සහ ගෙවීම් පැහැර හරින්නන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීම යනාදිය දායක මුදල් රැස්කිරීමේ ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රමුඛ කාර්යයන් සමහරකි. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා අංශය, මණ්ඩලය වෙත ලැබිය යුතු දායක මුදල් රැස්කර ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් වගකීම උසුලයි.

## ආයෝජන

ආයෝජන අංශය යනු, මණ්ඩලයේ ආයෝජන කළඹ කළමනාකරණය කිරීම සඳහා පිහිටුවන ලද ආයතනය සතු ප්‍රධාන ව්‍යාපාරික ඒකකවලින් එකකි. මෙම ඒකකයේ ප්‍රධාන අරමුණු වන්නේ ආයෝජනවල ආරක්ෂාව සහතික කිරීම, ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගැනීම සහ ප්‍රශස්ත ප්‍රතිලාභ ඉපයීම යන කාර්ය භාරයයි. ආයෝජන තීරණ ගැනීම සඳහා වූ මාර්ගෝපදේශයක් ලෙස පුළුල් ආයෝජන ප්‍රතිපත්තියක් ආයතනය සතුව පවතී.

## සාමාජික සේවා

මෙම කොට්ඨාසය අයත් ප්‍රධාන කර්තව්‍යයන්හිලා, සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජිකයන් වෙත වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම, සාමාජික පොදු ප්‍රතිලාභ (සාමාන්‍ය හා මරණ හිමිකම්) ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් ඉටුකිරීම සහ සක්‍රිය සාමාජිකයන් වෙනුවෙන් වෙනත් සුභසාධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාම යනාදී කටයුතු අන්තර්ගත වේ. මෙම අංශයේ කටයුතු තවදුරටත් සවිමත් කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ පොදු කාර්ය යටිතල ව්‍යුහය සලසා දීම සඳහා ප්‍රමාණවත් පරිදි පියවර ගනු ලැබ තිබේ.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

## මුදල්

මුදල් කොට්ඨාසය හා සහබද්ධව පවත්නා කර්තව්‍යයන්හිලා, මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම, රජයේ බදු ඇතුළුව කාර්ය මණ්ඩලය හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම, ආයතනික සැලසුම් හා වෙනත් කළමනාකරණ තොරතුරු වාර්තා පිළියෙල කිරීම.

## පරිපාලන හා මානව සම්පත්

වත්මන් තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ බෙහෙවින් වැදගත් වන්නාවූ නවීන මානව සම්පත් විධික්‍රම හා විශිෂ්ටතම කාර්යාල පරිචයන් සමග ගැළපෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ තිබේ. සේවා සපයන ආයතනයක් වශයෙන් කටයුතු කරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විෂයයෙහි ද ජනතාවගේ (සේවා නියුක්තයන්ගේ) සේවා අවශ්‍යතාවය මත රැඳෙමින් කටයුතු කිරීම ඉතා ඉහළ තලයක විය යුතු වන්නේය. එබැවින්, පාලන හා මානව සම්පත් කොට්ඨාසය විසින් ඉටු කරනු ලබන කාර්යයන් සංවර්ධනය කර වැඩිදියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. ඒ අනුව, පාලන හා මානව සම්පත් අංශය විසින් පිළිපැදිනු ලැබිය යුතු දැනටමත් පවත්නා ක්‍රම සහ කාර්ය පටිපාටි යාවත්කාලීන කර වැඩිදියුණු කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන්නාවූ පුහුණුව ලබා දීම සඳහාත් විවිධ මුල පිරීමේ කාර්යයන් සිදු කර ඇත.

## තොරතුරු තාක්ෂණ

අරමුදලේ සාමාජික පාලන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කරමින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ කොට්ඨාසය ප්‍රධාන වශයෙන් වගකීම උසුලයි. ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව ක්‍රියා කරමින් ආයතනයට අයත් තොරතුරු තාක්ෂණ පරිසරය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස වූ සියලු මූලාරම්භක කටයුතු ඉටු කරනු ලැබ තිබේ.

## අභ්‍යන්තර විගණන

ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ප්‍රමාණවත් පරිදි ස්ථාපනය කරනු ලැබ ඇති බවටත්, එම පද්ධති අඛණ්ඩව හා ප්‍රශස්ත මට්ටමකින් අනුගමනය කරනු ලබන බවටත් සහතික වීමේ වගකීම අභ්‍යන්තර විගණන අංශය උසුලයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධාන විධායක නිලධාරීවරයා වෙත සෘජුවම වාර්තා කරනු ඇත. කළමනාකරණයේ මතය වනුයේ, අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රම හා කාර්ය පටිපාටිවල ප්‍රමාණවත්භාවය නැවත තක්සේරු කිරීම සඳහාත්, ආයතනයෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිලා අභ්‍යන්තර විගණනයේ කාර්ය භාරය ඵලදායි මෙවලමක් ලෙස ශක්තිමත් කිරීම සඳහාත් නිසි අධ්‍යයනයක් කළ යුතුය යන්න ය. රජයේ විගණන කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කටයුතුද අභ්‍යන්තර විගණන කොට්ඨාසයේ මගින් සිදුකරනු ලැබේ.

## නීති

මණ්ඩලයට අදාළ වන්නාවූ සියළුම නෛතික කටයුතු අරබයා උපදේශක සේවා ඒකකයක් ලෙස නීති අංශය ක්‍රියාත්මක වේ. අදාළ නෛතික කටයුතු ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය ව්‍යාප්ත කරනු ලැබීමත් සමග ප්‍රාදේශීය මට්ටම කරා විමධ්‍යගත කරනු ලැබ තිබේ. ප්‍රාදේශිය කාර්යාලවල නීති කටයුතු සඳහා සම්බන්ධ වීමට වෙනම නීති නිලධාරියෙකුද අනුයුක්ත කර ඇත.



# කාර්ය සාධන සමාලෝචනය

## අගය එකතු කිරීමේ ප්‍රකාශය

මණ්ඩලයේ අගය නිර්මාණය පිළිබඳ විශ්ලේෂණයක් සහ සමූහයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර වෙන්කිරීම පහතින් දැක්වේ.

| | 2025 | 2024 | වෙනස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | % |
| **එකතුකල වටිනාකම** | | | |
| ප්‍රධාන ව්‍යාපාරවලින් උපයන ලද ආදායම | 70,653.68 | 65,353.78 | 8.11 |
| සේවා පිරිවැය | (379.93) | (375.85) | 1.09 |
| **ප්‍රධාන ව්‍යාපාරවලින් එකතුකල වටිනාකම** | **70,273.75** | **64,977.93** | **8.15** |
| වෙනත් ආදායම් | 623.92 | 634.13 | (1.61) |
| FVTOCI ආයෝජන බැහැර කිරීමෙන් ලැබෙන ශුද්ධ ලාභය | 2,172.06 | 215.28 | 908.95 |
| ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් | (21.07) | (4.91) | 329.12 |
| **වටිනාකම එකතුකිරීම වටිනාකම එකතුකිරීම** | **73,048.66** | **65,607.15** | **10.98** |
| | | | |
| **වටිනාකම වෙන්කිරීම සේවකයන්ට** | | | |
| වැටුප්, වේතන සහ වෙනත් ප්‍රතිලාභ | 1,453.48 | 1,400.62 | 3.77 |
| | | | |
| **සාමාජිකයන්ට** | | | |
| සාමාජිකයන්ට ගෙවූ පොලිය | 17,464.35 | 15,390.53 | 13.47 |
| සාමාජිකයන්ට ගෙවූ ලාභාංශ | 37,839.48 | 35,911.28 | 5.37 |
| | | | |
| **රජයට** | | | |
| බදු වියදම් | 9,611.09 | 8,678.06 | 10.75 |



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

| | 2025 | 2024 | වෙනස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | % |
| **ප්‍රජාවට** | | | |
| සාමාජික ප්‍රතිලාභ | 403.57 | 452.74 | (10.86) |
| | | | |
| **ව්‍යාප්තිය සහ වර්ධනය සඳහා** | | | |
| රඳවාගත් ලාභ | 386.20 | 727.79 | (59.05) |
| ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය | 46.65 | 46.13 | 1.13 |
| ලාභාංශ සමකිරීමේ සංචිතය | 5,843.84 | 3,000 | 94.79 |
| | | | |
| **වෙන්කළ මුළු වටිනාකම** | **73,048.66** | **65,607.15** | **10.98** |

## එකතුකළ ආර්ථික වටිනාකම (EVA)

එකතුකළ ආර්ථික වටිනාකම ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. එකතු කළ ආර්ථික වටිනාකම යනු සැලැකිය යුතු අවදානමට කොටස් හිමියන් සඳහා අවශ්‍ය අවම ප්‍රතිලාභ ඉක්මවා යන හෝ අඩුකරන ඉපයීම් ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවයි.

| | 2025 | 2024 |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| **ආයෝජිත ප්‍රාග්ධනය** | | |
| සාමාන්‍ය සාමාජික අරමුදල | 600,884.82 | 534,380.64 |
| එකතු කළ: ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම | 9.04 | 30.10 |
| | **600,893.86** | **534,410.74** |
| | | |
| **ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ** | | |
| බදුකරණය පසු ලාභය | 58,899.03 | 54,498.54 |
| එකතු කළා: ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම | (21.07) | (4.91) |
| **ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය** | **58,877.96** | **54,493.63** |
| | | |
| අයෝජිත ප්‍රාග්ධනයේ ආවස්ථික පිරිවැය | (46,869.02) | (49,697.40) |
| **එකතුකළ ආර්ථික වටිනාකම්** | **12,008.94** | **4,796.23** |

*2025 සාමාන්‍ය බරතබන ලද - 7.80% මාස 12 භාණ්ඩාගාර බිල්පත් මත පදනම් වී ගණනය කරන ලදී (2024 - 9.30%)

# ආයතනික භාරකාරීත්වය



www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම

016 ආයතනික භාරකාරීත්වය

071 මූල්‍ය තොරතුරු

120 අතිරේක තොරතුරු



# සභාපතිවරයාගේ සමාලෝචනය

2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළ 2024 වර්ෂයට සාපේක්ෂව වඩාත් ස්ථාවර හා ආයෝජක විශ්වාසය යළි ගොඩනැගුණු අවධියක් ලෙස සැලකිය හැකිය. විශේෂයෙන් කොළඹ කොටස් වෙළඳපොළ (CSE) සහ භාණ්ඩාගාර සුරැකුම්පත් වෙළඳපොළ යන දෙකම 2022-2023 අර්බුදකාරී කාලයෙන් පසු ප්‍රතිසාධන ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. එම ධනාත්මක තත්ත්වයන් තුළ වන වෙළඳපොළ වාසිය අත්පත් කර ගැනීමට මණ්ඩලය සමත්වීම විශේෂයෙන්ම අවධානයට ලක්කළ යුතු කරුණකි.

**හිතවත් පාර්ශවකරුවනි,**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2025 වර්ෂයේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව බෙහෙවින් සතුටට පත් වෙමි. රටෙහි සමාජ දේශපාලනික හා ආර්ථික තත්ත්වයන් කෙරෙහි සංවේදී වෙමින් හා එම අවකාශයන් වඩාත් පුළුල්ව හඳුනාගනිමින් සමාජ සංරක්ෂණ අරමුදලක් ලෙස එහි කාර්යභාරය ඉටු කිරීම හා සාමාජිකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම කෙරෙහි විශේෂ අවධානයක් අප විසින් යොමු කර ඇත.

2025 වර්ෂයේදී ශ්‍රී ලංකා ආර්ථිකය, 2022 ආර්ථික අර්බුදයෙන් පසු ආරම්භ වූ ස්ථායීකරණ හා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යාමට සමත් වී ඇත. 2024 වර්ෂයේදී ආර්ථිකය නැවත වර්ධන මාවතකට පිවිසීමෙන් පසු, 2025 දී ද එම ප්‍රවණතාවය පවත්වා ගනිමින් දළ දේශීය නිෂ්පාදිතය (GDP) 5% ක පමණ වර්ධනයක් වාර්තා කළේය. 2024 වර්ෂය තුළ පැවති අවපාතමය උද්ධමන (deflationary) තත්ත්වය 2025 මැද

භාගය වන විට ක්‍රමයෙන් අවසන් වීම ආරම්භ වූ අතර, ආහාර මිල ඉහළ යාම හා දේශීය ඉල්ලුම වැඩිවීම හේතුවෙන් උද්ධමනය නැවත ධනාත්මක මට්ටමකට පැමිණියේය. මහ බැංකුව 2025 වර්ෂය පුරාම සාපේක්ෂව ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර, ප්‍රතිපත්ති පොලී අනුපාත 7.75% මට්ටමේ පවත්වා ගැනීමෙන් පෞද්ගලික අංශ ණය ප්‍රවාහය වැඩි කිරීමට අවකාශ සැලසීය. එමගින් ව්‍යාපාරික ක්‍රියාකාරකම් වර්ධනය විය.

2025 වර්ෂයේ ලෝක ආර්ථික තත්ත්වය තුළ භූ දේශපාලනික අර්බුද, ජාත්‍යන්තර වෙළඳ අස්ථාවරතා සහ ඇමෙරිකානු ආනයන බදු ප්‍රතිපත්ති වැනි කරුණු ශ්‍රී ලංකාවට ද බලපෑම් ඇති කළේය. විශේෂයෙන් ඇගලුම් අපනයන ක්ෂේත්‍රයට බලපාන ජාත්‍යන්තර වෙළඳ බාධා පිළිබඳ අවදානම් මතු විය. එහෙත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන සහ රාජ්‍ය මූල්‍ය විනය තහවුරු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ආර්ථික ස්ථාවරතාවය පවත්වා ගැනීමට හැකි විය. රජය විසින් 2025 දී ක්‍රියාත්මක කළ ආදායම් මූලික රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ, බදු ආදායම් ඉහළ නැංවීම, රාජ්‍ය වියදම් පාලනය සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ආර්ථිකයේ විශ්වාසය යළි ගොඩනැගීමට උපකාරී විය. එමෙන්ම බැංකු හා මූල්‍ය ආයතනවල ස්ථාවරතාවය ද 2024 ට සාපේක්ෂව 2025 දී තවදුරටත් ශක්තිමත් විය. මෙම සමාජ ආර්ථික සංචලතාවයන් මෙන්ම විභවතාවයන් විසින් ඇති කරනු ලබන නව තත්ත්වයන් ලංකාවේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල වන අප මණ්ඩලයේ දෛනික ක්‍රියාකාරකම් කෙරෙහි මෙන්ම ඉදිරි සැලසුම් කෙරෙහිද ඉතා විශාල බලපෑමක් සිදු කරනු ලබයි.

## අරමුදලේ කාර්යසාධනය

2024 වර්ෂය අවසන් වන විට රුපියල් බිලියන 564.327 ක් පමණ වූ අරමුදල 2025 වර්ෂය අවසන් වන විට 13% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 637.443ක සීමාව ඉක්මවිය. පොලී හා ලාභාංශ ලැබීම්වල පෙන්වූ 7.8% ක වර්ධනය හා දායක මුදල් රැස්කිරීම්වල පෙන්වූ 14.5%.

වර්ධනය ද, ආයෝජන කළඹ (Investment Portfolio) 14.1% වර්ධනය වීම මෙන්ම ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ නිදහස් කිරීම 9.4% න් පහත වැටීමද අරමුදලෙහි සිදු වූ මෙම 13% වර්ධනය සඳහා සෘජුව බලපා ඇත. 2022 හා 2023 වැනි වර්ෂ වල දක්නට ලැබුණු ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ නිදහස් කර ගැනීමේ ප්‍රවණතාවය 2024 හා 2025 වැනි වර්ෂවල දී ක්‍රමානුකූලව අඩු වීමක් දක්නට ලැබුණු අතර එය ආර්ථික ස්ථායීකරණය පෙන්නුම්කරන ප්‍රබල දර්ශකයක් ලෙස ද හඳුනා ගත හැකි වන්නේ, සාමාජික ප්‍රතිලාභ හා අයිතීන් පිළිබඳව මණ්ඩලය විසින් විද්‍යුත් මාධ්‍ය මගින් සිදු කරන ලද පුළුල් ප්‍රචාරක ව්‍යාපාරයකින්ද අනතුරුව මෙම තත්ත්වය වාර්තා වීම හේතුවෙනි.

2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළ 2024 වර්ෂයට සාපේක්ෂව වඩාත් ස්ථාවර හා ආයෝජක විශ්වාසය යළි ගොඩනැගුණු අවධියක් ලෙස සැලකිය හැකිය. විශේෂයෙන් කොළඹ කොටස් වෙළඳපොළ (CSE) සහ භාණ්ඩාගාර සුරැකුම්පත් වෙළඳපොළ යන දෙකම 2022-2023 අර්බුදකාරී කාලයෙන් පසු ප්‍රතිසාධන ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. එම ධනාත්මක තත්ත්වයන් තුළ වන වෙළඳපොළ වාසිය අත්පත් කර ගැනීමට මණ්ඩලය සමත්වීම විශේෂයෙන්ම අවධානයට ලක්කළ යුතු කරුණකි.

2024 වර්ෂයේ දී රුපියල් බිලියන 581.1 ක් ව පැවති ආයෝජන කළඹ 2025 වර්ෂය අවසන් වන විට රුපියල් බිලියන 662.8 දක්වා වර්ධනය වූ අතර මණ්ඩලයේ ප්‍රධානතම සහ ආරක්ෂිතම ආයෝජන උපකරණය (Investment Instrument) වන භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්හි සිදු කර ඇති ආයෝජනය 14.5% කින් 2025 වර්ෂය අවසන් වන විට ඉහළ ගොස් ඇත. කොටස් වෙළඳපොළ ආයෝජනය 2.7% කින් ඉහළ යාම පෙන්නුම් කළ අතර ආයෝජන කළඹ හැසිරවීමේ දී ආයෝජන කමිටුව විසින් සිදු කරනු ලබන සක්‍රීය දායකත්වය විශේෂයෙන් සඳහන් කළ යුතුය. සාමාජිකයින්ගේ අරමුදලක් ලෙස වෙළඳපොළ වාසි අත්පත්කර ගැනීම මෙන්ම සාමාජික අයිතීන් තහවුරු කිරීම උදෙසා ආයෝජනයන්හි සුරක්ෂිතභාව පිළිබඳව වන වගවීම ද ඉතාමත්ම වැදගත් කරුණකි.

## සාමාජික අයිතීන් තහවුරු කිරීම

සාමාජිකයින්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම පිළිබඳව මණ්ඩලය විසින් 2025 වර්ෂය තුළ දී විශේෂ අවධානය යොමු කරන ලදී. සේවා යෝජකයින්ගේ වගකීම් හා නෛතික බැඳීම්, සාමාජිකයින්ගේ අයිතිවාසිකම්, මණ්ඩලය විසින් පිරිනමනු ලබන සුබසාධන ප්‍රතිලාභ, පිළිබඳව දීප ව්‍යාප්ත මට්ටමෙන් ප්‍රචාරණ වැඩසටහනක් විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය භාවිතයෙන් සිදු කරන ලද අතර අරමුදල හා එහි කාර්යය භාරයන් පිළිබඳව පුළුල් සංවාදයක් ඇති කිරීමට එය ඉවහල් විය.

2025 වර්ෂය සඳහා මණ්ඩලයේ සියලුම සාමාජික ගිණුම් සඳහා 9.5% පොලී හා ලාභාංශ පිරිනැමීමට මණ්ඩලය සමත් වූ අතර සාමාජික ගිණුම් සඳහා රුපියල් බිලියන 55.304ක අගයක් එකතු කරන ලදී. මෙම අගය 2024 වර්ෂයේ දී එකතු කරන



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

ලද රුපියල් බිලියන 51.302 ට සාපේක්ෂව බලන විට 7.8% ක වැඩිවීමකි. දායක මුදල් රැස් කිරීම්වල 2024 ට සාපේක්ෂව සිදු වූ 14.5% ක වර්ධනය සාමාජික අයිතීන් හා ප්‍රතිලාභ තහවුරු කිරීමේ දී කැපී පෙනෙන සාධකයකි.

2025 වර්ෂය තුළ දී සාමාජික අයදුම්පත් 166,444 වෙනුවෙන් රුපියල් බිලියන 30.7 ක මුදලක් ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ ලෙස සාමාජිකයින් වෙත නිදහස් කිරීමට මණ්ඩලය සමත් විය. එමෙන්ම විවිධ සුබසාධක යෝජනා ක්‍රම යටතේ (අධ්‍යාපන හා සෞඛ්‍ය) කිසිදු ආකාරයකින් සාමාජිකයාගේගිණුමේ ශේෂයට බලපෑමක් නොවන ආකාරයට සාමාජිකයින්ට හා ඔවුන්ගේ පවුල්වල දූ දරුවන්ගේ සමාජ සුබ සාධනය තහවුරු කිරීමට පියවර ගෙන ඇත.

## සේවාවන් ඩිජිටල්කරණය

නව රජයේ ඩිජිටල්කරණ ප්‍රතිපත්තිය මණ්ඩලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් විශ්ලේෂණය සම්පූර්ණ කිරීමට හැකි වූ අතර අතරමග සංවර්ධන කටයුතු නතර වී ඇති හරයාත්මක පද්ධති සංවර්ධන වැඩසටහන (core system) නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට හැකිවීම 2025 වර්ෂය තුළ ලබාගත් ජයග්‍රහණයකි. එම ව්‍යාපෘතියේ කටයුතු 2026 වර්ෂය අවසන් විමට පෙර අවසන් කර සියලු සාමාජික සේවාවන් සම්පාදනය එම පද්ධතිය තුළින් සිදු කිරීම සඳහා මණ්ඩලය විශේෂ අවධානය යොමු කර ඇත.

සාමාජික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා වඩාත් ශක්තිමත් සයිබර් ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර නව රජය විසින් හඳුන්වා දී ක්‍රියාත්මක කරමින් පවතින සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුගත වෙමින් අරමුදලේ ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය සියලු පියවරයන් ගැනීම සිදු කිරීමට සැලසුම් සකස් කර ඇත.

## මානව සම්පත් සංවර්ධනය

රාජ්‍ය සේවය සහ අර්ධ රාජ්‍ය සේවය තුළ සැලකිය යුතු කාලයක් ඇණහිට තිබූ නව බඳවා ගැනීම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවීමත් සමග 2025 වර්ෂය තුළ දී අලුතෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් 55 ක් විධිමත් ක්‍රමවේදයන් ඔස්සේ බඳවා ගැනීමට හැකි වූ අතර, එමගින් සේවා සම්පාදනය සඳහා පැවති බරපතල ඌනතාවයන් මග හරවා ගැනීමට හැකි විය. මෙම නව බඳවා ගැනීම් ප්‍රමාණය 2024 වර්ෂය තුළ සිදු වූ බඳවා ගැනීම් (14) සමඟ සාපේක්ෂව බලන විට 292.8% වර්ධනයකි. එමෙන්ම කාලාන්තරයක් තිස්සේ ආයතනය තුළ උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදයන් පිළිබඳව සේවක පාර්ශ්වයන් තුළ තිබූ අවිශ්වසනීය බව සම්පූර්ණයෙන්ම තුරන් කරමින් වඩාත් විනිවිද පෙනෙන සුලු සහ වගවීම් තහවුරු කරමින් නිලධාරීන් 52 සඳහා උසස්වීම් ලබා දීමට හැකි වූ අතර එය 2024 වර්ෂයට සාපේක්ෂව 147.6% ක වර්ධනයකි. එමෙන්ම වාර්ෂික පුහුණු සැලැස්ම සම්පූර්ණ කරමින් පුහුණු වැඩසටහන් 51 ක් පවත්වා ඇති අතර එය මානව සම්පත් සංවර්ධන විෂයෙහි සාධනීය තත්ත්වයකි.

## වැටුප් විෂමතා ඉවත් කිරීම

2006 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ජාතික වැටුප් ප්‍රතිපත්තිය අනුව රාජ්‍ය ව්‍යවසායන්ට අදාළ කරන ලද කළමනාකරණ 30 චක්‍රලේඛය මණ්ඩලය තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඌනතා රැසක් පැවතීම නිසා ආයතනයේ එකම ශ්‍රේණිය තුළ මෙන්ම විවිධ ශ්‍රේණි අතර ද වැටුප් විෂමතා පැවතුණි. නව රජය විසින් වැටුප් වැඩිකිරීම සඳහා හඳුන්වා දුන් 01/2025 චක්‍රලේඛය මණ්ඩලය තුළ ක්‍රියාත්මක කිරීමේ දී මෙම කරුණ පිළිබඳව දැඩි සැල්කිල්ලක් යොමු කර ආයතනය තුළ ආර්ථික යුක්තිය ඇති කිරීමටත්, කාර්මික සාමය තහවුරු කිරීමටත් පියවර ගන්නා ලදි. මෙය දිගුකාලීනව ආයතනයේ උන්නතිය උදෙසා ගනු ලැබූ අත්‍යාවශ්‍ය සහ වැදගත් පියවරක් බව විශ්වාස කරමි.

## සුවිශේෂී ජයග්‍රහණ

මානව සම්පත් ක්ෂේත්‍රය තුළ සිදු කරන ලද හඳුන්වාදීම්, නිවැරදි කිරීම් හා එම සමස්ථ ක්‍රියාවලියම ඇගයීමට ලක්කරමින් 2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CIPM) මගින් ක්‍රියාත්මක කරන ලද Great HR Awards - 2025 ඇගයීමේ දී මණ්ඩලය විශේෂ ඇගයීම් සම්මානය දිනා ගැනීම අප ලද විශේෂ ජයග්‍රහණයකි.

එමෙන්ම, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම, වාර්තාකරණය, හෙළිදරව් කිරීම්වල විනිවිදභාවය, වගවීම, සමාජ වගවීම හා ආයතනික පාලනය යනාදියෙහි ප්‍රමිතිය මැන බැලීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) වාර්ෂිකව පවත්වනු ලබන හොඳම වාර්ෂික වාර්තා ඇගයීම් සම්මාන උළෙලේ දී මධ්‍යම රාජ්‍ය අංශයේ රන් සම්මානයත්, ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා සහ අධිකාරී අංශයේ රන් සම්මානයත් යන සම්මාන ද්විත්වයම හිමිකර ගැනීමට හැකිවීම මණ්ඩලය ලද සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම මණ්ඩලය පිළිබඳව සමස්ථ සාමාජිකත්වය තුළ විශ්වාසය තවදුරටත් තහවුරු කිරීමට ඉවහල් විය.

## පරිපාලිත සමාගමෙහි කාර්යය සාධනය

අප මණ්ඩලයේ පරිපාලිත සමාගම වන ලංකා ලුණු සමාගම වෙතින් වාර්ෂිකව ලැබෙන ලාභාංශ අරමුදල ශක්තිමත් කිරීමට දායකත්වය සපයයි. 2025 වර්ෂයේ දී ලුණු නිෂ්පාදනයට බලපෑ අහිතකර කාලගුණික තත්ත්වය යටතේ වුවද රුපියල් මිලියන 315.7 ක ලාභාංශ ලැබී ඇත.
පරිපාලිතයෙහි කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීම් පටිපාටි මෙතෙක් විධිමත්ව අනුමත කර නොමැතිවීම විශාල ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇති අතර මේ

වනවිට පිරිස්බල සමූහය නිශ්චිතව හඳුනා ගැනීම, වැටුප් ව්‍යුහ සමාලෝචනය කර බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීම ආරම්භ කර ඇති අතර 2026 වර්ෂය අවසානයට පෙර එම කාර්යයන් අවසන් කර රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව විධිමත් අනුමැතින් ලබා ගැනිමට අපේක්ෂිතය. එමෙන්ම පරිපාලිතය සඳහා අනුබද්ධිත පාලන ප්‍රතිපත්තියක් (subsidiary policy) සකස් කිරීමේ කටයුතු ද ආරම්භ කර ඇත.

## ආයතනයේ ඉදිරි දැක්ම

ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රධානතම සාධකයක් වන අභ්‍යන්තර විගණන අංශය තුළ පවතින පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කරමින් සියලුම අංශ හා ප්‍රාදේශීය කාර්යාලවල අභ්‍යන්තර පාලනය සඳහා වඩාත් ප්‍රශස්ත ක්‍රමවේදයක් සකස් කිරීම ඉදිරි වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂා කරන ප්‍රධානතම කාර්යයකි.

දායක මුදල් අරමුදල වෙත බැර කිරීම සඳහා මේ වන විට විද්‍යුත් බැංකුකරණය හඳුන්වා දී ඇති අතර විශාල කාණ්ඩයේ සේවා යෝජකයින් මෙම ක්‍රමවේදයට අනුගතවීම සඳහා වන නීතිය 2022 වර්ෂයේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇති බැවින්, එම නීතිය අදාළ වන සියලුම සේවා යෝජකයින් විද්‍යුත් බැංකු කරණ ක්‍රමවේදය වෙත අනිවාර්යයෙන්ම අනුගත කරවීමට සැලසුම් කර ඇත.

හරයාත්මක පද්ධතියේ සංවර්ධන කටයුතු අවසන් කර මණ්ඩලයේ සියලු සේවා සම්පාදනයන් සහ දායක මුදල් රැස්කිරීම් කටයුතු මෙන්ම ආයතනික ගිණුම් පවත්වාගෙන යාම වැනි කාර්යයන් එම පද්ධතිය මගින් ඉටු කිරීමට අවකාශ සැලසීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු වී ඇත.

ප්‍රධානතම මූල්‍ය ආයතනයක් ලෙස සයිබර් ආරක්ෂණ ක්‍රමවේද තහවුරු කිරීම සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2026 වර්ෂයේ දී රුපියල් මිලියන 100 ක පමණ ආයෝජනයක් කිරීමට සැලසුම් කර ඇත. එයට සමගාමීව සියලු පහසුකම්වලින් සම්පූර්ණ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති 2026 වර්ෂය තුළ එහි වැඩ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

මණ්ඩලයේ සිදු කෙරෙන සියලුම දෛනික ක්‍රියාකාරකම්, සහ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්ය සාධනය විධිමත්ව හා තාර්කිකව ඇගයීමට ලක්කිරීම සඳහා කාර්ය සාධන දර්ශක පද්ධතියක් වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර 2026 වර්ෂය තුළ එම පද්ධතිය නිසි අනුමැතීන් ලබාගැනීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර එමගින් සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා දැනට ගෙවනු ලබන මාසික දිරි දීමනා නිසි ඇගයීම් ක්‍රමවේදයකට යටත්ව ගෙවීමට කටයුතු කෙරේ.

ආර්ථිකයේ ඇතිවන උච්චාවචනයන් විසින් ආයෝජන පරිසරය තීරණය කරනු ලබන බැවින් නව ආයෝජන අවස්ථා කෙරෙහි යොමුවීම පිළිබඳව අවධානය යොමු කර ඇත. ඒ අනුව නවම් මාවතේ පිහිටි මණ්ඩලය සතු අක්කර දෙකක පමණ ඉඩම සඳහා උපායමාර්ගික දේපල සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇත.

## සිහිපත් කිරීම

මණ්ඩලයේ සක්‍රිය සාමාජිකත්වය මේ වන විට මිලියන 2.6 ක් පමණ වන අතර ඔවුන් වෙනුවෙන් මාසික දායක මුදල් අරමුදලට බැර කිරීම සිය පළමු වගකීමක් ලෙස සලකමින් සහ සාමාජික තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන යාම උදෙසා විශාල කර්තව්‍යයක් සිදු කරනු ලබන සේවා යෝජක ප්‍රජාව විසින් අප වෙත ලබා දෙනු ලබන සහයෝගය සාමාජික අයිතිවාසිකම් තහවුරු කිරීමේ දී මහගු පිටුවහලක් සපයයි. එය මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් ද දිරි ගන්වන සුළුය.

වගකිව යුතු ආයතනයක් ලෙස, පවත්නා ව්‍යවස්ථාපිත නිති රීතිවලට අනුකූල වෙමින් සමාජික ප්‍රජාව වෙත සේවා සම්පාදනය සඳහා සිය දෛනික රාජකාරි කටයුතු ඉටු කරමින් දායකත්වය සපයන මණ්ඩලයේ සමස්ථ කාර්ය මණ්ඩලය ඉටු කරනු ලබන කාර්යය භාරය විශේෂයෙන්ම සිහිපත් කළ යුතුය.

ආයතනයේ විෂය අයත් වන මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම් ඇතුළු සියලුම නිලධාරීන්ගේ මාර්ගෝපදේශ, උපදෙස් හා නියාමනයන් මණ්ඩලයේ කටයුතු නිවැරදිව හා විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම සඳහා මහඟු පිටුවහලකි.

එමෙන්ම සියලු කාර්යයන් පූර්ණ විනිවිදබාවයකින් යුතුව, නිශ්චිත ප්‍රතිපත්තිමය රාමුවක ක්‍රියාත්මක කිරීම උදෙසා කටයුතු කරන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් විසින් රජයේ සහ මහජන අභිලාෂයන් කෙරෙහි අවබෝධයෙන් යුතුව කටයුතු කිරීමද අගය කරන අතර ඉහත කී සියලු පාර්ශ්වයන් වෙනුවෙන් මාගේ ගෞරවය සහ හෘදයාංගම භාවය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



**සෝමසිරි ඒකනායක**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

# අධ්‍යක්ෂක මණ්ඩලයේ පණිවිඩය




“

2024 වර්ෂය අවසන් වන විට රුපියල් බිලියන 564.327 ක් පමණ වූ අරමුදල 2025 වර්ෂය අවසන් වන විට 13% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 637.443ක සීමාව ඉක්මවිය. ඒ අනුව 2025 වර්ෂයේ දී ද අපේක්ෂා කළ පරිදිම 9.5%ක පොලී හා ලාභාංශ අනුපාතයක් සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කිරීමට මණ්ඩලය සමත් විය.

සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන 2025 වාර්ෂික වාර්තාව වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස බෙහෙවින් සතුටට පත් වෙමු. සමාජාරක්ෂණ අරමුදලක් ලෙස අපගේ කාර්යයන්හි දිශානතිය කුමක් විය යුතු ද යන්න පිළිබඳව හා සමස්ථයක් ලෙස රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුගතව ආයතනික ක්‍රියාවලිය පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කිරීම අපගේ ප්‍රධාන කාර්යයක් ලෙස අප විසින් හඳුනාගෙන ඇත.

යම් නිශ්චිත කාල සීමාවක් තුළ මණ්ඩලය විසින් අත්පත් කර ගනු ලබන කාර්යය සාධනය ස්වායත්ත කරුණක් ලෙස නොව සමස්ථ ආර්ථිකයෙහි නියෝජනයක් ලෙස ද සැලකිය හැකිය. 2024 වර්ෂය අවසන් වන විට රුපියල් බිලියන 564.327 ක් පමණ වූ අරමුදල 2025 වර්ෂය අවසන් වන විට 13% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 637.443ක සීමාව ඉක්මවිය. දායක මුදල් රැස්කිරීම් සහ මණ්ඩලයේ ආයෝජන කළඹ පිළිවෙලින් 14.5% හා 14.1%කින් 2024 ට සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කළ අතර, එය මණ්ඩලය කෙරෙහි සේවායෝජකයින්ගේ සහ සාමාජිකයින්ගේ විශ්වාසය තවදුරටත් තහවුරු කිරීමටත්, සමාජාරක්ෂණ අරමුදලකින් රජය අපේක්ෂා කරන අරමුදල් ස්ථාවරත්වය හා සාමාජික ප්‍රතිලාභ බාධාවකින් තොරව ගෙවීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමටත් ඉවහල් වී ඇත. ඒ අනුව 2025 වර්ෂයේ දී ද අපේක්ෂා කළ පරිදිම 9.5%ක පොලී හා ලාභාංශ අනුපාතයක් සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කිරීමට මණ්ඩලය සමත් විය. සමස්ථ පොලී අනුපාතයන් 7% - 8% වැනි අගයක පැවති තත්ත්වයක් තුළ සාමාජික ගිණුම්වලට එවැනි සැලකිය යුතු අගයක පොලි හා ලාභාංශ එක් කිරීමට හැකිවීම අරමුදලේ ස්ථාවරත්වය පිළිබඳ අදහසක් ගෙන දෙයි.

අරමුදලේ ස්ථාවරත්වය තහවුරු කිරීමට හා එය දිගුකාලීනව පවත්වාගෙන යාම සඳහා ඉවහල් වන ආකාරයේ උපාය මාර්ගික සැලස්මක් ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර එහිදී දෛනික මෙහෙයුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, ආයෝජනයන්හි සුරක්ෂිත බව තහවුරු කිරීම, සේවා සම්පාදනය ඩිජිටල්කරණය කිරීම සහ රජයේ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුගතව මණ්ඩලය තුළ ද ශක්තිමත් සයිබර් ආරක්ෂිණ ප්‍රතිපත්තියක් හා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම යන කරුණු පිළිබඳව මූලික හා ප්‍රමුඛ අවධානය යොමු කර ඇත. එහිදී සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලය හුදෙකලා ආයතනයක් ලෙස නොව සමගාමී හවුල්කාර හා පාර්ශ්වකාර ආයතන සමග මනා අවබෝධයකින් හා විශ්වාසයකින් යුතුව කටයුතු කිරීම කැපී පෙනෙන කරුණකි.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩලවල කාර්යයන් පොදු ප්‍රතිපත්තියක් යටතේ ප්‍රමිතිගතව ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් වරින්වර හඳුන්වා දී ඇති මාර්ගෝපදේශ, හා නීති රීති හා උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී පැන නැගී ඇති ඌනතා හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ආයතනය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්වලදී සියලු දෙනාට සමාන අවස්ථා තහවුරු කිරීමටත්, විනිවිද පෙනෙන සුළු ප්‍රතිපත්තියක් අනුව කටයුතු කිරීමත් අවධාරණය කර ඇත.

අවධානම් කළමනාකරණය හා අවධානම් අවම පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි මණ්ඩලයේ දැඩි අවධානය යොමු වී ඇති අතර එය ඉදිරි වර්ෂය තුළ ප්‍රධාන ඉලක්කයක් සේ සලකමු. පාරිභෝගික සේවාවන් කාර්යක්ෂම කිරීම හා පහසු කිරීම මෙන්ම ආයතනය තුළ විධිමත් හා තාර්කික කාර්ය සාධන දර්ශක පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රතිපල පාදක ඇගයීමක් සිදු කිරීමටත් ඒ මත පදනම්ව දිරිදීමනා ක්‍රමයක් හඳුන්වා දීමටත් අවශ්‍ය සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කර ඇත.

ඒ අනුව, උපායමාර්ගික සැලැස්ම තුළින් යෝජනා කර ඇති ප්‍රතිපල ළඟා කර ගැනීම සඳහාත්, සාමාජිකයින් සහ සේවායෝජකයින් තුළ විශ්වාසය තහවුරු කර ගනිමින් රාජ්‍ය ප්‍රතිපත්තිය මඟින් අපේක්ෂිත අරමුණු ළඟා සහ සාමාජික අරමුදල් සුරක්ෂිත කිරීම සඳහා මණ්ඩයක් ලෙස කටයුතු කිරීම වෙනුවෙන් වන දායකත්වය නොඅඩුව ලබා දීම අපගේ අපේක්ෂාව වන බව ද සටහන් කරනු කැමැත්තෙමු.

**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්**



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු



# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

### 2025 සමාලෝචනයට හසුවන වර්ෂය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය, 2024 වසර හා සංසන්දනාත්මකව 2025 වසර තුළ දී ස්ථායීකරණය වීමේ ලකුණු පහළ කළේ ය. 2024 සැප්තැම්බර් මාසයේ සිට අවධමනකාරී පරිසරයක පැවති ශීර්ෂ උද්ධමනය වසර අවසානය වන විට 5% ට වඩා අඩු මට්ටමක් දක්වා වූ මැදිහත් තත්ත්වයකට පැමිණි අතර, එය, වසර අවසානය වන විට, 1.2% ක් වූ වාර්ෂික ලක්ෂයමය වැඩිවීමක් විද්‍යාමාන කළේ ය. ඊට හේතුකාරක වූයේ ප්‍රකෘතිමත් වන ඉල්ලුමත්, කෘෂිකාර්මික හිඟයත්, ඉන්ධන හා විදුලි ගාස්තු ඉහළ දැමුනු සංශෝධනත් යන කරුණු ය. මූලික උද්ධමනය වසර මුළුල්ලේ ධනාත්මකව පැවති අතර ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) 2025 මැයි මස මුල් භාගයේ දී ධනාත්මක තත්ත්වයට පත් වූයේ ය.

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් වූ (වාර්ෂික ලක්ෂ්‍යමය) ශීර්ෂ උද්ධමනය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

උද්ධමනය ඉලක්කගත ප්‍රමාණයට වඩා බෙහෙවින් පහළ මට්ටමක් සහිතව තිබිය දී, මහ බැංකුව 2025 වසර තුළ වෙළෙඳපොළ ණය අනුපාතිකය 12% සිට 14% දක්වා ලිහිල්ව පවතින්නට හැර ප්‍රතිපත්ති පොලී අනුපාත 8.00% සිට 7.75% දක්වා පවත්වා ගනිමින් යම් අනුග්‍රහාත්මක ස්ථාවරයක් අනුගමනය කළේ ය. බැංකු අංශයේ වත්කම්හි ගුණාත්මකතාවයේ තෙරපුම් නොකඩවා එලෙසම පැවතියේ වුව ද, වෙළෙඳපොළ පොලී අනුපාත පහළ දිසාවට නැඹුරු වීමත්, භාණ්ඩාගාර බිල්පත්හි ඵලදාව පහත වැටීමත්, ද්‍රවශීලතා තත්ත්වයන් අතිරික්තව පැවතීමත් සිදු විය.

**ප්‍රතිපත්ති පොලී අනුපාත**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

2025 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, 4.5% සිට 5% දක්වා වූ පරාසයක ස්ථාවර වූ අතර එය අඛණ්ඩව කාර්තු අටක් පුරා වර්ධනීය තත්ත්වයක් සනිටුහන් කළේ ය. එක්සත් ජනපද තීරුබදු පැනවීමේ අවසන් කාල නියමයන්ට පෙර පැවති රෙදිපිළි සහ ඇඟලුම් ආශ්‍රිත ශක්තිමත් කාර්ය සාධනය, කුඩා පරිමාණ ව්‍යාපෘති හරහා ඉදිකිරීම් අංශය තුළ ඇති වූ නව්‍ය ක්‍රියාකාරකම් සහ සංචාරක ව්‍යාපාරය හා ඉහළ යන පරිභෝජනය තුළින් අනුගෘහිත ආහාර හා පාන වර්ග නිෂ්පාදනයේ වර්ධනය යන පසුබිම කරණකොට ගෙන 7.9% ක් වූ ප්‍රමාණයකින් වර්ධනය වූ කර්මාන්ත අංශය, මෙම නැවත පිබිදීම කෙරෙහි හේතු කාරක විය. මූල්‍ය සේවා සහ නවාතැන් පහසුකම් සැපයීම හා ප්‍රවාහනය වැනි සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්‍රියාකාරකම් මඟින් මෙහෙයවනු ලැබීම හරහා සේවා අංශය ද 3.3% ක් වූ ස්ථාවර වර්ධනයක් වාර්තා කළේ ය. මේ අතර, අයහපත් කාලගුණික තත්ත්වයන් ප්‍රධාන භෝග වර්ග කීපයක නිෂ්පාදනය කෙරෙහි පීඩාකාරී තත්ත්වයක් ඇති කිරීම හේතුවෙන් කෘෂිකාර්මික අංශය වර්ධනය වූයේ, 0.6% ක් වූ මධ්‍යස්ථ මට්ටමකිනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ප්‍රතිසංස්කරණාත්මක අනුබලය සහිත රාමුව තුළ පවත්වා ගැණුනු රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය, ප්‍රාථමික මූල්‍ය අතිරික්තයක් වාර්තා කර පවත්වා ගෙන යාමට රජයට සහය විය.

2025 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවට කඩා වැදුනු දිත්වා සුළි කුණාටුව, මෑත වසරවල එහි දේශගුණය කෙරෙහි බලපෑම් ඇති කළ වඩාත් විනාශකාරී ව්‍යසනයන්ගෙන් එකකි. ධාරානිපාත වර්ෂාව, ගංවතුර ගැලීම් සහ නාය යෑම් හේතුවෙන් මිලියන 2 කට ආසන්න ජනතාවක් පීඩාවට පත් වූ අතර, ඉන් මරණ 600 කට වඩා වැඩි ප්‍රමාණයක් ද වාර්තා විය. දළ දේශීය නිෂ්පාදිතයෙන් 4% කට සමාන ආසන්න වශයෙන් ඇ.ඩො. බිලියන 4.1 ක් වූ ප්‍රමාණයක ඇස්තමේන්තුගත ආර්ථික අලාභය ප්‍රවාහන ජාල සේවා, නිවාස හා කෘෂිකර්මාන්තය ඇතුළු තීරණාත්මක යටිතල පහසුකම්වලට දැඩි අලාභ හානි සිදු කළේ ය. ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය අභියෝග වඩාත් තීව්‍ර බවට පත් කරමින් මෙම ව්‍යසනය සැපයුම් දාම කෙරෙහි බාධා පැමිණවීමටත්, කෘෂිකාර්මික නිෂ්පාදනයේ ඵලදාව අඩු කිරීමටත්, කුටුම්භ අවතැන් තත්ත්වයට පත් කිරීමටත් හේතු සාධක විය.

රාජ්‍ය වියදම්හි වැඩි ඉහළ යාමක් හා අයවැය නැවත වෙන්කිරීම් අත්‍යාවශ්‍ය බවට පත් කරමින් නැවත ඉදිකිරීම් හා සහන අවශ්‍යතා කටයුතු රාජ්‍ය මූල්‍ය කෙරෙහි සැලකිය යුතු පීඩනයක් එල්ල කර ඇත. දේශගුණික කම්පන විෂයයෙහි ශ්‍රී ලංකාව දැඩි අවදානමකින් පසුවන බව මෙම ව්‍යසනකාරී සිදුවීම අවධාරණය කර ඇති අතර දේශගුණයට ඔරොත්තු දෙන යටිතල පහසුකම්, ආපදාවලට පෙර පූර්ව සූදානම සහ ශක්තිමත් අවදානම් මූල්‍යකරණ යාන්ත්‍රණයන්හි හදිසි අවශ්‍යතාවය ඉන් ඉස්මතු කර දැක්වී ය. මෙහිලා මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ගත් කළ, ඒවායේ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවල ඇති වැදගත්කම සහ අත්‍යන්ත කාලගුණික සිදුවීම් හමුවේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා වන ශක්තිමත් අතිරේක සුරක්ෂිතතා ප්‍රාග්ධනයක් ඔවුන් සතුව පවත්වාගෙන යාමේ ඇති වැදගත්කම යන කරුණු එමඟින් නැවත දැඩිව අවධාරණය කර සිටියේ ය.

# ආයෝජනය

## 2025 වර්ෂය තුළ ආයෝජන කටයුතු පිළිබඳ දළ විශ්ලේෂණය

2025 වසරේ දී ආයෝජන කටයුතු සිදු කරන ලද්දේ පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගත අවිනිශ්චිතතාවයන්, විශේෂයෙන් ණය හිමියන් සමඟ පවත්නා ද්විපාර්ශ්වික ගිවිසුම් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) විස්තීරණ අරමුදල් පහසුකම යන සන්දර්භය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ගනු ලැබූ ප්‍රතිපත්ති තීරණ සහ නව පරිපාලනය යටතේ දේශපාලනමය



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

වෙනස්වීම් යනාදිය මගින් හැඩගැසුනු අභියෝගාත්මක වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ ය. ආයෝජන ප්‍රතිපත්තිය හරහා මගපෙන්වනු ලැබීම ඔස්සේ, වත්කම්වල ආරක්ෂාව අතිශය ප්‍රමුඛව පැවතිය යුතු බවට වග බලා ගැනෙමින්, අති ඉස්තරම් සුරැකුම්පත් වෙන්කරවා ගැනීම් සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ප්‍රමුඛත්වය දී කටයුතු කර ඇත. කෙසේ වෙතත්, දැනට ක්‍රියාත්මක ආර්ථික ප්‍රතිසංස්කරණ යටතේ මහ බැංකුවේ ප්‍රතිපත්ති ලිහිල් කිරීම් හරහා සිදු වූ මෙහෙයවනු ලැබීම හේතුවෙන් 2024 වසරට සාපේක්ෂව වෙළඳපළ පොලී අනුපාතවල පැවති අඛණ්ඩ පහත වැටීම, ස්ථාවර ආදායම් කළඹ මගින් ලැබෙන ප්‍රතිලාභ දෙසට ඍණාත්මක ලෙස නැඹුරු විය. ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීම සඳහා එක් රැයකින් ප්‍රතිපත්ති පොලී අනුපාත විෂයයෙහි කළ පුළුල් අඩු කිරීම්, රාජ්‍ය හා ආයතනික යන දෙඅංශයෙහිම ණය මෙවලම් හරහා ජනනය වන අදායමෙහි අස්වැන්න අඩු කිරීමට තවදුරටත් හේතු කාරක විය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කොටස් වෙළෙඳපොළ ආයෝජන සම්බන්ධයෙන් අති සුපරීක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කළ අතර, වසරේ අවසාන කාර්තුව පුරා කොටස් වෙළෙඳපොළ තුළ පැවති ශක්තිමත් කාර්ය සාධනය හරහා උද්ගත වූ අවස්ථා වාසි සහගත ලෙස ප්‍රාග්ධනීකරණය කර ගැනීමට ද සමත් විය. මෙම උපාය මාර්ගය තුළින්, 8% ක් වූ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් පිළිබිඹු කර දක්වන රු. බිලියන 71.3 ක් වූ ප්‍රමාණයේ මුළු ආදායමක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට උත්පාදනය කර දීමට දායක විය. තවද, එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු අනුපාතවලට වඩා ඉහළ ආකර්ශනීය අනුපාතයක් වන 9.50% ක් වූ ප්‍රමාණයේ සම්පූර්ණ ප්‍රතිලාභයක් අරමුදලේ සාමාජිකයින් වෙත මේ හරහා ප්‍රකාශයට පත් කළ හැකි විය. මුළු ආයෝජන කළඹ වටිනාකම 2025 වසර අවසානය වන විට රු. බිලියන 663 ක් ලෙස වැඩි වර්ධනය වූ අතර එය පෙර වසර හා සංසන්දනාත්මකව 14% ක වර්ධනයක් විද්‍යාමාන කරයි. කොටස් ආදායම තුළ ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා වූ අතර, එය 2024 දී රු. බිලියන 2.42 ක් වූ ප්‍රමාණයේ සිට රුපියල් බිලියන 3.98 ක් වූ ප්‍රමාණයක් දක්වා 2025 දී ඉහළ යමින් 64% ක වර්ධනයක් නියෝජනය කර සිටියේ ය. ඊට හේතු කාරක වූයේ, මණ්ඩලය සතු විවිධාංගීකරණය වූ කොටස් කළඹේ ශක්තිමත් කාර්ය සාධනය හේතුවෙන් පැන නැගි ඉහළ ලාභාංශ ආදායම සහ ප්‍රාග්ධන ලාභ මගින් එම තත්ත්වය මෙහෙයවනු ලැබීම ය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්වකීය සමස්ත කාර්ය සාධනය හරහා, 2025 වසර තුළ 11.36% ක් වූ ආයෝජන ඵලදාවක් (ROI) අත්කර ගත්තේ ය.

**2025.12.31 වන දිනට ආයෝජන කළඹ සංයුතිය**




## ස්ථාවර ආදායම් සහිත සුරැකුම්පත්හි ආයෝජනය

රුපියල් බිලියන 643 ක් වශයෙන් ගණනය වන ස්ථාවර ආදායම් සහිත සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති අරමුදල් ප්‍රමාණය, 2025 වසරේ දී කළ මුළු ආයෝජන කළඹෙන් 97% ක් වූ ප්‍රමාණයකින් සමන්විත වන්නේ ය. එයින්, 95% ක් වූ ප්‍රමාණය, භාණ්ඩාගාර බැඳුම්කරවලට සහ භාණ්ඩාගාර බිල්පත්වලට අදාළ රජයේ සුරැකුම්පත්වල ආයෝජන නියෝජනය කරයි. රැය පහන් ප්‍රතිපත්ති අනුපාතිකය 8.00% සිට 7.75% දක්වා සංකෝචනය වීම සහ පසුව රජයේ සුරැකුම්පත්වල අස්වනු අනුපාතිකවල අඩුවීමක් තිබීම මධ්‍යයේ වුව ද, භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් මත පදනම්ව විවිධ කාල සීමාවන් මෙන්ම අනෙකුත් ස්ථාවර ආදායම් උපදවන වත්කම් වර්ග ද හරහා විවිධාංගීකරණය කරමින් පොලී අනුපාත පහත වැටීමේ අහිතකර බලපෑම සාර්ථකව තරණය කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකි විය. 2025 වසර තුළ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්ථාවර ආදායම් සුරැකුම්පත් මත රුපියල් බිලියන 69 ක සම්පූර්ණ ආදායමක් අත්කර ගැනීමට සමත් වී ඇති අතර එම ප්‍රමාණය, 2024 වසරට සාපේක්ෂව 12% ක වැඩිවීමකි.







## කොටස් හිමිකම්හි ආයෝජනය

ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ 2025 වසරේ දී ආසියාවේ ඉහළම කාර්ය සාධනයන් අතර ශ්‍රේණිගත වෙමින් ප්‍රබල ප්‍රකෘතිමත් භාවයක් වාර්තා කළේ ය. සියලු කොටස් මිල දර්ශකය (ASPI) 2025 වසරේ දී 41.9% කින් ඉහළ ගොස් 2024 වර්ෂය අවසානයේ දී පැවති ඒකක 15,944 ක් වූ ප්‍රමාණයට සාපේක්ෂව 2025 දෙසැම්බර් මස වන විට ඒකක 22,624 ක් වූ ප්‍රමාණයක් දක්වා ළඟා වූ අතර එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය (S&P SL20), 26.6% ක් වූ

ප්‍රමාණයකින් ඉහළ ගියේ ය. වෙළඳපළ පිරිවැටුම, ඉහළ ආයෝජක සහභාගිත්වය පිළිබිඹු කරමින් රු. බිලියන 1,233 ක් වූ ප්‍රමාණයක් දක්වා ගණනය වෙමින් දෙගුණයකට වඩා වැඩි විය. සාර්ව ආර්ථික ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම්, අඩු පොලී අනුපාත, අඩු උද්ධමනය සහ ශක්තිමත් ආයතනික ඉපැයීම් හරහා, විශේෂයෙන් බැංකු සහ මූල්‍ය අංශවල කාර්ය සාධනය මෙහෙයවනු ලැබී ය. දැඩි දේශීය ශීඝ්‍රතාවක් තිබිය දී වුවද, ශුද්ධ විදේශ විගලනය රු. බිලියන 38.6 ක් වශයෙන් නිරීක්ෂණය කෙරිණි. ඊට බොහෝ දුරට හේතු වූයේ, ඉහළ ශ්‍රේණිගත සමාගම් (blue-chip companies) තුළ කොටස් විකිණීමයි. දළ දේශීය නිෂ්පාදිතයේ 4.5% සිට 5.0% ක් දක්වා වූ වර්ධනයත්, සංචාරක ව්‍යාපාරයේ සහ ප්‍රේෂණවල නව්‍ය ප්‍රබෝධයත්, ස්ථාවර ආදායම්වල සිට කොටස් හිමිකම් වෙත මාරුවී යාම් දිරිමත් කරමින් භාණ්ඩාගාර බිල්පත්හි ඵලදාව පහත වැටීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම්වලින් පසුව ෆිච් සහ මූඩි (Fitch and Moody) ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමත් වර්ධනයේ ප්‍රමුඛ ධාවකයන් වූයේ ය. සමස්තයක් වශයෙන්, කොටස් වෙළඳපොළේ ඔරොත්තු දීමේ හැකියාව, පිබිදුමක් සහිත ආයෝජක විශ්වාසය දැඩිව අවධාරණය කර ඇති අතර, 2025 දී ශ්‍රී ලංකාව කලාපයේ විශිෂ්ටතම ක්‍රියාකාරී වෙළඳපොළක් ලෙස ස්ථානගතව ඇත.

2025 වසර අවසානයේ දී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සිය කොටස් හිමිකම් ආයෝජන එහි මුළු ආයෝජන කළඹෙන් 2.39% ක් ලෙස පවත්වා ගෙන ගියේ ය. බොහෝ ලැයිස්තුගත සමාගම් ලාභාංශ ප්‍රකාශ කිරීමත් සමඟ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ප්‍රතිෂ්ඨාපනයවී ව්‍යාපාරික ක්‍රියාකාරකම් වැඩි දියුණු වීම කෙරෙහි වූ සානුබලයක් වීම මගින් කොළඹ කොටස් වෙළෙඳපොළ වසර තුළ ශක්තිමත් කාර්ය සාධනයක් වාර්තා කළේ ය. මණ්ඩලයේ කොටස් කළඹ, 2024 වසර මුළුල්ලේ සියලු කොටස් මිල දර්ශකයේ (ASPI) 41.9% ක් වූ එහි වර්ධනය හා සසඳන විට සැලකිය යුතු 63.9% ක් වූ වර්ධනයක් වසර තුළ පිළිබිඹු කර ඇති අතර, එහි ලාභාංශවලින් සහ ප්‍රාග්ධන ලාභවලින් රු. මිලියන 3,978 ක ආදායමක් උත්පාදනය කළේ ය. මීට අමතරව, වසර අවසානයේ සියලු කොටස් මිල දර්ශකයෙහි (ASPI) පැවති හිතකර කාර්ය සාධනය හේතුවෙන් ආයෝජන කළඹ අගය රුපියල් බිලියන 3.08 කින් ඉහළ ගොස් ඇත. විවිධාංගීකරණය වූ කොටස් කළඹ කළමනාකරණය කිරීමෙහිලා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය දැක්වූ විචක්ෂණශීලී ආයෝජන ප්‍රවේශය සහ වසර තුළ කොටස් වෙළෙඳපොළෙහි පැවති ප්‍රකෘතිමත් භාවයේ ධනාත්මක බලපෑම මෙම ප්‍රතිඵල මගින් ඉස්මතු කර දක්වයි.

**ආයෝජනය කළඹ මත මුළු ආදායම**




## ඉදිරි ගමන් මග

ඉදිරි අනාගතය දෙස බලන විට, 2025 වසර තුළ දී ශ්‍රී ලංකාවේ ආර්ථික ගමන් පථය ක්ෂුද්‍ර ආර්ථිකයට ඔරොත්තු දීමේ හැකියාව, සාර්ව ආර්ථික ස්ථායීකරණය සහ මූල්‍ය ප්‍රතිසංස්කරණ යන කරුණුවල සම්මිශ්‍රණයකින් හැඩ ගැසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආයෝජකයින්ගේ විශ්වාසය යථා තත්ත්වයට පත් කිරීම සහ විදේශ ශේෂයන් ශක්තිමත් කිරීම අරමුණු කරගත් අඛණ්ඩ ණය ප්‍රතිව්‍යුහගත කිරීම, මූල්‍ය ඒකාබද්ධතාව සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ යනාදියෙන් රටට ප්‍රතිලාභ සැලසෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත් කිරීම, පුනර්ජනනීය බලශක්තිය සහ යටිතල පහසුකම් පුළුල් කිරීම සහ අපනයන කාර්ය සාධනය ක්‍රමානුකූලව වැඩි දියුණු කිරීම මගින් වර්ධන අපේක්ෂාවන් තව දුරටත් සානුබල ගැන්වෙනු ඇත. ප්‍රධාන අංශ හරහා වැඩි වර්ධනය වන ආදායම් සහ ඉහළ නැංවෙන ඵලදායිතාව මගින් පාරිභෝගික ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආදායම් බලමුලු ගැන්වීමට, වියදම් දූරදර්ශීව කළමනාකරණය කිරීමට සහ රාජ්‍ය මූල්‍ය පාලනය ශක්තිමත් කිරීමට රජය විසින් ගනු ලබන ප්‍රයත්නයන්හි ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා කේන්ද්‍රියව කටයුතු කරනු ඇත. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මුලපිරීම් මූල්‍ය පීඩනය ලිහිල් කරනු ඇතැයි අපේක්ෂා කරන අතර යටිතල පහසුකම්, සමාජ සුබසාධනය සහ හරිත ව්‍යාපෘතිවල ඉලක්කගත ආයෝජනය ඇතුළාන්තීය වර්ධනය පිණිස සහාය වනු ඇත.

සමස්ත ඉදිරි දර්ශනය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, ශ්‍රී ලංකාව අවස්ථා සහ අභියෝග යන දෙයාකාරයටම මුහුණ දෙයි. ගෝලීය වෙළඳපොළ අස්ථාවරත්වය සහ මැද පෙරදිග කලාපයේ ආතතිය, භාණ්ඩ මිල උච්චාවචනය සහ දේශගුණය ආශ්‍රිත බාධා පැමිණවීම් වැනි තව දුරටත් පවත්නා බාහිර අවදානම් සඳහා අතිශය සුපරීක්ෂාකාරී ප්‍රතිපත්තිමය ප්‍රතිචාර අවශ්‍ය වනු ඇත. එසේ වුවද, විනය ගරුක පාලනය, තිරසාරභාවය කේන්ද්‍ර කරගත් ආයෝජන හා සමාජ සුබසාධනය සඳහා කැපවීම සහිතව, 2025 වසර තුළ සහ ඉන් ඔබ්බට ඔරොත්තු දිය හැකි, ඇතුළාන්තීය හා තිරසාර ආර්ථික සංවර්ධනයක් කරා ඉදිරි පියවර තැබීමට , ශ්‍රී ලංකාව සැදී පැහැදී සිටී.

ඉදිරි වසරවල දී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාජ ආරක්ෂණ අරමුදලක් ලෙස එහි සාමාජික සුභසාධනය සහ මූල්‍ය සුරක්ෂිතභාවය ප්‍රවර්ධනය කිරීමේ කේන්ද්‍රිය බලවේගයක් ලෙස පවතිනු ඇත. කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ සාමාජික ප්‍රවේශ්‍යතාව ඉහළ නැංවීම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයන් දරන අතරම, කොටස් හිමිකම් සහ ස්ථාවර ආදායම් සුරැකුම්පත් හරහා විචක්ෂණශීලී ආයෝජන විවිධාංගීකරණයක්



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

සඳහා ද මණ්ඩලය ඇප කැපවී සිටී. හරිත ආර්ථිකයක් කරා දිවෙන ගෝලීය සංක්‍රමණයට සහාය වනු පිණිස ඉදිරි වසරවල දී හරිතමය, සමාජමය හා තිරසාරමය (GSS+) බැඳුම්කර මෙවලම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සඳහා උපාය මාර්ගික අවධාරණයක් සහිතව මණ්ඩලය ක්‍රියා කරනු ඇත. ඒ අතරම, ප්‍රමාණවත් අවදානම් අධීක්ෂණ සහ පාලන කාර්ය රාමුවක් සමඟ ශක්තිමත් ආයෝජන උපාය මාර්ග හරහා පාර්ශවකරුවන් වෙත තිරසාර අගය එකතු කිරීම සහතික කිරීම උදෙසා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මනාව ස්ථානගතව සිටී.



## දායක මුදල් රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා කොට්ඨාසය සේවායෝජකයින් විසින් ගෙවීමට නියමිත දායක මුදල් නිසි පිරිදි නියමිත කාලය තුළ රැස්කිරීම සහ ප්‍රමාද වන දායක මුදල් සඳහා පැනවෙන අධිභාර අය කිරීම යන කාර්යයන් වෙනුවෙන් වගකීම උසුලයි. ඒ සඳහා සම්බන්ධ වන ප්‍රධාන පාර්ශවකරුවන් වන සේවායෝජකයන්, බැංකු ආයතන සහ තැපැල් දෙපාර්තමේන්තුව සමඟ මනා සම්බන්ධීකරණයක් සිදු කරමින් ප්‍රේෂණය කරනු ලබන දායක මුදල් නිවැරදිව ගිණුම්ගත කිරීම හා වාර්තා කිරීම සිදු කරයි.

එයට අමතරව නව සේවායෝජකයන් හඳුනා ගැනීම සහ ඔවුන් මෙම අරමුදල යටතේ ලියාපදිංචි කිරීම යන කටයුතු ඉටු කරනු ලබන්නේ ද මෙම කොට්ඨාසය මගිනි. පවතින ක්‍රම වේදය යටතේ කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව සේවා යෝජකයන් වෙත ලබා දෙන සේවය අංකය යටතේම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ද ලියාපදිංචි කර සරල අයදුම්පත්‍රයක් මගින් ලබා ගන්නා තොරතුරු මත සේවා යෝජක ගිණුම් සැකසීම සිදු කෙරේ. ඒ අනුව මණ්ඩලය විසින් සේවායෝජක ලියාපදිංචි කිරීමක් සෘජුව සිදු නොකරයි. එයට අමතරව ප්‍රාදේශීය කාර්යාල විසින් සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂණවලින් ලබා ගන්නා තොරතුරු පදනම් කරගෙන සහ සේවා යෝජකයන්ගේ ඉල්ලීම් මත නව සේවා යෝජක ගිණුම් සැකසීම සිදු කෙරේ.

සේවායෝජකයන් දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ඉටු කිරීම මෙන්ම ස්වයං රැකියාවල නියුක්ත වූවන් සහ විදේශ ගතව සංක්‍රමණික රැකියාවල නියුක්ත වූවන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල යටතේ සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් මෙම කොට්ඨාසය කටයුතු කරයි.

ඒ අනුව රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා කොට්ඨාසය මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල ජාලය සමඟ එක්ව නියමිත කාර්ය සාධන ඉලක්ක වෙත ගෙන යාම සිදු කරයි.

| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| සක්‍රිය සේවා යෝජකයන් ගණන | 69,094 | 64,026 | 75,485 | 79,895 | 84,578 |
| සක්‍රිය සාමාජිකයන් ගණන | 2,430,091 | 2,455,609 | 2,592,923 | 2,548,200 | 2,654,811 |
| ස්වයං රැකියාවන්හි නියුතු සාමාජිකයින් ගණන | 41,517 | 41,113 | 43,640 | 44,494 | 45,404 |
| සංක්‍රමණික සේවක සාමාජිකයින් ගණන | 228 | 241 | 274 | 291 | 328 |

### තම සේවකයින් සඳහා දායක මුදල් ගෙවීමට අනුකූලතාව දැක්විය යුතු සේවායෝජකයන්

විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන රාජ්‍ය අංශයේ සහ පුද්ගලික අංශයේ රැකියාවල නියුතු සේවා නියුක්තයන් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අනුව නීතිමය පදනමක් මත අරමුදලේ සාමාජිකයන් වන අතර ස්වයං රැකියාවල නිරත වන සහ විදේශ ගතව රැකියාවල නියුක්ත සංක්‍රමණික සේවකයින් හට ද තම ස්වේච්ඡාවෙන් අරමුදලේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැක. එලෙස සාමාජිකත්වය ලබාගන්නා සාමාජිකයින් හට සාමාන්‍ය සාමාජිකයින්හට ලබාදෙන ප්‍රතිලාභ සියල්ලම ලබාගැනීමට හිමිකම් ලැබේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත සේවා නියුක්තයන්ගෙන් විශ්‍රාම වැටුපකට හිමිකම් නො ලබන රැකියාවල නියුතු සියළු සේවා නියුක්තයන් ආවරණය වන පරිදි විශ්‍රාම සහ අනෙකුත් සුභසාධන ප්‍රතිලාභ ලබාදීම මෙම අරමුදල මගින් අපේක්ෂා කෙරේ. මෙහිදී සේවා යෝජකයන් තම ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් නොව අනියම් හා කොන්ත්‍රාත් පදනමින් වැඩ කරන සේවකයන් මෙන්ම දෛනික හෝ කෑලි පදනම මත වැටුප් ලබන සේවකයන් ද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීම කළ යුතු වේ.

කෙසේ නමුත් කම්කරු දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන අනුව වාර්තා ගත සේවා යෝජකයන් සහ ඔවුන් යටතේ වන සියලු සේවකයන් සංඛ්‍යාව සහ මෙම අරමුදල යටතේ ලියාපදිංචි සංඛ්‍යාව අතර සැලකිය යුතු පරස්පරතාවන් පවතී. මෙම අසමතුලිත බව අවම කිරීම සඳහා මණ්ඩලය විසින් යාවත්කාලීන තොරතුරු අදාල ආයතනවලින් ලබාගෙන එම තොරතුරු මත ක්ෂේත්‍ර පරීක්ෂණ පවත්වමින් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන්හි නියැලේ.

මණ්ඩලය විසින් ප්‍රධානය කරනු ලබන විශ්‍රාම ප්‍රතිලාභ වලට අමතරව පිරිනමනු ලබන අනෙකුත් ප්‍රතිලාභ ප්‍රධානය කරනු ලබන්නේ සේවා යෝජකයින් විසින් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා ගෙවනු ලබන දායක මුදල් අඛණ්ඩව නිසි පරිදි සිදු කර ඇති සාමාජිකයන් වෙත පමණි. එබැවින් එම ප්‍රතිලාභ සඳහා සාමාජිකයන් වෙත හිමිකම් පෑමට හැකි වන සේ දායක මුදල් ප්‍රමාදයකින් තොරව අඛණ්ඩව සේවා යෝජකයන් විසින් සිදු කරන්නේ ද යන්න අප කාර්යය මණ්ඩලය විසින් නියාමනය කෙරේ.

## ප්‍රාදේශීය කාර්යාල මගින් දායක මුදල් අයකිරීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත තම සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවිය යුතු සේවා යෝජකයන් අලුතින් හඳුනාගෙන ඒ සඳහා යොමු කරවීම සහ දැනටමත් ලියා පදිංචි වී සිටින සේවා යෝජකයින්ගේ දායක මුදල් ගෙවීම් අනුකූලතාවය සහතික කිරීම සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි පිහිටුවා ඇති සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 19 ක් විසින් වාර්ෂිකව සේවා යෝජකයන් නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ 25,000 සිට 27,000 දක්වා ගණනක් සිදු කර ඇත.

මෙම ක්ෂේත්‍ර පරීක්ෂණ අතරින් 70% ක් පමණ සිදු කර ඇත්තේ ගෙවීම් ප්‍රමාදයන් වාර්තා වී ඇති ආයතන මූලික කරගෙන වේ. ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් හඳුනාගනු ලබන නව සේවා යෝජකයින් සංඛ්‍යාව වර්ෂයකට 3,762 ක පමණ සාමාන්‍ය අගයක් ගනී.

2025 වර්ෂයේදී සිදු කර ඇති මුළු ක්ෂේත්‍ර පරීක්ෂණ සංඛ්‍යාව 25,782 ක් වන අතර එමගින් දායක මුදල් නොගෙවන බවට අනාවරණය කරගෙන ඇති සේවා යෝජකයන් සංඛ්‍යාව 16,648 කි. එසේම ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් අනාවරණය කරගත් කරුණු මත අරමුදල සඳහා ලියාපදිංචි වී ඇති නව සාමාජික සංඛ්‍යාව 17,095 කි.

## දායක මුදල් මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ ගෙවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2311/39 හා 2022.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති නියෝග අනුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ප්‍රේෂණය කිරීමේදී, 2023 පෙබරවාරි 01 වැනි දින සිට සේවක සංඛ්‍යාව 15 ට වැඩි ආයතන විසින්, පරිගණක පද්ධතියක් හෝ ජංගම ඉලෙක්ට්‍රොනික උපාංගයක් හරහා ඉලෙක්ට්‍රොනිකව දායක මුදල් ප්‍රේෂණය කළ යුතුය.

ඒ අනුව 2025 වර්ෂයේ රැස් කරන ලද දායක මුදල මුළු දායක මුදලින් 82.28% මාර්ගගත ක්‍රමය මගින් සිදු කර ඇති අතර එය සමස්ථ සක්‍රිය සේවා යෝජකයන්ගේ සංඛ්‍යාවෙන් 19.34% ක් වේ. රජයේ ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වර්තමාන විධිවිධාන අනුව ඉහත නියෝග යට අනුකූලව මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ දායක මුදල් ගෙවීම හා ප්‍රේෂණ නිවේදන යොමු කිරීම පිළිබඳව සේවා යෝජකයන්ගේ දැඩි අවධානය යොමු කර ඇති අතර ප්‍රේෂණ නිවේදන/සාමාජික තොරතුරු එකවර සැපයීමට හැකි නිසා වඩාත් පහසු සහ නිරවද්‍යතාවය උපරිමව පවත්වාගත හැකි ක්‍රමය වශයෙන් නිර්දේශ කෙරේ. ඒ අනුව සේවක සංඛාව 15ට අඩු ආයතන සඳහා ද මෙම ක්‍රමය මත දායක මුදල් සහ ප්‍රේෂණ නිවේදන යොමු කිරීමට හැකියාව ඇති හෙයින් ඒ සඳහා ඔවුන් පෙළඹවීම සිදු කෙරේ. ඒ අනුව මෙම ක්‍රමයට අනුගතව දායක මුදල් ප්‍රේෂණය කිරීම මෙතෙක් සිදු නොකරන සේවායෝජකයන් ඒ සඳහා යොමු කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි.

මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සේවා යෝජකයන් හට පහත ක්‍රම 2ක භාවිතයෙන් දායක මුදල් ගෙවීම් සිදු කිරීම සඳහා පහසුකම් සලසා ඇත.

1. **විද්‍යුත් බැංකුකරණය (E-Banking/ Online Banking)**

   මාර්ගගත ක්‍රම ඔස්සේ විද්‍යුත් බැංකුකරණය මගින් දායක මුදල් ගෙවීම සඳහා පහත සඳහන් වාණිජ බැංකු නමය මගින් පහසුකම් සලසා ඇත.

   - ලංකා බැංකුව
   - මහජන බැංකුව
   - කොමර්ෂල් බැංකුව
   - සම්පත් බැංකුව
   - සෙලාන් බැංකුව
   - නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
   - ඩී එෆ් සී සී බැංකුව
   - හැටන් නැෂනල් බැංකුව
   - ජාතික සංවර්ධන බැංකුව

2. **සෘජු හර කිරීම් (Direct Debit)**

   සෘජුහර කිරීම් (Direct Debit) ඔස්සේ දායක මුදල් ගෙවීම ඕනෑම වාණිජ බැංකුවක් මගින් සිදුකළ හැකිය.

   ඉහත සඳහන් මාර්ගගත ක්‍රමයට අමතරව සාම්ප්‍රදායික ක්‍රම වන චෙක්පත්, මුදල් ඇණවුම් සහ මුදල් මගින් ප්‍රධාන කාර්යාලයට හෝ ශාඛා කාර්යාල වෙත ගෙවීම් සිදු කිරීමට හැකියාව ඇතත් වර්තමාන රජයේ ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උත්සාහයක් ලෙස මෙම ක්‍රම අධෛර්යමත් කෙරේ. ඒ වෙනුවට මාර්ගගත ක්‍රම උපයෝගී කර ගනිමින් අන්තර්ජාලය හරහා ප්‍රේෂණ සිදු කිරීම තුළින් කාර්යයන් වඩාත් සරල, පහසු සහ කාර්යක්ෂම වනු ඇත.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු







ඒ අනුව මාර්ගගත ක්‍රම සහ සාම්ප්‍රදායික ක්‍රම මත සිදු කර ඇති දායක මුදල් රැස්කිරීම් විශ්ලේෂණය පහත පරිදි වේ.

| # | ගෙවීම් ක්‍රමය | 2024 | | | 2025 | | | වර්ධනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සේවා යෝජක සංඛ්‍යාව (සාමාන්‍ය අගය) | වටිනාකම (රු. මිලියන) | % | සේවා යෝජක සංඛ්‍යාව (සාමාන්‍ය අගය) | වටිනාකම (රු. මිලියන) | % | සේවා යෝජක සංඛ්‍යාව (සාමාන්‍ය අගය) | වටිනාකම (රු. මිලියන) | % |
| **මාර්ගගත ක්‍රම (Online)** | | | | | | | | | | |
| 1 | මාර්ගගත බැංකු ක්‍රමය | 10,618 | 32,227 | 76.65% | 11,535 | 37,280 | 71.16 | 917 | 5,053 | 15.68 |
| 2 | සෘජුහර ක්‍රමය | 209 | 2,273 | 5.41% | 198 | 2,470 | 5.11 | (11) | 197 | 8.67 |
| | එකතුව (1+2) | 10,827 | 34,500 | 82.05% | 11,733 | 39,750 | 82.28 | 906 | 5,250 | 15.22 |
| **සාම්ප්‍රදායික ක්‍රම** | | | | | | | | | | |
| 3 | චෙක්පත් | 39,074 | 7,051 | 16.77% | 41,131 | 7,942 | 16.44 | 5,057 | 891 | 12.64 |
| 4 | මුදල් ඇණවුම් | 2,767 | 86 | 0.20% | 3,015 | 106 | 0.22 | 248 | 20 | 23.26 |
| 5 | මුදල් | 4,128 | 409 | 0.97% | 4,691 | 515 | 1.07 | 563 | 106 | 25.92 |
| | එකතුව (3+4+5) | 45,969 | 7,546 | 17.95% | 48,837 | 8,563 | 17.72 | 2,868 | 1,017 | 13.48 |
| **මුළු එකතුව** | | **56,796** | **42,046** | **100.00%** | **60,570** | **48,313** | **100** | **3,774** | **6,267** | **14.91** |

# සාමාජික සේවා

1980 අංක 46 දරණ පනත මගින් ස්ථාපිත කර ඇති සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන්නේ, සේවක අයිතිය, සේවක සුභ සාධනය හා කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම හා සාමාජිකයින්ගේ ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීමයි. සාමාජික සේවා කොට්ඨාසය අංශ 7කින් සමන්විත අතර ඒවායේ ප්‍රධාන කර්යයන් වන්නේ සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජිකයින් වෙත වාර්ෂික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම සහ සාමාජික ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ හා ව්‍යවස්ථාපිත නොවන සුභසාධන ප්‍රතිලාභ ලබා දීමට කටයුතු සම්පාදනය කිරීමයි.




*Figure 1: Organization Structure of Member Service Division*

## සාමාජික හිමිකම් ගෙවීම (ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ)

ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ ගෙවීම් කිරීම යටතේ යම් සාමාජිකයෙකු සේවා නියුක්තිය අවසන් කළ පසු හෝ සේවා නියුක්තිය අවසන් වීමට යටත්ව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු තම ගිණුමේ ශේෂය ලබාගැනීමට හැකියාවක් ඇති අතර සාමාජිකයා මියගිය අවස්ථාවකදී, සාමාජිකයාගේ උරුමකරුවන්, යැපෙන්නන් හෝ නාමිකයන් වෙනුවෙන් ගිණුම් ශේෂය ගෙවීම් කරනු ලැබේ.

2024 වර්ෂයේදී රුපියල් බිලියන 34 ක් සාමාජිකයින් 195,896 වෙනුවෙන් ගෙවීම් කර ඇති අතර 2025 වර්ෂය අවසානයේදී රුපියල් බිලියන 30.7 ක් සාමාජිකයින් 166,444 දෙනෙකු වෙනුවෙන් ගෙවීම් කර ඇත. රටේ පැවති ආර්ථික තත්ත්වය යම් මට්ටමකට ස්ථාවර වීම, සේවා නියුක්තිකයින් විදේශගත වීමේ ප්‍රවණතාවය අඩුවීම හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වසා දැමූ ව්‍යාපාර නැවත ආරම්භ කිරීම යන ප්‍රධාන හේතූන් මත සාමාජිකයින් විසින් 2025 වර්ෂයේදී ඔවුන්ගේ හිමිකම් ආපසු ලබා ගැනීමේ ප්‍රමාණාත්මක අඩුවීමක් පෙන්නුම් කෙරේ. මෙම අඩුවීම 2024 වර්ෂය හා සැසඳීමේදී 15% ක් ලෙස ප්‍රතිශතාත්මකව දැක්විය හැකිය.

**සාමාජික හිමිකම් ගෙවීම්**




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| Value (Mn.) | 20,061.97 | 25,298.00 | 38,774.81 | 33,799.21 | 30,713.86 |
| No of Members | 149,019 | 195,212 | 240,888 | 195,896 | 166,444 |

## සුභසාධන ප්‍රතිලාභ (ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ)

සේ.නි.භා. අරමුදල් මණ්ඩලය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු අතර සාමාජික සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය සුරකීමට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ඒ අනුව 1986 වර්ෂයේදී " ස්වයංක්‍රිය ජීවිත රක්ෂණ ප්‍රතිලාභ (මරණ ප්‍රතිලාභ) යෝජනා ක්‍රමය" හඳුන්වා දීමේ සිට 2024 වර්ෂයේදී රාජ්‍ය විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වන අප මණ්ඩලයේ සක්‍රීය සාමාජිකයන්ගේ දූ දරුවන් වෙනුවෙන් "විශ්ව යාත්‍රා" නමින් රුපියල් 25,000.00 ක මූල්‍ය ප්‍රදානය කිරීම දක්වා සුභසාධන ප්‍රතිලාභ 11ක් පිරිනැමෙනු ලැබේ.

සාමාජික ගිණුම් ශේෂයෙන් කිසිදු මුදලක් අඩු නොකර වෛද්‍ය ආධාර ලබා දීම සහනදායි පොලී අනුපාතයක් යටතේ නිවාස ණය ලබා දීමෙන් නොනැවතී සාමාජිකයින්ගේ දූ දරුවන්ගේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම මඟින් අප මණ්ඩලීය සාමාජිකයින්ට අවැසි මොහොතේ ඔවුන්ගේ අනාගතය සුරැකීමට ශක්තියක් වෙමින් කටයුතු කරනු ලබයි.

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

## සුබ සාධන ප්‍රතිලාභ ගෙවීම්




| | ඇක්ෂි කාච | හෘද සැත්කම් | ජීවිත රක්ෂණ | නිත්‍ය දුබලතා | ශ්‍රමසුව රැකවරණ | වකුගඩු බද්ධ කිරීම් |
|---|---|---|---|---|---|---|
| 2024 රු.මිලියන | 8.19 | 126.77 | 121.16 | 19.91 | 18.53 | 1.42 |
| 2025 රු.මිලියන | 9.68 | 168.59 | 98.38 | 24.15 | 16.90 | 6.46 |
| 2024 ප්‍රතිලාභ ගණන | 367 | 421 | 1223 | 81 | 835 | 6 |
| 2025 ප්‍රතිලාභ ගණන | 414 | 551 | 995 | 95 | 796 | 19 |

මෙම සියලුම ප්‍රතිලාභයන් ස්වයං රැකියාවල නියුක්තවූවන්ට හා විගමණික සේවකයින් ලෙස ලියාපදිංචි වී මණ්ඩලයේ සාමාජිකත්වය ලබා ගත් සාමාජිකයින්ට ද විවෘතව ඇත.

මෙම සුභසාධන ප්‍රතිලාභවල පිරිවැය සමස්ථ සාමාජිකයින් විසින් සමානුපාතිකව දරාගනු ලැබුව ද ඒ තුළින් සියලුම සාමාජිකයින්ට අවැසි මොහොතේදී රැකවරණය සැලසීමට හැකි වීම සියලුම සාමාජිකයින්ගේ නිහඬ අභිමානයක් බවට පත්ව ඇත.

2023 හා 2024 වර්ෂවලදී නිපුණතා සවිය හා විශ්ව යාත්‍රා යන සුභසාධන ප්‍රතිලාභ හඳුන්වා දෙමින් මණ්ඩලයේ සුභසාධන ප්‍රතිලාභවලට නව මුහුණුවරක් එක් කරමින් අගය එකතු කිරීමේ වැඩපිළිවෙලක් හඳුන්වා දෙන ලදි.

උසස් පෙළ විභාගයට පෙනී සිටි දරුවන් ජාතික වෘත්තීය නිපුණතා (NVQ) 3,4 හා 5 මට්ටමේ පාඨමාලාවන් හැදෑරීමට යොමු කිරීම හරහා දෙස් විදෙස් රැකියා වෙළඳපොලට නිපුණතාවෙන් පරිපූර්ණ හා සුදුසුකම්ලත් පුද්ලයෙකු ලෙස අභිමානයෙන් ප්‍රවිශ්ට වීමට රුපියල් 50,000.00ක් මූල්‍ය ප්‍රධානයක් සිදු කරනු ලබන අතර 2025 වර්ෂ අවසානයේදී සාමාජිකයින්ගේ දූ දරුවන් 12 දෙනෙකු වෙනුවෙන් රුපියල් 437,800 මුදලක් මෙම ප්‍රතිලාභය හරහා ගෙවීම් කර ඇත.

2025 වර්ෂයේදී උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට ලෙස සමත්වී රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන සාමාජිකයන්ගේ දූ දරුවන් සඳහා රුපියල් 25,000.00 ක මූල්‍ය ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ අතර දූ දරුවන් 2,196 දෙනෙකු වෙනුවෙන් රුපියල් 54,900,000.00 මුදලක් ගෙවීම් කර ඇත. සාමාජික සුභසාධන ප්‍රතිලාභ පුළුල් කරමින් විශ්ව යාත්‍රා ප්‍රතිලාභය හඳුන්වාදීම සුභසාධන ප්‍රතිලාභවල සුවිශේෂි මඟ සළකුණක් ලෙස සටහන් කිරීමට කැමැත්තෙමි.

### සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතෙ විධිවිධාන අනුව සේවා යෝජකයින් විසින් එක් එක් සේවකයන්ගේ මාසික මුළු ඉපයීම්වලින් 3%කට සමාන මුදලක් මාසිකව මණ්ඩලය වෙත ප්‍රේෂණය කළ යුතුය. ස්වයං රැකියාවල නියුක්ත වූවන් මසකට රු.500.00 ක් සහ විගමනික සේවකයින් මසකට රු.2000.00 මුදලක් මණ්ඩලය වෙත එවීමෙන් සාමාජිකත්වය ලබා ගත හැකිය.

සාමාජිකයාගේ ගිණුමේ ශේෂයට පනත මගින් නියම කර ඇති පොලී අනුපාතයට අමතරව වාර්ෂිකව ලබා දෙන ලාභාංශ මුදලින් සාමාජික ගිණුම් වර්ධනය වේ. මෙම කාර්යය සාමාජිකයින් 150 වැඩි ආයතන සඳහා සාමාජික ගිණුම් විශාල කාණ්ඩය මගින් ද සාමාජිකයින් 150 වඩා අඩු ආයතන සඳහා සාමාජික ගිණුම් කුඩා කාණ්ඩය විසින් ද සිදු කරනු ලබයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 8 (ඒ) වගන්තියට අනුව සෑම ගිණුම් වර්ෂයක් සඳහා ම එළඹෙන වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දිනට පෙර සෑම සක්‍රිය සාමාජිකයින්ගේ ම පෞද්ගලික ගිණුම් ශේෂය වාර්ෂික ගිණුම් ප්‍රකාශණයක් මගින් සාමාජිකයින් වෙත නිවේදනය කළ යුතු වේ.

2025 වර්ෂය අවසන් වන විට අප මණ්ඩලයේ සක්‍රිය සාමාජික ගිණුම් 2,602,200ක් අතුරින් ගිණුම් 2,453,114 ක් යාවත්කාලීන කරමින් ඔවුන්ගේ සේවා යෝජකයන් වෙත සාමාජික ගිණුම් ප්‍රකාශන යවා ඇත. තව ද අක්‍රිය සාමාජික ගිණුම් 15,440,000 පමණ පවතින අතර ගිණුම් 15,296,781 පමණ යාවත්කාලීන කර ඇත.

මීට අමතරව මණ්ඩලය මගින් ක්‍රියාත්මක විද්‍යුත් සේවාව හරහා (E-service) සාමාජිකයින්ට තම පෞද්ගලික ගිණුමේ ශේෂය කෙටි පණිවිඩයක් හරහා දැනගැනීමට අවශ්‍යය පහසුකම් ද සැපයීම මගින් සාමාජිකයින්ගේ තම ගිණුම් තොරතුරු දැනගැනීමේ ප්‍රවේශය පුළුල් කිරීමට මණ්ඩලය ගෙන ඇති සුවිශේෂී පියවරකි.









## මානව සම්පත් කළමනාකරණය

විශ්‍රාම යෑම් සහ ඉල්ලා අස්වීම් හේතුවෙන් 2024 වර්ෂයේ 837 ක්ව සිටි සේවක සංඛ්‍යාවේ සුළු වෙනසක් සහිතව 2025 වසර අවසානයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතුව සේවකයින් 847 දෙනෙකු සිටියහ.

| මට්ටම | රැකියා ශ්‍රේණිය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | සාමාන්‍යාධිකාරී | - | - | - |
| | අතිරේක සාමාන්‍යාධිකාරී | - | - | - |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 6 | - | 6 |
| | සහකාර සාමාන්‍යාධිකාරී | 4 | 1 | 5 |
| | කළමනාකරු | 20 | 18 | 38 |
| | **එකතුව** | **30** | **19** | **49** |
| තෘතියික | කනිෂ්ඨ කළමනාකරු | 33 | 28 | 61 |
| | කළමනාකරණ සහකාර | 71 | 109 | 180 |
| | **එකතුව** | **104** | **137** | **241** |
| ද්විතියික | කළමනාකරණ සහකාර 2-2 | 4 | 2 | 6 |
| | කළමනාකරණ සහකාර 1-2 | 165 | 262 | 427 |
| | **එකතුව** | **169** | **264** | **433** |
| ප්‍රාථමික | ප්‍රාථමික මට්ටම | 111 | 13 | 124 |
| | **එකතුව** | **111** | **13** | **124** |
| **මුළු එකතුව** | | **414** | **433** | **847** |



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

## සේවක පිරිස වයස අනුව

| සේවක පිරිස වයස අනුව (2025.12.31 දිනට) වයස පරාසය (අවුරුදු) | | |
|---|---|---|
| 21-25 | 0 | 0% |
| 26-30 | 76 | 8.88% |
| 31-35 | 124 | 14.65% |
| 36-40 | 130 | 15.34% |
| 41-45 | 147 | 17.35% |
| 46-50 | 87 | 10.27% |
| 51-55 | 142 | 16.76% |
| Above 55 | 141 | 16.65% |
| **එකතුව** | **847** | **100%** |

## සේවක පිරිස රැකියා ශ්‍රේණිය අනුව

| | රැකියා ශ්‍රේණිය | එකතුව | % |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | සාමාන්‍යාධිකාරි | | |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි | 6 | 0.71% |
| | සහකාර සාමාන්‍යාධිකාරි | 5 | 0.59% |
| | කළමනාකරු | 38 | 4.49% |
| | **එකතුව** | **49** | **5.79%** |
| තෘතියික | කණිෂ්ඨ කළමනාකරු | 61 | 7.20% |
| | කළමනාකරණ සහකාර 4 | 180 | 21.25% |
| | **එකතුව** | **241** | **28.45%** |
| ද්විතියික | කළමනාකරණ සහකාර 2-2 | 6 | 0.71% |
| | කළමනාකරණ සහකාර 1-2 | 427 | 50.41% |
| | **එකතුව** | **433** | **51.12%** |
| ප්‍රාථමික | ප්‍රාථමික මට්ටම | 124 | 14.64% |
| | **එකතුව** | **124** | **14.64%** |
| **මුළු එකතුව** | | **847** | **100%** |

## සේවකයන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක පුරුෂ හා කාන්තා අනුපාතය 2025 අවසානයේ දී 48.87:51.12 ක් ලෙස පැවතුනි.

| පුරුෂ | ස්ත්‍රී | මුළු එකතුව |
|---|---|---|
| 414 | 433 | 847 |
| 48.87 % | 51.12% | 100% |

## සේවක පිරිස වයස අනුව

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 468 |
| ශාඛා කාර්යාල | 379 |
| එකතුව | 847 |

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින් 847 දෙනාගෙන් 468 දෙනෙක් ප්‍රධාන කාර්යාලයේ සිටින අතර 379 දෙනෙක් ශාඛා ජාලය පුරා විසිරී සිටිති.

## සේවකයන් සේවයේ නිරත වී සිටීම

| විස්තර | විධායක | විධායක නොවන | එකතුව |
|---|---|---|---|
| විශ්‍රාම ගැනීම | 10 | 16 | 26 |

### සේවක ස්ථාන මාරු

මණ්ඩලයේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව මණ්ඩලයේ වසර පහකට වැඩි කාලයක් එකම අංශයේ සේවය කරන ලද සේවකයන් ස්ථාන මාරු සිදුකරන ලදි

### වැටුප් හා ප්‍රතිලාභ

මණ්ඩලයේ සියලුම සේවකයන් ස්ථිර තනතුරු දරයි. ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවකයන් වශයෙන් ඔවුන් තම මූලික වැටුපට අමතරව ප්‍රතිලාභ රැසක් සඳහා සුදුසුකම් ලබයි.

| | 2025 රු. '000 | 2024 රු. '000 | වෙනස % |
|---|---|---|---|
| වැටුප් | 548,670 | 533,429 | (2.86) |
| ජීවන වියදම් දීමනාව | 183,295 | 163,397 | (12.18) |
| ආහාර දීමනාව | 11,829 | 11,941 | 0.93 |
| අතිකාල දීමනාව | 29,644 | 38,885 | 23.77 |
| නිවාඩු දින දීමනා | 11,811 | 16,260 | 27.36 |
| **එකතුව** | **785,249** | **763,912** | **37.02** |

## ප්‍රතිලාභ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක සේවිකාවන්, සේවකයින් වෙත පිරිනැමෙන ප්‍රතිලාභ ගණනාවක් සඳහා සුදුසුකම් ලබයි. ඒවාට මූලික වැටුප අනුව ලබා දෙන දිරිගැන්වීම්, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ පහසුකම්, වාර්ෂික ප්‍රසාද දීමනා සහ විවිධ ණය, උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා වැටුප් වර්ධක සහ සේවකයාගේ ස්ථිර ආබාධිතබාවය හෝ මරණය වෙනුවෙන් පිරිනැමෙන වන්දි යනාදිය ඇතුළත් වේ.

| | 2025 රු. '000 | 2024 රු. '000 | වෙනස % |
|---|---|---|---|
| දිරි දීමනා | 131,853 | 141,870 | 7.06 |
| නිල ඇඳුම් සහ මැහුම් වියදම් | 28,904 | 24,616 | (17.42) |
| විශේෂ විශ්‍රාමික ප්‍රසාද දීමනා | 1,400 | 1,600 | 12.50 |
| තේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සුබසාධන වියදම් | 14,656 | 16,569 | 11.55 |
| නිවාඩු දින වෙනුවෙන් මුදල් ගෙවීම | 19,502 | 19,489 | (0.07) |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 85,470 | 78,113 | (9.42) |
| වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම | 127,434 | 116,584 | (9.31) |
| නිවාස ණය සඳහා පොලිය | 5,794 | 7,015 | 17.41 |
| පොලී පිරිවැය | 39,502 | 39,439 | (0.16) |
| වත්මන් සේවා පිරිවැය | 19,364 | 14,511 | (33.44) |
| සේ. අ. අ. | 111,573 | 104,594 | (6.67) |
| සේ. නි. භා. අ. | 22,268 | 20,941 | (6.34) |
| දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම | 3,780 | 3,690 | (2.44) |
| **එකතුව** | **611,500** | **589,031** | **(3.81)** |

## දිරි දීමනා

මූලික වැටුප පදනම් කරගෙන දිරි දීමනාව සකස් කරනු ලබන අතර, මාසික පදනමින් ගෙවනු ලබන පැමිණීමේ සහ කාර්ය සාධන දිරි දීමනා ඇතුළත් වේ.

## වෛද්‍ය පහසුකම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල සේවකයින්ගේ වෛද්‍ය පහසුකම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- එක් සේවකයෙකුට රු. 75,000.00 ක් දක්වා වූ වාර්ෂික බාහිර රෝගී සත්කාර වෛද්‍ය ප්‍රතිපූර්ණය.
- එක් සේවකයෙකුට වාර්ෂිකව රු.125,000.00 ක් දක්වා වූ රෝහල් ගතව ප්‍රතිකාර ලබා ගැනීමේ වියදම් ප්‍රතිපූර්ණය.

## සේවකයාගේ ස්ථිර අබාධිත භාවය හෝ මරණය වෙනුවෙන් වන්දි

| සිද්ධිය | ශ්‍රේණිය / තනතුර | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| සේවකයාගේ මරණය | සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 1,500,000.00 |
| | ඉහළ කළමනාකරණය (2-1), (1-3) හා (1-1) | 1,450,000.00 |
| | මධ්‍යම කළමනාකරණය (1-3) | 1,350,000.00 |
| | කනිෂ්ඨ කළමනාකරු (1-1) | 1,250,000.00 |
| | කළමනාකරණ සහකාර (4) | 1,125,000.00 |
| | කළමනාකරණ සහකාර (2-2), (1-2) | 1,000,000.00 |
| | ප්‍රාථමික මට්ටම (1),(2),(3) | 875,000.00 |

| සිද්ධිය | ශ්‍රේණිය / තනතුර | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| ශිෂ්‍ය දුබලතා | සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 1,750,000.00 |
| | ඉහළ කළමනාකරණය (2-1), (1-3) හා (1-1) | 1,700,000.00 |
| | මධ්‍යම කළමනාකරණය (1-3) | 1,650,000.00 |
| | කනිෂ්ඨ කළමනාකරු (1-1) | 1,500,000.00 |
| | කළමනාකරණ සහකාර (4) | 1,350,000.00 |
| | කළමනාකරණ සහකාර (2-2), (1-2) | 1,200,000.00 |
| | ප්‍රාථමික මට්ටම(1),(2),(3) | 1,050,000.00 |

## වාර්ෂික ප්‍රසාද දීමනා

දෙසැම්බර් මාසයේ දී ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාව මාස දෙකක මූලික වැටුපට සමාන වේ.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

## ණය

### වාහන ණය

ඕනෑම සේවකයෙකුට පා පැදි ණය සමග මෝටර් වාහන, ත්‍රිරෝද රථ සහ මෝටර් සයිකල් යන ණය කාණ්ඩවලින් එක් ණයක් ලබා ගත හැකි ය

| | | |
|---|---|---|
| මෝටර් රථය | ණය මුදල | රු. 3,000,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 15 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| ත්‍රිරෝද ණය | ණය මුදල | රු 1,250,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 15 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| යතුරු පැදිය | ණය මුදල | රු. 500,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 10 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| පාපැදි ණය | ණය මුදල | රු. 25,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වාරික 36 |
| | පොලිය | වාර්ෂික 4.2% |

### විශේෂ ණය

| | |
|---|---|
| ණය මුදල | රු.100,000.00 |
| ප්‍රතිසාධන කාල සීමාව | වාරික 60 |
| පොලිය | වාර්ෂික 4.2% |

### විශේෂ ආපදා ණය

| | |
|---|---|
| ණය මුදල | මාස 12 ක වැටුප |
| ප්‍රතිසාධන කාල සීමාව | වාරික 120 |
| පොලිය | වාර්ෂික 4.2% |

### නිවාස ණය

| | |
|---|---|
| ණය මුදල | රු. 3,000,000.00 |
| ප්‍රතිසාධන කාල සීමාව | අවුරුදු 25 හෝ වයස අවු. 60 සම්පූර්ණ වීම |
| පොලිය | 1 වන රු. 2,000,000 සඳහා වසරකට 4.2% ශේෂ රු. 1,000,000 සඳහා වසරකට 7.0% |

# තොරතුරු තාක්ෂණ

2025 දී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය ආයතනික කාර්යක්ෂමතාව, මූල්‍ය වගවීම සහ ඩිජිටල් පරිවර්තනය යනාදී කර්තව්‍ය විෂයයෙහි ප්‍රමුඛ සක්‍රීය ක්‍රියාකරුවකු ලෙස එහි කාර්යභාරය තව දුරටත් ශක්තිමත් කළේ ය. පද්ධති විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම, පාලන රාමු ශක්තිමත් කිරීම, යටිතල පහසුකම්හි ඔරොත්තු දීමේ හැකියාව වැඩි වර්ධනය කිරීම සහ ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව උපාය මාර්ගික ඩිජිටල් මුලපිරීම් ඉදිරියට පවත්වා ගෙන යාම කෙරෙහි තොරතුරු තාක්ෂණ අංශය සිය අවධානය යොමු කළේ ය.

## සුවිශේෂී ජයග්‍රහණ හා මෙහෙයුම් කටයුතුවල වැඩි දියුණු කිරීම්

**'සේජ් ඇක්පැක්' (Sage Accpac) ගිණුම්කරණ පද්ධතිය - බහු වර්ෂ නඩත්තු කටයුතු ගිවිසුම**

බාධාවකින් තොරව මූල්‍ය මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සහ ව්‍යවස්ථාපිත වාර්තා කාලානුරූපව ඉදිරිපත් කිරීම සහතික කරනු පිණිස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 'සේජ් ඇක්පැක්' (Sage Accpac) ගිණුම්කරණ පද්ධතිය සඳහා තෙවසරක වාර්ෂික නඩත්තු කටයුතු කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළේ ය. මෙම මුලපිරීම, ගිණුම්කරණ පද්ධතියේ ස්ථායිතාව වැඩි දියුණු කර, සේවා බාධක අවම කර, පිරිවැය පුරෝකථනය කිරීම සහතික කරයි. එමෙන්ම, විකුණුම්කාර පාර්ශවයේ වගවීම ද සවිමත් කරයි.

**අයි බී එම් (IBM) පද්ධති අනුබලය - අඛණ්ඩතාව සහ අවදානම් ලුහුඩු කිරීම**

මෙම අංශය, ලෙගසි පද්ධති හා සම්බන්ධ අවදානම් ලුහුඩු කිරීම සඳහා වූ ආධාරක යාන්ත්‍රණයන් සවිමත් කරන අතරම මෙහෙයුම් අඛණ්ඩතාව ද සහතික කරමින් අයි බී එම් (IBM) පද්ධතිය මත පදනම් වූ මූලික නිෂ්පාදන පාරිසරිකය නොකඩවා පවත්වා ගෙන ගියේ ය.

**ලංකා ගවර්න්මන්ට් ක්ලවුඩ් පද්ධතියට (LGC) සංක්‍රමණය වීම**

'සේජ් ඇක්පැක්' (Sage Accpac) ගිණුම්කරණ පද්ධතිය, විද්‍යුත් ඊ සේවා වේදිකාව සහ නව මූලික පද්ධතිය ඇතුළු ප්‍රධාන පරිගණක පද්ධති, ශ්‍රී ලංකා ටෙලිකොම් දත්ත මධ්‍යස්ථානවල සත්කාරකත්වය දරන ලංකා ගවර්න්මන්ට් ක්ලවුඩ් පද්ධති (LGC) පාරිසරිකයට සාර්ථකව සංක්‍රමණය කෙරිණි.

## තොරතුරු තාක්ෂණ පාලනය හා උපාය මාර්ගික මූලාරම්භ

**ඩිජිටල් යටිතල ව්‍යුහ උපදේශක කමිටුව (EDIAC) පිහිටුවීම**

යටිතල පහසුකම් නවීකරණය, සයිබර් ආරක්‍ෂාව සහ නියාමන අනුකූලතාව පිළිබඳ උපාය මාර්ගික සහ තාක්‍ෂණික මාර්ගෝපදේශ සැපයීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ඩිජිටල් යටිතල ව්‍යුහ පහසුකම් උපදේශක කමිටුව (EDIAC) පිහිටුවන ලදී. මෙම කමිටුව, ජාතික ප්‍රමිතීන් සහ විශිෂ්ටතම චර්යා භාවිතයන් සමඟ පෙළගැස්වීමේ කාර්යයට උර දෙමින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT) යන ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විතව සිටී.

**මූලික පද්ධතිය සංවර්ධනය කිරීම - ප්‍රගතිය හා ඉදිරි ගමන් මග**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ නව මූලික පද්ධතිය පූර්ව යොදා ගැනීම් අදියරට ළඟා වී ඇත. කෘත්‍යාත්මක සහ ක්‍රියා පටිපාටිමය හිඩැස් හඳුනාගෙන ඇති අතර ඒවා දැනට විසඳමින් පවතී. ඉදිරියේ දී ඉටු කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් අතර මෙහෙයුම් පිළිගැනීමේ පරීක්ෂණය (OAT), සමාන්තර ධාවනය ක්‍රියාවට නැංවීම, වෙනස් කිරීමේ ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සහ අනෙක් පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම යන කාර්යයන් ඇතුළත් වේ.

**ව්‍යාපෘති කළමනාකරණය හා ආංශික අධීක්ෂණය**

වැඩ ප්‍රවාහ වලංගුකරණය, පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කිරීම, පිරික්සුම් කිරීම, ගැටලු සොයා ලුහුබැඳීම සහ කාර්ය සාධනය අධීක්‍ෂණය කිරීම, ඇතුළු එදිනෙදා ව්‍යාපෘති ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා ඒවායේ ඵලදායී බෙදාහැරීම හා පාලනය පිළිබඳව වග බලා ගැනෙන ඊට කැපවූ විශේෂිත ව්‍යාපෘති කණ්ඩායම් පිහිටුවන ලදී.

## සයිබර් ආරක්ෂාව සහ අනුකූලතාව දැක්වීම

ජාතික සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කරමින්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සිය සයිබර් ආරක්ෂණ ස්ථාපනය තවදුරටත් ශක්තිමත් කළේ ය. අභ්‍යන්තර හැකියාවන් වැඩි දියුණු කිරීම සහ ජාතික සයිබර් ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කෙරෙනු පිණිස තොරතුරු ආරක්ෂණ නිලධාරීන් (ISO) සහ සහකාර තොරතුරු ආරක්ෂක නිලධාරීන් (AISO) සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

## ධාරිතා වර්ධනය හා කාර්ය මණ්ඩල සංවර්ධනය

තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයේ තාක්ෂණික හා මෙහෙයුම් කාර්ය සහ සයිබර් ආරක්ෂණ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ පුහුණු සහ සංවර්ධන වැඩසටහන් මෙම අංශය විසින් පවත්වන ලදී.

## ඉදිරි දර්ශනය

ඉදිරිය දෙස බලන විට, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්වකීය මූලික පද්ධතියේ සම්පූර්ණ ක්‍රියාත්මක කිරීම හරහා සිය ඩිජිටල් පරිවර්තන න්‍යාය පත්‍රය නොකඩවා පවත්වා ගෙන යනු ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, පරිපාලන වාණිජ්‍ය සඳහා වූ විද්‍යුත් දත්ත අන්තර් හුවමාරුව (EDIAC) ආශ්‍රිත නිර්දේශවල මගපෙන්වීම යටතේ කටයුතු කරමින් මධ්‍යගත තර්ජන අධීක්ෂණ, සිද්ධි ප්‍රතිචාර හැකියාවන් හා අවසන් ලක්ෂ්‍යය හඳුනා ගැනීම සහ ඊට ප්‍රතිචාර (EDR) විසඳුම් ලබා ගැනීම, තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණ (ITSM) රාමුව අනුගමනය කිරීම සහ මේවන විටත් ක්‍රියාත්මක යටිතල පහසුකම් නවීකරණය කිරීම යන කාර්යයන් වැඩි දියුණු කරනු පිණිස ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයට (NCSOC) සිය පද්ධති ප්‍රවේශනය කිරීම සඳහා සැලසුම් සම්පාදනය කරයි.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

# මූල්‍ය

## දළ විශ්ලේෂණය

සවිමත් මූල්‍ය පරිපාලනය, විචක්ෂණ අරමුදල් කළමනාකරණය සහ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා දැඩි ලෙස පිළිපැදීම තුළින් සාමාජිකයින්ගේ අරමුදල් සුරක්ෂිත කිරීමේ කර්තව්‍යය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය අංශයට පැවරී ඇත. නිවැරදි මූල්‍ය වාර්තාකරණය, ඵලදායී මුදල් ප්‍රවාහ කළමනාකරණය සහ සියලු මූල්‍ය වගකීම් හා බැඳීම් කාලානුරූපව පියවීම සහතික කිරීම මගින් මණ්ඩලයට සහාය දැක්වීමෙහිලා ප්‍රධාන කාර්ය භාරයක් මූල්‍ය අංශය ඉටු කරයි.

## සංවිධාන ව්‍යුහය

මූල්‍ය අංශය විශේෂිත ක්‍රියාකාරී ඒකක හතරක් හරහා ක්‍රියාත්මක වන අතර, ඒ සෑම ඒකකයක්ම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි මූල්‍ය වගකීම් ඵලදායී ලෙස ඉටු කරනු පිණිස දායක වේ :

- ආදායම් ඒකකය
- ගෙවීම් ඒකකය
- පොදු ලෙජර් ඒකකය
- අනුකූලතා සහ ආයතනික වාර්තාකරණ ඒකකය

මෙම ඒකක සියල්ල එක්ව කටයුතු අරමින්, මණ්ඩලයේ මූල්‍ය මෙහෙයුම්වල අඛණ්ඩතාව, විනිවිදභාවය සහ විශ්වසනීයත්වය රැකෙන බවට වගබලා ගනියි.

## මෙහෙයුම් කාර්ය සාධනය

කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් පැන නැගි මෙහෙයුම් අභියෝග මධ්‍යයේ වුව ද, සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය අංශය සිය මූලික වගකීම් සාර්ථක ලෙස අඛණ්ඩව ඉටු කළේ ය. සියලුම කාර්යයන් මූල්‍ය රෙගුලාසි, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ / ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS) සහ අදාළ රජයේ චක්‍රලේඛවලට අනුකූලව සිදු කරන ලද අතර එමගින් වගකීම් සහ මූල්‍ය විනය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගෙන යනු ලැබිණි.

## මූල්‍ය අංශයේ ප්‍රධාන කර්තව්‍යයන්

### මූල්‍ය ගිණුම් පිළියෙළ කිරීම

ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව සියලුම මූල්‍ය ගනුදෙනු නිවැරදිව සටහන් කර වාර්තා කිරීම සහතික කරමින් මාසික හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීම සම්බන්ධයෙන් වන වගකීම මූල්‍ය අංශය උසුලන්නේ ය.

### වාර්ෂික අය වැය කළමනාකරණය

මූල්‍ය සම්පත් ප්‍රශස්තව හා කාර්යක්ෂමව වෙන් කර දීම සහතික කිරීම සඳහා ආදායම් සහ වියදම් පුරෝකථනය කිරීම ඇතුළුව වාර්ෂික අයවැය සැකසීම, එය අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම මූල්‍ය අංශය විසින් භාරගනු ලැබ තිබේ.

### ගෙවීම් කළමනාකරණය

පවත්නා මූල්‍ය රෙගුලාසිවලට පූර්ණ අනුකූල වීම සහතික කරන අතරම, රජයේ බදු පියවීම ඇතුළුව කාර්ය මණ්ඩලයට සහ බාහිර පාර්ශවකරුවන්ට ගෙවීම් කිරීම කළමනාකරණය කිරීම සහ එය ක්‍රියාවට නැංවීම මෙම අංශය මගින් සිදු කරයි.

## රජයේ විගණනය සම්බන්ධීකරණය

විගණන අවශ්‍යතා සහ නිර්දේශවලට අනුකූල වීම සහතික කරමින්, කාලෝචිත සහ නිවැරදි මූල්‍ය තොරතුරු සැපයීම මගින් රජයේ විගණන කාර්යයන් සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම මූල්‍ය අංශය ඉටු කරයි.

ආයතනික සැලැස්ම පිළියෙළ කිරීම කෙරෙහි දායකත්වය මූල්‍ය අංශය, ආයතනයේ උපාය මාර්ගික දිශානතිය සහ දිගු කාලීන අරමුණු සඳහා සහය වන මූල්‍ය දෘෂ්ටි බුද්ධිය සහ ප්‍රක්ෂේපන ලබා දෙමින් එහි ආයතනික සැලැස්ම සකස් කිරීමට දායක වේ.

## කළමනාකරණ තොරතුරු වාර්තාකරණය

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ කාලෝචිත අවබෝධයක් ලබා දෙන සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් දැනුවත් තීරණ ගනු ලැබීමට සහාය වන ආකාරයේ විස්තීරණ කළමනාකරණ තොරතුරු වාර්තා මූල්‍ය අංශය පිළියෙළ කරයි.

## ජයග්‍රහණ සහ පිළිගැනීමට ලක්වීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ

රාජ්‍ය අංශ සාඛාව විසින් සංවිධානය කරන ලද 2024 වාර්ෂික වාර්තා සම්මාන තරගයට ඉදිරිපත් කෙරිණි. සම්මාන උළෙල 2026 පෙබරවාරි මස 5 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

රාජ්‍ය අංශයට අයත් ආයතන 260 කින් සමන්විත ඉහළ තරගකාරී පරිසරයක් තුළ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අඛණ්ඩව හත්වන වසර සඳහා ද සුවිශේෂී පිළිගැනීමකට පාත්‍ර වෙමින් පහත සඳහන් ඇගයීම් හා සම්මාන ලබා ගැනීමට සමත් විය :

- සමස්ත ජයග්‍රාහක - ස්වර්ණ සම්මානය
- ව්‍යවස්ථාපිත මණ්ඩල, නීතිගත සංස්ථා හා අධිකාරී කාණ්ඩය යටතේ ස්වර්ණ සම්මානය

සම්මාන උළෙලට සහභාගි වූ ආයතන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, විශ්වවිද්‍යාල, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා, විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති, සහ වාණිජ නොවන ව්‍යවස්ථාපිත මණ්ඩල සහ අරමුදල් ඇතුළු රාජ්‍ය අංශයේ පුළුල් පරාසයක් නියෝජනය කළේ ය.

විනිවිදභාවය, වගවීම, සමාජ වගකීම, ආයතනික පාලනය සහ ආයතනික වාර්තාකරණය සහ මූල්‍ය හෙළිදරව් කිරීම යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයේ ඉහළම ප්‍රමිතීන් සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි අඛණ්ඩ කැපවීම මෙම සම්මාන මගින් පිළිගැනීමට පාත්‍ර වී හඳුනා ගැනීමට ලක් විය.









## නීති අංශය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ නීති අංශය එහි නීතිමය කර්තව්‍යයන් සඳහා උපදේශක සහ නියෝජන සේවා සපයයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) හරහා පරිපාලනය වන නීති අංශය මණ්ඩලයේ සභාපතිවරයාගේ / ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. උපදේශක සේවා සහ මෙහෙයුම්මී නීතිමය ප්‍රතිදාන යන කාර්යද්වයම ඵලදායී ලෙස ලබා දීම සහතික කරමින් වෘත්තීය සුදුසුකම් ලත් නීති නිලධාරීන්ගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් නීති අංශය සමන්විත වේ.

නීති අංශය එහි නෛතික තත්ත්වය ඵලදායී ලෙස නිරූපණය කර ආරක්ෂා කර ඇති බව සහතික කරමින් මණ්ඩලයේ අධිකරණ හා අර්ධ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් මණ්ඩලය නියෝජනය කරයි. අභියාචනා, ලිඛිත සැලකිරීම්, දිවුරුම් ප්‍රකාශ සහ වෙනත් නීතිමය ලිපි ලේඛන සකස් කිරීම මෙන්ම නඩු පැවරීමේ උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීමේ කාර්යය ද මෙයට ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන්, ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්ථාවරය අඛණ්ඩව සහ වෘත්තීයමය වශයෙන් ගරු අධිකරණය සහ විනිශ්චය සභා ඉදිරියේ නියෝජනය වන බව සහතික කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවක දීම නීති අංශය නීතිපති දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් කටයුතු කරයි.

මණ්ඩලයේ ව්‍යවස්ථාපිත විධි නියෝග ඉදිරියට ගෙන යාම අරබයා, දායක මුදල් පැහැර හරින සේවා යෝජකයන්ට එරෙහිව නීති බලාත්මක කිරීමේ සහ මුදල් ප්‍රතිසාධනය කර ගැනීමේ ක්‍රියාමාර්ග විෂයයෙහි නීති අංශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එවැනි පරිපාටිකර 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවලට අනුකූල වන අතර එහි 28 වන වගන්තිය ද අදාළ අවස්ථාවන්හි දී ඊට ඇතුළත් කෙරේ. කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

සඳහා, විමධ්‍යගත ප්‍රාදේශීය කාර්යාල හරහා දායක මුදල් ප්‍රතිසාධනය කර ගැනීමේ ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු ලබන අතර, ව්‍යවස්ථාපිත ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම සහ නඩු කටයුතුවල සංගත භාවය සහ කාලානුරූපී ප්‍රගතිය සහතික කරනු පිණිස මධ්‍යම නීති අංශය සමඟ ඒ ඒ නීති නිලධාරීන් විසින් අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා ගනු ලබනවා ඇත.

ගිවිස්නා සහ අවබෝධතා ගිවිසුම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සඳහා අත්‍යවශ්‍ය නෛතික ලිපි ලේඛන, ඒවා නීත්‍යානුකූලව උචිතව පවත්නා බවට සහ ආයතනික අරමුණු සමඟ සමපාතව ඇති බවට වගබලා ගනිමින්, කෙටුම්පත් කිරීමේ හා සමාලෝචනය කිරීමේ කාර්යය නීති අංශය හරහා ඉටුවේ. තවද, එය අභ්‍යන්තර සහ බාහිර යන දෙපාර්ශවයන්ටම අඛණ්ඩ මග පෙන්වීමක් සපයයි. නීතිමය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ අනුකූලතා මාර්ගෝපදේශ නිකුත් කිරීම හරහා, නීති අංශය මණ්ඩලයේ ආයතනික ධාරිතාව වැඩි දියුණු කරන අතර ව්‍යවස්ථාපිත වගකීම් පිළිපැදීම ප්‍රවර්ධනය කර, කාර්ය පටිපාටික දුර්වලතා ද අවම කරයි. තවද, එමගින් ආයතනයේ සමස්ත කාර්යක්ෂමතාව ද සවිමත් බවට පත් වේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා නීති අංශය ප්‍රමුඛ කර්තව්‍යයක් ඉටු කරයි. නීති උපදෙස්, නියෝජනය, බලාත්මක කිරීමේ සහාය, ලේඛනකරණය සහ නෛතික සංවර්ධනය සඳහා එහි විස්තීර්ණ නියැලීම හරහා, නීති අංශය සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් සහ ව්‍යවස්ථාපිත බැඳීම් සමඟ සේවායෝජකයාගේ අනුකූලතාවය ප්‍රවර්ධනය කරමින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ශක්තිමත් නීතිමය රාමුවක් තුළ ක්‍රියාත්මක වන බවට වගබලා ගනියි.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය යනු කළමනාකරණය වෙත සලසා දෙන සේවාවක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මෙහෙයුම් විධිමත් කිරීම සඳහා පවත්නා ස්වාධීන හා අපක්ෂපාතී වූ ද, විෂය මූලික සහතිකායනය හා උපදේශකත්වය ලබා දෙන්නා වූ ද කාර්ය කර්තව්‍යාවලියකි. මණ්ඩලයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රමවත් හා විනය ගරුක ප්‍රවේශයක් තුළින් අවදානම් කළමනාකරණය, පාලන සහ පාලන ක්‍රියාවලීන්හි ඵලදායිතාව ඇගයීමට ලක් කිරීම සහ වැඩි දියුණු කිරීම මෙහි මූලික කාර්ය භාරය වේ. සමාජික දායක මුදල් නිසි පරිදි එකතු කිරීම, ප්‍රතිලාභ ගෙවීම් කඩිනම් කිරීම, වත්කම් ආරක්ෂා කිරීම සහ ආයෝජන ක්‍රියාවලියේ විනිවිදභාවය තහවුරු කිරීම කෙරෙහි මෙහිලා විශේෂ අවධානයක් යොමු කෙරේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ශක්තිමත් භාවය තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් අඛණ්ඩව ඇගයීම් සිදු කරනු ලබයි. මෙහිදී, මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය හා වත්කම් ආරක්ෂා කිරීම, ව්‍යවස්ථාපිත නීති රීති හා රෙගුලාසිවලට අනුකූල වීම සහ වංචා හා දූෂණ වැළැක්වීම සඳහා වන පාලන ක්‍රමවේදයන්හි කාර්යක්ෂමතාවය විමර්ශනයට හසු කෙරේ. විශේෂයෙන්ම, සාමාජිකයන්ගේ අරමුදල් සුරක්ෂිත කිරීම හා උපරිම ප්‍රතිලාභ ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ආයෝජන ප්‍රතිපත්ති මණ්ඩලයේ අනුමත කාර්ය පටිපාටීන්ට අනුකූලව සිදු වන්නේ ද යන්න මෙහිදී ඉතා ප්‍රමුඛව නිරීක්ෂණය කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශය සෘජුවම විගණන කමිටුව වෙත වගකීමට බැඳී සිටින අතර, එහි ස්වාධීනත්වය සුරැකීම සඳහා පරිපාලනමය වශයෙන් සභාපතිවරයා/ සාමාන්‍යාධිකාරිවරයා වෙත වාර්තා කර සිටිනු ලැබේ. අංශ ප්‍රධානියා ලෙස කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන) යටතේ ක්‍රියාත්මක වන මෙම කොට්ඨාසය, ඒ ඒ වාර්ෂික විගණන කාර්යයන් සැලැස්මකට අනුව පිළියෙළ කර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සියලුම අංශ සහ ප්‍රාදේශිය කාර්යාල ආවරණය වන පරිදි පරීක්ෂණ පවත්වා, එමගින් හඳුනාගනු ලබන දුර්වලතා මගහරවා ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ නිර්දේශ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කර සිටී.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 2025 දෙසැම්බර් 31 දිනට



### සෝමසිරි ඒකනායක මහතා

සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

සෝමසිරි ඒකනායක මහතා, දශක දෙකකට වැඩි කාලයක් උපාය මාර්ගික සැලසුම් සම්පාදනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ජාතික සංවර්ධන මුලපිරීම්හි පළපුරුද්ද සහිත රාජ්‍ය අංශයේ සේවයේ නිරත නිපුණත්වයෙන් හෙබි අධි වෘත්තිකයෙකු වේ. ඔහු වර්තමානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි. තම රාජ්‍ය සේවා ජීවිතය තුළ ඒ මහතා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂ සහ රන්මිනිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යන තනතුරු ඇතුළු ප්‍රමුඛ තනතුරුවල කටයුතු කරමින් රාජ්‍ය ආයතන කීපයකම වැදගත් කාර්යභාරයක් ඉටුකර තිබේ. එමෙන්ම, සෝමසිරි ඒකනායක මහතා, ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව, ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාලය, සංස්කෘතික හා ජාතික උරුම අමාත්‍යාංශය, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කම්කරු දෙපාර්තමේන්තුව යනාදී රාජ්‍යායතනවලට ද ඔහු සිය සේවය දායක කර ඇත.

ඒකනායක මහතා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය ද, කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ ආචාර්ය උපාධිය ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍යවේදය පිළිබඳ ආචාර්ය උපාධිය ද ලබා සිටී. පාලනතන්ත්‍රය, නායකත්වය සහ ප්‍රතිපත්ති සෑදීම යන ක්ෂේත්‍ර ආශ්‍රිත ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට ද ඒ මහතා සහභාගි වී ඇත. බුද්ධ නායකත්ව ගුණාංග හෙබි ඒකනායක මහතාගේ දැක්ම වනුයේ, නවෝත්පාදක උපායමාර්ග සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් තිරසාර වර්ධනය සහ ජාතික ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීමයි.



### ඉන්දික බද්දෙවිතාන මහතා

අධ්‍යක්ෂ
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

ඉන්දික බද්දෙවිතාන මහතා වසර 17 කට වඩා අධික කාලයක් තිස්සේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරන බදු පරිපාලන ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද හිමි කෘතහස්ත වෘත්තිකයෙකු වේ. වර්තමානයෙහි ඔහු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමිසාරිස්වරයෙකු ලෙස කටයුතු කරයි. ඔහුගේ වෘත්තිය ජීවිතය විවිධ භූමිකා පරාසයක පැතිර යන අතර, සුරා බදු පරීක්ෂකවරයෙකු ලෙස සුරා බදු දෙපාර්තමේන්තුවේ අට වසරක ඔහුගේ සේවය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ තාවකාලික සහකාර කතිකාචාර්යවරයකු ලෙස කටයුතු කළ ඔහුගේ කෙටි ධූර කාලය ද ඊට ඇතුළත් වේ. බදු ප්‍රතිපත්ති, ආදායම් පරිපාලනය, නීති ක්‍රියාපරිපාටි හා කාර්යාල කළමනාකරණය පිළිබඳ ඔහු සතු සවිමත් පදනම සහිතව, බදුකරණය සහ පාලනය යන ක්ෂේත්‍ර විෂයයෙහි ඔහු ලබා දී ඇති සේවා දායකත්වය අතිශය වැදගත් ය.

බද්දෙවිතාන මහතා, කැලණිය විශ්වවිද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ (ගෞරව) උපාධියක් ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීති උපාධියක් (LL.B) සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත. සිය වෘත්තීය සංවර්ධනයේ පියවර ලෙස, ඔහු ඉන්දියාවේ බදු ප්‍රතිපත්ති පිළිබඳව සහ මැලේසියාවේ විද්‍යුත් රාජ්‍ය හා වෙනස්කම් කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබා ඇත. තවද, නීතික නඩු තීරණ නීතිය, අධිකරණ පරිපාටි සහ කාර්යාල පරිපාලනය පිළිබඳ දේශීය වශයෙන් පුහුණුව ද ඔහු ලබා ඇත. බදු අනුකූලතාව, ආදායම් එකතු කිරීම සහ නීතිමය කාර්යරාමු ආශ්‍රිත ක්ෂේත්‍රයේ ඔහුගේ ප්‍රගුණතාව, ජාතික මූල්‍ය පරිපාලනය කෙරෙහි විශිෂ්ට අනුබලයක් අඛණ්ඩව සලසයි.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු



## එස්.එෆ්.එච්. ප්‍රනාන්දු මහතා

අධ්‍යක්ෂ
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

සුසන්ත ප්‍රනාන්දු මහතා වෘත්තියමය වශයෙන් කීර්තිමත් ගණකාධිකාරියෙකු වන අතර, ශ්‍රී ලංකාවේ සහ එක්සත් රාජධානිය හා ඔස්ට්‍රලියාව යන විදේශ රටවල පුද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයේම ජ්‍යෙෂ්ඨ තනතුරු ගණනාවකම පදවි දරා ඇත. ඔහු, ප්‍රසිද්ධ ලයිස්තුගත සමාගමක් වන බාර්ට්ලීට් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ (Bartleet Finance Ltd.) ආරම්භක කළමනාකාර අධ්‍යක්ෂවරයා වූ අතර බාර්ට්ලීට් මැලෝරි ස්ටොක්බ්‍රෝකර්ස් ලිමිටඩ් (Bartleet Mallory Stockbrokers Ltd.), බාර්ට්ලීට් ඇන්ඩ් කම්පනි ලිමිටඩ් (Bartleet and Company Ltd.) හා බාර්ට්ලීට් ට්‍රාන්ස්කැපිටල් ලිමිටඩ් (Bartleet Transcapital Ltd.) ඇතුළු බාර්ට්ලීට් සමූහයෙහි අනුබද්ධ සමාගම් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය. ඒ මහතා සංස්ථාපිත ආයතනික ක්ෂේත්‍රයට ලබා දුන් දායකත්වයට අමතරව, ඔහු රටේ විශේෂ ජාතික ආයතන කිහිපයක ප්‍රමුඛත්ව තනතුරුවල ද කටයුතු කළේය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ඇති ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (Jaya Container Terminals Ltd.) යන ආයතනයන්හි සභාපතිවරයා ලෙස ද ඒ මහතා සේවය කළේ ය. ශ්‍රී ලංකා සම්මන්ත්‍රණ කාර්යාංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද, සංචාරක අමාත්‍යතුමාගේ උපදේශකයෙකු ලෙස ද සුසන්ත ප්‍රනාන්දු මහතා කටයුතු කර තිබේ. ඔහුගේ ජාත්‍යන්තර අත්දැකීම් අතරට, ඔස්ට්‍රේලියාවේ බී ඩී එස් (BDS Corporation) ආයතනයේ මූල්‍ය පාලකවරයා ලෙස සහ එක්සත් රාජධානියේ ඉක්ටොහේටිං ගෲප් ඔෆ් කම්පනීස් (Ictrohating Group of Companies) ආයතනයෙහි සමූහ ගණකාධිකාරිවරයා ලෙස කටයුතු කිරීම ඇතුළත් වේ. තවද, ඔහු ජාතික කම්කරු උපදේශක කමිටුවේ (NLAC) සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කර ඇති අතර කළුතර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපතිවරයා වශයෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයට ද වටිනා දායකත්වයක් සලසා දී ඇත.



## අතුල හරිස්චන්ද්‍ර මහතා

අධ්‍යක්ෂ
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

අතුල හරිශ්චන්ද්‍ර මහතා වසර 20 කට වඩා දීර්ඝ පුළුල් වෘත්තිය පළපුරුද්දක් සහිත, බැංකු ක්ෂේත්‍රයෙහි විශේෂඥත්වය සතු ප්‍රකට වෘත්තිකයෙකු වේ. ඔහු මූල්‍ය වෙළඳපොළ සහ ව්‍යවසායක අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රවල දැක්වූ ප්‍රබල නායකත්වය මඟින් විශිෂ්ට සේවයක් ඉටු කර ඇත. වර්තමානයෙහි ඔහු ශ්‍රී ලංකාවේ කීර්තිමත් විදේශීය බැංකුවක ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයා ලෙස කටයුතු කරයි.

ඔහු, මූල්‍ය වෙළඳපොළ, භාණ්ඩාගාර අවදානම, වෙළඳ අවදානම සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍ර පිළිබඳව සවිමත් පසුබිමක් සහිත, අත්දැකීම් පිරිපුන් වෘත්තීයවේදියෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (Masters of Financial Economics - MFE) උපාධියක් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී ගෞරව උපාධියක් (Bachelor of Arts - Honors) ලබා සිටී. එසේම, ඊට අමතරව, අතුල හරිශ්චන්ද්‍ර මහතා අන්තර්ජාතික වෘත්තීය සුදුසුකම් කීපයක් ද ලබා ඇති අතර එහිලා, මූල්‍ය වෙළෙඳපළ මෙහෙයුම් (ප්‍රංශය) පිළිබඳ ඒ සී අයි සහතිකය ද (ACI Operations Certificate in Financial Market Operations), නිෂ්පාදන හා වෙළෙඳපළ අවදානම් පිළිබඳ කීස්ඩී ආවසරික (ඇමරිකාව) සහතිකය ද (KESDEE Intermediate Certificate in Products) Market Risk), ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත කළමනාකරණ ඩිප්ලෝමාව ද (Diploma in Database Management (CBSL) ඇතුලත් වේ. විශ්ලේෂණාත්මක චින්තන චර්යාව සහ ගැටලු විසඳීමේ හැකියාව සම්බන්ධයෙන් හසළ දැනුමක් සහිත අතුල හරිශ්චන්ද්‍ර මහතා, වෘත්තියමය සහ ආචාරාත්මකභාවය පිළිබඳ උසස්ම ප්‍රමිති පවත්වා ගන්නා අතරම ආයතනීය සාර්ථකත්වය ඉදිරියට ගෙනයාම සඳහා කැපවී කටයුතු කරන්නෙකු වේ.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 2025 දෙසැම්බර් 31 දිනට





### ඉන්දික ප්‍රේමරත්න මහතා

අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත

### කේ.ඒ.පී. ද සිල්වා මහත්මිය

අධ්‍යක්ෂ
වෙළඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි.

සාර්ව ආර්ථික සැලසුම්කරණය, රාජ්‍ය ආයෝජනය සහ විදේශ සම්පත් කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් සම්භාරයක් හිමි ඉන්දික ප්‍රේමරත්න මහතා, රාජ්‍ය අංශයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ වෘත්තීයවේදියෙකු වේ. ඔහු වර්තමානයෙහි ජාතික සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුවේ සාර්ව ආර්ථික සැලසුම්කරණ අංශයේ ද, කර්මාන්ත, වෙළඳ හා ආයෝජන අංශයේ ද අධ්‍යක්ෂවරයා ලෙස සේවා කටයුතු ඉටු කරයි.

දශක දෙකකට අධික කාලයක් රාජ්‍ය සේවයේ රාජකාරි කටයුතුවල නියැලි ප්‍රේමරත්න මහතා, මුදල් අමාත්‍යාංශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව යන ආයතන තුළ ප්‍රධාන තනතුරු හොබවා ඇති අතර, එහි දී, ඒ මහතා, ජාත්‍යන්තර හවුල්කාර පාර්ශවයන් සමඟ සංවර්ධන අරමුදල් සම්බන්ධයෙන් සාකච්ඡා කර, ඒවායේ කාර්ය සංවිධාන කටයුතු ඉටු කිරීමෙහිලා ප්‍රමුඛ භූමිකාවක් ඉටු කර ඇත. විදේශ අරමුදල් සැපයෙන ප්‍රධාන පෙළේ ව්‍යාපෘති කටයුතු සුපරීක්ෂණය කර ඇති ප්‍රේමරත්න මහතා, රජය සතු ව්‍යවසාය සඳහා වූ උපාය මාර්ගික අධීක්ෂණය සලසා දී ඇත.

ඔහු, ඔස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලන (ප්‍රතිපත්ති) විෂය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යා විෂයය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, ජපානයේ අයි.ඩී.ඊ. උසස් පාසැලේ (IDE Advanced School) සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද හිමිකර ගෙන ඇත. තවද, ඒ මහතා, කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ලබා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණය, මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය යන විෂයයන් පිළිබඳව විශේෂ පුහුණු පාඨමාලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලී ක්වාන් යූ රාජ්‍ය ප්‍රතිපත්ති පාසැල (Lee Kuan Yew School of Public Policy) යනාදී ආයතනවල හදාරා නිම කර ඇත.

ප්‍රේමරත්න මහතා, මධ්‍යම සංස්කෘතික අරමුදල ඇතුළු ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල ගණනාවකම සේවය කර ඇත. රාජ්‍ය අංශය හා එක්වීමට පෙර, ඔහු ප්‍රසිද්ධ සමාගමක කළමනාකරණ අභ්‍යාසලාභී / නිෂ්පාදන විධායක නිලධාරි ලෙස සේවය කර පුද්ගලික අංශයේ සේවා පළපුරුද්ද ද ලබා ඇත.

ද සිල්වා මහත්මිය කැලණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධියක් ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඇයට ශ්‍රී ලංකා වරලත් මූල්‍ය ගණකාධිකාරී ආයතනයෙන් ලබා ගත් සුදුසුකම් (CPFA) ඇත. ඇය වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ලෙස ද, සී. බබිලිව්. ඊ. කොන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරින් ප්‍රයිවේට් ලිමිටඩ් ආයතනයෙහි සභාපතිනිය ලෙස ද වර්තමානයේ කටයුතු කරන්නී ය. ඇය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ද, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ද ප්‍රධාන ගණකාධිකාරීවරිය ලෙස කටයුතු කළා ය. ද සිල්වා මහත්මිය, වී අලෙවි මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් ලෙස සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම්වරිය - මූල්‍ය ලෙස ද සේවා කටයුතු ඉටු කර ඇත.

සේවයට කැපවී ක්‍රියා කරන ප්‍රතිපත්ති සැලසුම්කරුවකු වන ඉන්දික ප්‍රේමරත්න මහතා, උපාය මාර්ගික රාජ්‍ය ආයෝජනය සහ මූල්‍ය පාලනය යන ක්ෂේත්‍ර හරහා ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සංවර්ධන සැලසුම්කරණය උදෙසා නොකඩවා දායකත්වය සලසා දීමෙහි නිරතව සිටියි.

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු



## ඩිනාල් පීරිස් මහතා

අධ්‍යක්ෂ
ලංකා සේවා සම්මේලනයේ නියෝජිත



## චන්න දිසානායක මහතා

අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

ඩිනාල් පීරිස් මහතා, ව්‍යාපාරික ක්ෂේත්‍රයෙහි වසර ගණනාවක පළපුරුද්දක් ඇති, විශේෂයෙන්ම ඇලුමිනියම්, වානේ, එම්.ඩී.එෆ්. පුවරු, ගොඩනැගිලි ද්‍රව්‍ය, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදනය යනාදී කර්මාන්ත ක්ෂේත්‍ර ආශ්‍රිත පුළුල් වෙළෙඳ සමාගම් කිහිපයකට සම්බන්ධ වූ නිපුණ ව්‍යාපාරිකයෙකු වේ. ඔහු වෘත්තියමය වශයෙන් ඉංජිනේරුවෙකු වන අතර, ලන්ඩන් ව්‍යාපාර විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් ද ලබාගෙන ඇත. ඔහු රාජ්‍ය සහ පුද්ගලික සමාගම් කීපයක සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කරයි. ඩිනාල් පීරිස් මහතා මානව සම්පත පිළිබඳ සුවිශේෂ උනන්දුවක් දක්වන අයෙකු වන අතර, ඔහු ලංකා සේවා සම්මේලනයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස ද සේවය කරයි.

චන්න දිසානායක මහතා වසර ගණනාවක් පුරා බැංකු ක්ෂේත්‍රයේ සේවයේ නිරත පළපුරුදු බැංකු නිලධාරියෙකු වන අතර, බැංකු සේවකයින්ගේ අයිතිවාසිකම් සහ සුබසාධනය සඳහා කැපවී ක්‍රියා කරන වෘත්තිය සංගම් නායකයකු ලෙස ප්‍රකට ය. ඔහු වර්තමානයෙහි ලංකා බැංකු සේවක සංගමයේ සභාපතිවරයා ලෙස කටයුතු කරමින්, බැංකු ක්ෂේත්‍රය තුළ සාධාරණ ශ්‍රම ක්‍රියාකාරකම් සහ සේවක ප්‍රතිලාභ වෙනුවෙන් උර දෙමින් ප්‍රමුඛ කර්තව්‍යයක් ඉටු කරයි. එමෙන්ම, ඔහු, යුනි ග්ලෝබල් යුනියන් (UNI Global Union) සංවිධානය යටතේ ක්‍රියාත්මක වන යුනි ශ්‍රී ලංකා ලයිසන්ස් කවුන්සිල් (UNI Sri Lanka License Council) සභාවෙහි සභාපතිවරයා ලෙස ද සේවය කරන අතර, ශ්‍රී ලංකාවේ සේවක සේවිකාවන් වෙනුවෙන් ජාත්‍යන්තර වේදිකා නියෝජනය කරමින්, ගෝලීය ශ්‍රම ප්‍රමිතීන් සහ සේවක අයිතිවාසිකම් රැකීම සඳහා ඇප කැප වී සිටියි. චන්න දිසානායක මහතා ජාතික කම්කරු උපදේශක කවුන්සිලයේ (NLAC) සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි. ඒ තුළ ඔහු ප්‍රතිපත්ති සාදන්නන් හා පාර්ශවකරුවන් සමඟ සහයෝගීව කටයුතු කරමින් නොයෙකුත් ශ්‍රම ප්‍රතිපත්ති මෙන්ම විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර ආශ්‍රිත සුමට සේවාවැඩ කොන්දේසි හඳුන්වා දීමට ක්‍රියා කර ඇත. බැංකු ක්ෂේත්‍රය සහ ශ්‍රම සබඳතා පිළිබඳ ඔහු සතු අත්දැකීම් මගින් ශ්‍රී ලංකාවේ සේවක අයිතීන් සහ සාධාරණ සේවාස්ථාන පරිසරයක් වර්ධනය කිරීම සඳහා ඔහු දරන අප්‍රතිහත කැපවීම බෙහෙවින් සුවිශාල ය.

# අධ්‍යක්ෂ මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට



**කණිෂ්ක ප්‍රේමශාන්ත මහතා**
අධ්‍යක්ෂ
වෘත්තිය සමිති නියෝජිත

කණිෂ්ක ප්‍රේමශාන්ත මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ (විශේෂ) විද්‍යාවේදී උපාධියක් ලබා සිටින වෘත්තීයවේදියෙකි. ශ්‍රමික අයිතීන් සඳහා කැප වී කටයුතු කරන ප්‍රමුඛයෙකු වන ඔහු, වර්තමානයෙහි ලංකාවේ ප්‍රමුඛතම වෘත්තිය සංගමයක් වන, සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඇප කැප වූ ආයතනයක් වන අන්තර් සමාගම් සේවක සංගමයේ උප සභාපතිවරයා ලෙස කටයුතු කරයි. ශ්‍රම අයිතීන් සඳහා ඔහුගෙන් පිළිබිඹු වන නායකත්වය සහ අත්දැකීම්, ජාතික සීමා මායිම් ඉක්මවා යයි. ඔහු විශ්ව වෘත්තිය සංගම් සම්මේලනයේ සාමාජිකයෙකු ලෙස ද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කලාපීය සහ ජාත්‍යන්තර මණ්ඩපවල ද කාර්යභාරයක් ඉටු කර ඇත. පසුගිය දෙවසර තුළ, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ සමස්ත චීන වෘත්තීය සමිති සම්මේලනය (ACFTU) විසින් සංවිධානය කරන ලද ප්‍රධාන වෘත්තිය සමිති සාකච්ඡා සමුළුවලට ඒ මහතා ක්‍රියාකාරී ලෙස සහභාගිත්වය දරා ඇත.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම

## ඉහළ කළමනාකරණය



**සෝමසිරි ඒකනායක මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

සෝමසිරි ඒකනායක මහතා, දශක දෙකකට වැඩි කාලයක් උපායමාර්ගික සැලසුම් සම්පාදනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ජාතික සංවර්ධන මුලපිරීම්හි පළපුරුද්ද සහිත රාජ්‍ය අංශයේ සේවයේ නිරත නිපුණත්වයෙන් හෙබි අධි වෘත්තිකයෙකු වේ. ඔහු වර්තමානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි. තම රාජ්‍ය සේවා ජීවිතය තුළ ඒ මහතා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂ සහ රන්මිනිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යන තනතුරු ඇතුළු ප්‍රමුඛ තනතුරුවල කටයුතු කරමින් රාජ්‍ය ආයතන කීපයකම වැදගත් කාර්යභාරයක් ඉටුකර තිබේ. එමෙන්ම, සෝමසිරි ඒකනායක මහතා, ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව, ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාලය, සංස්කෘතික හා ජාතික උරුම අමාත්‍යාංශය, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කම්කරු දෙපාර්තමේන්තුව යනාදී රාජ්‍යායතනවලට ද ඔහු සිය සේවය දායක කර ඇත.

ඒකනායක මහතා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය ද, කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ ආචාර්ය උපාධිය ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍යවේදය පිළිබඳ ආචාර්ය උපාධිය ද ලබා සිටී. පාලනතන්ත්‍රය, නායකත්වය සහ ප්‍රතිපත්ති සෑදීම යන ක්ෂේත්‍ර ආශ්‍රිත ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට ද ඒ මහතා සහභාගි වී ඇත. බුද්ධ නායකත්ව ගුණාංග හෙබි ඒකනායක මහතාගේ දැක්ම වනුයේ, නවෝත්පාදක උපායමාර්ග සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් තිරසාර වර්ධනය සහ ජාතික ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීමයි.

# නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්



### කේ. එස්. වැලිවිට මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අභ්‍යන්තර විගණන)
(2025.08.02 දින විශ්‍රාමයන ලදි)

කේ. එස්. වැලිවිට මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ධූරය හොබවයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ද, ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ ද ආශ්‍රිය සාමාජිකයෙකි. මීට අමතරව, ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් මුදල් පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධියක් සහ ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයෙන් තොරතුරු පද්ධති ආරක්ෂණය සහ පාලන විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. පෞද්ගලික සහ රාජ්‍ය ආයතන යන ද්වයෙහිම මූල්‍ය හා විගණනය පිළිබඳ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති වැලිවිට මහතා ඔහු තෝරාගත් ක්ෂේත්‍රයේ කෘතහස්ත විධායක නිලධාරියෙකි.



### එම්. ඒ. කේ. අලුත්ගමගේ මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ආයෝජන)

එම්. ඒ. කේ. අලුත්ගමගේ මහතා වර්තමානයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) ලෙස සේවා කටයුතු ඉටු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් සහ කැලණිය විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අලුත්ගමගේ මහතා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කේන්ද්‍රීය ක්ෂේත්‍රයක් අධීක්ෂණය කරන නිලධරයෙකි.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු



**ඩබ්ලිව්. ජී. කේ. රත්නායක මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සාමාජික සේවා)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) ඩබ්ලිව්.ජී.කේ රත්නායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය යන දෙකෙහිම ආශ්‍රිත සාමාජිකයෙකි. ඊට අමතරව, ඔහු තම තනතුරට සුවිශේෂී අගයක් එකතු කර දෙමින් එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ II වන අදියර සඳහා ද අර්ධ වශයෙන් සුදුසුකම් ලබා ඇත.



**එච්. එම්. ඒ. ජයන්ත කුමාර මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)

එච්. එම්. ඒ. ජයන්ත කුමාර මහතා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා සම්බන්ධ නීතිමය කටයුතු ඉටු කරමින් දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) තනතුරෙහි සේවය කරයි. ඒ මහතා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය (ගෞරව) සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් නීතිපති උපාධියක් ද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ද ලබා ඇත. ජයන්ත කුමාර මහතා, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු, නොතාරිස්වරයෙකු සහ දිවුරුම් කොමසාරිස්වරයෙකු ද වේ. ඔහු සමාගම් ලේකම්වරයෙකු ලෙස ද ලියාපදිංචිය ලබා ඇත.



**කේ. ඩී. ඒ. පී. කරුණාරත්න මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල්)

කේ. ඩී. ඒ. පී. කරුණාරත්න මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර දරමින් සේවය කරන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ලෙස උසස් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දරයි. ඒ මහතා, මූල්‍ය හා ගිණුම්කරණ ක්ෂේත්‍රය සඳහා තම හැකියාව සහ කැපවීම ද ප්‍රදර්ශනය කරමින් සිය රාජකාරි කටයුතු ඉටු කරයි. ඔහුගේ මහඟු සේවා සාමාජිකත්වය, ස්වකීය කර්මාන්තය තුළ වෘත්තීය නිපුණතා සහ සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වන ඔහුගේ කැපවීම අවධාරණය කරයි.

# නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්



**ආර්. ජේ. සී. එස්. සම්පත් ගුණවර්ධන මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පරිපාලන හා මානව සම්පත්)

ආර්. ජේ. සී. එස්. සම්පත් ගුණවර්ධන මහතා පරිපාලන හා මානව සම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කරයි. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. මීට අමතරව, ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සේවක අධ්‍යාපනය පිළිබඳ උපාධියක් ද ලබා ඇත. ගුණවර්ධන මහතා කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගනිමින් තම දක්ෂතාව තව දුරටත් ඉදිරියට ගෙන ගියේ ඔහු තමා සේවය කරන ආයතනයේ ප්‍රධාන අංශයකට මනාව ගැළපෙමෙනි.



**එස්. පී. ආර්. ඩී. ප්‍රනාන්දු මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(තොරතුරු තාක්ෂණ)

ප්‍රදීප් ප්‍රනාන්දු මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - තොරතුරු තාක්ෂණ ලෙස වර්තමානයෙහි සේවා කටයුතු ඉටු කරන අතර, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි වසර 19 කට වඩා වැඩි කාලයක පළපුරුද්දක් ලබා සිටින වෘත්තිකයෙකු වේ. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් මෘදුකාංග ඉංජිනේරු විෂය පිළිබඳව විශේෂ ප්‍රගුණතාව සහිත පරිගණක විද්‍යාවේදී උපාධිය සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ විද්‍යාපති උපාධිය යන උපාධිද්වයම ලබාගෙන ඇත.

ඔහු තම වෘත්තිය ජීවිතය පුරාවටම විශාල තාක්ෂණික පද්ධති කළමනාකරණය, ප්‍රමුඛ ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති ඉටු කිරීම සහ ක්‍රියාකාරි තොරතුරු ආරක්ෂාව සහතික කිරීම සම්බන්ධයෙන් ප්‍රබල කුසලතා විද්‍යාමාන කළේ ය. ඔහුගේ නායකත්වය සහ තාක්ෂණික විශේෂඥතාව, නවෝත්පාදනය නැංවීමටත්, මෙහෙයුම් විවර්ධනය කිරීමටත්, එමගින් ආයතනයේ සමස්ත ඉලක්ක සපුරා ගැනීම සඳහා සහය වීමටත් උපස්ථම්භක වී ඇත.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු



**එච්. ජී. ඩී. නිහාල් ප්‍රසන්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා) -රාජකාරී වැඩ ඉටුකිරීම

එච්. ජී. ඩී. නිහාල් ප්‍රසන්න මහතා, සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) තනතුරේ සේවය කරන අතර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා) තනතුරේද රාජකාරී වැඩ ඉටුකරනු ලබයි. ඔහු රුහුණු විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු චීනයේ වුහාන් නුවර හස්ට් (HUST) විශ්වවිද්‍යාලයේ උසස් මට්ටමේ වෘත්තීය වැඩසටහනක් සම්පූර්ණ කර ඇත. ඔහු සතු අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත කැපවීමෙන් යුතුව සේවය කිරීම සඳහා අමතර ශක්තියක් ඔහුට ලබා දෙයි.

# සහකාර සාමාන්‍යාධිකාරිවරුන්



## කේ. ජී. එන්. රත්නායක මහතා

**සහකාර සාමාන්‍යාධිකාරි**
(පරිපාලන හා මානව සම්පත්)

කේ. ජී. එන්. රත්නායක මහතා පරිපාලන හා මානව සම්පත් අධීක්ෂණ කටයුතු ඉටු කරමින් එහි සහකාර සාමාන්‍යාධිකාරිවරයා ලෙස ඉතා දක්ෂ ලෙස සේවය කරයි. ඔහු කැළණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති අතර පිරිස් කළමනාකරණ වරලත් ආයතනයේ ආශ්‍රිය සාමාජිකයෙකි.



## පී. එල්. එල්. සී. පී. අල්විස් මහත්මිය

**සහකාර සාමාන්‍යාධිකාරි**
(ක්‍රියාත්මක කිරීමේ කලාපය III)

පී. එල්. එල්. සී. පී. අල්විස් මහත්මිය, සහකාර සාමාන්‍යාධිකාරි (ක්‍රියාත්මක කිරීමේ කලාපය III) භාර නිලධාරිනිය ලෙස සේවය කරන්නී ය. ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් පළමු පන්තියේ ගෞරව සුදුසුකම් සහිතව විද්‍යාවේදී උපාධියක් ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ජෛව තාක්‍ෂණය පිළිබඳ විශේෂඥතාව සහිත විද්‍යාපති උපාධියක් ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. මීට අමතරව, ඇය ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාලේඛන ආයතනයේ ව්‍යවහාරික සංඛ්‍යාලේඛනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. දැනට, අල්විස් මහත්මිය සිය වෘත්තීය සුදුසුකම් පෙළට තව දුරටත් කෙරෙන එකතු කර ගැනීම් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධියක් ද හදාරමින් සිටින්නී ය.



## පුෂ්පරංග වීරසේකර මහතා

**සහකාර සාමාන්‍යාධිකාරි**
(තොරතුරු තාක්ෂණ)

පුෂ්පරංග වීරසේකර මහතා තම නම ඉදිරියේ සුදුසු සුදුසුකම් රාශියක් ලබා සිටින්නෙකි. ඔහු දැනට සහකාර සාමාන්‍යාධිකාරි (තොරතුරු තාක්ෂණ) ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥතාවක් සහිතව ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්ෂයර් විශ්වවිද්‍යාලයෙන් ලියාපදිංචි ඉංජිනේරු පරිගණක විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. වීරසේකර මහතා ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ ආශ්‍රිය සාමාජිකයෙකු වන අතර එක්සත් රාජධානියේ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ ද සාමාජිකයෙකි. ඒ මහතා, ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ ලියාපදිංචි ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ද පිළිගැනීමක් ලබා ඇත. තවද, ඔහු කෘතිම බුද්ධි පද්ධති වැඩසටහන පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ජාවා පරිගණක යෙදුම පිළිබඳ ඩිප්ලෝමාවක් ද සම්පූර්ණ කර ඇත.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු



## අනුර වික්‍රමසේකර මහතා

**සහකාර සාමාන්‍යාධිකාරී**
දායක මුදල් රැස්කිරීම් හා අධිභාර

අනුර වික්‍රමසේකර මහතා දායක මුදල් රැස්කිරීම් හා අධිභාර අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස සේවා කටයුතු ඉටු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂ කළමනාකරණවේදී විද්‍යා උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා සිටී. තව ද, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රතීතනය සහිත සහතික ලත් ව්‍යාපාර ගණකාධිකාරියෙකු ද වේ.



## ඩී. එම්. කේ. පී. ඒ. දසනායක මහතා

**සහකාර සාමාන්‍යාධිකාරී**
(වැ.බ.) - ක්‍රියාත්මක කිරීමේ කලාප 11

ඩී. එම්. කේ. පී. ඒ. දසනායක මහතා සහකාර සාමාන්‍යාධිකාරී (වැ.බ.) - ක්‍රියාත්මක කිරීමේ කලාප 11 ලෙස සේවා කටයුතු ඉටු කරනු ලබයි. ඔහු පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් කලා උපාධියක් සහ කාම්බෝජයේ IIC තාක්ෂණ විශ්ව විද්‍යාලයෙන් (IICUT) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MBA) ලබා ඇත.

ඔහු 1995.11.01 දින මණ්ඩලයේ සේවයට එක්වී ඇත.



## එම්. ඒ. චන්ද්‍රසේන මහතා

**සහකාර සාමාන්‍යාධිකාරී (වැ.ආවරන)**
ක්‍රියාත්මක කිරීමේ කලාප 1

එම්. ඒ. චන්ද්‍රසේන මහතා සහකාර සාමාන්‍යාධිකාරී (වැඩ. ආවරණ) - ක්‍රියාත්මක කිරීමේ කලාප 1 ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කලා උපාධියක් සහ NSBM විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් (MBS) ලබා ඇත.

ඔහු 1997.04.21 දින මණ්ඩලයේ සේවයට එක්වී ඇත.

# කළමනාකාරිත්ව කණ්ඩායම

## සංස්ථාපිත කාර්යාලය

### දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා

**කේ. එම්. ඩී. ඒ. යු. ගුණවර්ධන මහත්මිය**
මූල්‍ය කළමනාකරු (දායක මුදල් රැස්කිරීම්)

**ඒ විදානපතිරණ මහත්මිය**
කළමනාකරු (අධිභාර)

**එන්. සී. ඈපා මහත්මිය**
මූල්‍ය කළමනාකරු (දායක මුදල් රැස්කිරීම්)

**ඒ. ජේ. ආර්. අනුර මහතා**
කළමනාකරු
(ස්වයංරැකියා සහ සංක්‍රමික සේවා)

### සාමාජික සේවා

**එම්. රාහුෆ්ඩීන් මහතා**
කළමනාකරු (සාමාජික ගිණුම්)

**අයි. විජේතුංග මහත්මිය**
කළමනාකරු
(සාමාජික ගිණුම් - කුඩා කාණ්ඩය)

**එස්. ආර්. නන්දසීලි මහත්මිය**
කළමනාකරු (ප්‍රතිලාභ තීරණය කිරීම)

**එච්. කේ. කේ. පී. පුෂ්පකුමාර මහතා**
කළමනාකරු (ප්‍රතිලාභ)

### ආයෝජන

**එන්. ආර්. එන්. ප්‍රනාන්දු මහත්මිය**
මූල්‍ය කළමනාකරු

**එච්. එම්. සී. දමයන්ති මහත්මිය**
මූල්‍ය කළමනාකරු

**ඩබ්ලිව්. ඒ. ඒ. හංසමාලි මහත්මිය**
කළමනාකරු(ආයෝජන)

### මුදල් අංශය

**එම්. ඒ. වී. කුමුදිනි මහත්මිය**
මූල්‍ය කළමනාකරු (මුදල්)
(2026.02.28 දින විශ්‍රාම යන ලදි)

### අභ්‍යන්තර විගණන

**ඩී. එල්. සී. ඩී. කුමාර මහතා**
කළමනාකරු (අභ්‍යන්තර විගණන)

### පරිපාලන හා මානව සම්පත්

**බී. සරත් මහතා**
කළමනාකරු
(පරිපාලන හා මානව සම්පත්)
2026.01.02 දින විශ්‍රාම යන ලදි)

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

**පි. ඒ. අජන්ත මහතා**
කළමනාකරු
(පරිපාලන හා මානව සම්පත්) - වැඩ බලන

**ටි. එච්. සි. පි. කුමාර මහතා**
කළමනාකරු (ඵලදායිතා)

## තොරතුරු තාක්ෂණ

**බි. ඩි. වඩුගේ මහතා**
කළමනාකරු (තොරතුරු තාක්ෂණ)

**ඒ. එම්. ඩි. එල්. ද සිල්වා මහතා**
කළමනාකරු (පද්ධති පාලන)

## නීති

**එස්. ආර්. එස්. පුංචිහේවා මිය**
කළමනාකරු (නීති)

**එස්. පි. රාජපක්ෂ මිය**
කළමනාකරු (නීති)

**වි. එම්. ඒ. ජේ. ජයලංකා මිය**
කළමනාකරු (නීති)

# ප්‍රාදේශිය කළමනාකරුවන්

**එම්. ඒ. චන්ද්‍රසේන මහතා**
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ 1 - 7)

**කේ. එන්. අශෝක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ 8 -15)

**යු. එච්. එස් .රංජිත් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - නුවර එළිය

**එන්. කේ. යු. කේ. නාගසිංහ මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - බදුල්ල

**ප්‍රියංගි විජේරත්න මිය**
ප්‍රාදේශිය කළමනාකරු - කළුතර

**ඩි. එම්. කේ. පි. ඒ. දසනායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - කුරුණෑගල

**ඩි. කේ .එස්. එස්. දිසානායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - හම්බන්තොට

**ඊ. එම්. එස්. කේ. ඒකනායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - මහනුවර

**ඒ. කේ. එන්. ප්‍රසංගනි මිය**
කළමනාකරු (නීති) - මහනුවර

**එස්. එම්. ගුණසිංහ මිය**
ප්‍රාදේශිය කළමනාකරු - කෑගල්ල

**ජේ. ඒ. එම්. එස්. වී. සිල්වා මිය**
ප්‍රාදේශිය කළමනාකරු - ගම්පහ (වැඩ බලන)

**සි. අබේගුණසේකර මිය**
ප්‍රාදේශිය කළමනාකරු - මාතර

**පි. හෙට්ටිආරච්චි මයා**
ප්‍රාදේශිය කළමනාකරු - අනුරාධපුර
(වැඩ බලන)

**ජේ. තමිල්ලාගන් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - යාපනය

**ඒ. පි .ජි. ගුණේන්ද්‍ර මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - ගාල්ල

**ටි. අරුද්ස්තන්**
ප්‍රාදේශිය කළමනාකරු - වව්නියා

**ඩි. ඩි. කුළරත්න මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - රත්නපුර

**ජේ. සි. ජයසිංහආරච්චි මෙනවිය**
ප්‍රාදේශිය කළමනාකරු - අම්පාර

**කේ. ජි. ඊ. පි. ප්‍රේමවර්ධණ**
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ දිස්ත්‍රික්)
(වැඩ බලන)

# ආයතනික පාලනය

යහපත් ආයතනික පාලනය, ඉහළ ප්‍රමුඛතා කාර්ය භාරයක් සේ සලකන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අර්ධ රාජ්‍ය ආයතනයක් වන්නේ ය. ස්වකීය සියලු ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු හරහා ව්‍යාප්ත වන පරිදි අදාළ ව්‍යවස්ථාමය හා නියාමනීය විධිවිධානවලට අනුකූලතාව දක්වමින් කටයුතු කරනු පිණිස මණ්ඩලය බැඳී සිටින්නේ ය. ස්වකීය පාලන කාර්ය භාරයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා මණ්ඩලය මෙහෙයවනු ලබන ප්‍රධාන මාර්ගෝපදේශ වනුයේ, විනිවිද භාවය, විශ්වාසදායක භාවය හා අනුකූලතාව දැක්වීම යන තෙවැදෑරුම් ප්‍රතිපත්තියයි.



## ආයතනික පාලනයේ කාර්ය රාමුව

මණ්ඩලයේ පාලන ව්‍යුහය ග්‍රැපික් චිත්‍රමය කව අනුසාරයෙන් පහත දක්වා ඇත:

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ආයතනික පාලන ව්‍යුහය, විශේෂිත භූමිකා හා වගකීම් සහිතව පැහැදිලි වාර්තාකරණමය මාර්ග ද සමග බහු ස්ථරවලින් සැදුම් ලත් පාලන ආයතනවලින් සමන්විත වේ. එහි අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් සිය අධීක්ෂණමය මෙහෙවර සලසා දෙන අතරම එහි උපාය මාර්ගික දිශානතිය, මූල්‍ය ඉලක්ක, සම්පත් වෙන් කර දීම සහ අවදානම් නැඹුරුව යන කරුණු පිළිබඳව මණ්ඩලයේ ඉහළ කළමනාකරණ පාලනාධිකාරිය සමග නිරන්තර සංකථනයේ යෙදෙයි.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු




**අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු**

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු විශේෂිත වගකීම් සහ පැහැදිලි නිශ්චිත විධානයන් මත ක්‍රියාත්මක වේ. කමිටුවේ සභාපතිවරු කමිටුවේ ඵලදායි ක්‍රියාකාරිත්වය සහ අදාළ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ සිදුකිරීම සඳහා වගකිව යුතුය

**කළමනාකරණ කමිටු**

මෙහෙයුම් තීරණ කළමනාකරණය සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරනු ලැබ ඇත. කළමනාකරණ කමිටුව දෛනික මෙහෙයුම් තීරණ ගැනීමට සහ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී වෙත නිර්දේශ සිදුකිරීමට ස්ථාපිත කර ඇත.

ආයතනික පාලනයේ ඉහළම මට්ටමේ සම්මත ප්‍රමිති පවත්වාගෙන යමින් ඒ අනුව කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම හා වගකීම බව මෙම වාර්තාව තුළින් අවධාරණය කෙරේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්  මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, යහපත් පාලන ව්‍යුහ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්ති රාමු සකස් කිරීම යන කාර්‍යභාරය විෂයයෙහි ඉතා ඉහළ වගකීමක් දරන අතර මණ්ඩලයේ කාර්යය හා කර්තව්‍යය උදෙසා වන  උසස්ම තලයේ පන්නරය ඵලදායි ලෙස ඔවුන් විසින් සලසා දෙනු ලැබිය යුතු ය. නියාමන වෙනස්කම් ද, උද්ගත විය හැකි අවදානම් හා අවස්ථා මෙන්ම අභ්‍යන්තර වෙනස්කම් යනාදිය ද පිළිබිඹු වනු පිණිස පාලන භාවිතා හා චර්‍යා සමාලෝචනයට හසු කර නිරන්තරව යාවත්කාලීන කෙරේ.

මණ්ඩලයේ පාලන කාර්ය රාමුව පහත ලැයිස්තු ගත කර ඇති පරිදි බාහිර සහ අභ්‍යන්තරික මෙහෙයුම් හා සබැඳි මෙවලම් කීපයකට සාරානුකූල වන ආකාරයෙන් සකසා ඇත:

- 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් අරමුදල් පනත;
- මුදල් රෙගුලාසි (රජය);
- රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව);
- විශිෂ්ට භාවිත හා චර්යා සංග්‍රහය (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව);
- ප්‍රධාන පාර්ශවකාර කණ්ඩායම්වල අයිතිවාසිකම් සපුරාලන අතරම සංස්ථාපිත ආයතන ක්‍රියා කළ යුතු ආකාරය ආමන්ත්‍රණය කෙරෙන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථාපිත පාලනය පිළිබඳ විශිෂ්ට චර්‍යා සංග්‍රහය;
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත;
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය;
- සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ආමන්ත්‍රණය කිරීම සඳහා වන 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත හා ඊට සිදු කරන ලද සංශෝධන;
- මුදල් එකතු කර ගන්නා නියෝජිතයන් සඳහා බදු අධිකාරීන් විසින් නිකුත් කරන ලද පනත්, චක්‍රලේඛ සහ ගැසට් නිවේදන.
- රජයේ අදාළ චක්‍රලේඛ (මහ භාණ්ඩාග ාරය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය)

# 1. අධ්‍යක්ෂ මණ්ඩලය

## 1.1. මණ්ඩලය

රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් අරමුදලේ භාරකාරත්වයෙහිලා ව්‍යවස්ථාපිත වගකීමක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කළමනාකාරිත්වය, කාර්යක්ෂම මෙහෙයුම් කටයුතු අරභයා සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීම විෂයයෙහි සහතික වන්නා වූ ඵලදායී අභ්‍යන්තර පාලන විධි පද්ධතියක් පවත්වාගෙන යන බවට වග බලාගනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙසෙසා  කටයුතු කරයි.

### 1.1.1. අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම්

අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබ ඇත්තේ ඉහළ විවිධත්වයක් ආරෝපණය වන අයුරින් පුළුල් සමාජ හරස්කඩක් සහිත පසුබිම් මට්ටමකින් (මූල්‍ය, වෙළඳ, හාම්පුතුන්ගේ සම්මේලනය හා වෘත්තීය සමිති යනාදිය) තෝරා  ගැනීමෙන් පසුව ය. මෙමගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කෙරෙන කරුණු සම්බන්ධයෙන් ස්වාධීන මතයක් ගෙන හැර දැක්වීමට ඔවුන්ට හැකියාව ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු වන්නේ ය:

- අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් සිව්දෙනෙකු;
- මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- සාමාජිකයන් 100,000 දෙනෙකුට වඩා වැඩි පිරිසක් සිටින එක් එක් වෘත්තීය සමිතිවල කෘත්‍යාධිකාරී මණ්ඩලය සමග සාකච්ඡා කිරීමෙන් පසුව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

### 1.1.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය පොදු ජනතාව සතු සම්පත්වල භාරකරු ලෙස තම අධිකාරියට යටත් කර ඇති අයිතිවාසිකම් සහ වගකීම් අවංකව සහ සද්භාවයෙන් ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය. තමන් විසින් නිසි සැලසුමකින් තොරව ගනු ලබන යම් තීරණ හා ඉටු කරනු ලබන ක්‍රියා හේතුවෙන් උද්ගතවන ප්‍රතිඵලය අවසානයේ දී දැරීමට සිදුවන්නේ පොදු මහජනතාවට වන හෙයින් මණ්ඩලය සෑම විටම සිය භාරදූර වගකීම් පිළිබඳව දැනුවත්ව සිටිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී විමසුමට භාජනය විය යුතු කරුණු හා ගැටලු පහත දක්වා ඇත:

- ප්‍රතිපත්ති සකස් කිරීම;

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

- අරමුදලේ කාර්යකරණය අධීක්ෂණය කිරීම හා ඇගයීම;
- උසස්තම සදාචාරාත්මක ප්‍රමිතීන් සහිත ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් සහතික කරන අතරම පරිපාලිත සමාගම්වල, ආශ්‍රය සමාගම්වල හා වෙනත් ආයෝජනවල අරමුණු පිළිබඳ කාර්ය සාධනය අධීක්ෂණය සහ ඇගයීම;
- වාර්ෂික කාර්ය සාධනය සමාලෝචනය කිරීම;
- කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම;
- කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්ය සාධන වාර්තා විශ්ලේෂණය කිරීම සහ ප්‍රගමනීය ක්‍රියාමාර්ග ගැනීම.

මණ්ඩලය සාමාන්‍යයෙන් මාසික කාල විරාමයක් සහිතව සහ අවශ්‍ය වන අවස්ථාවලදී රැස්වේ. මණ්ඩලය වසර තුළ අවස්ථා 15 ක දී රැස් විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරබයා ඊට අදාළ මණ්ඩල පත්‍රිකා යෝග්‍ය කාල වේලාවක් සහිතව යටත් පිරිසෙයින් වැඩ කරන දින තුනකට නොඅඩු කාලයකට පෙර බෙදා හරිනු ලැබේ. 2025 වසරේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට එහි සාමාජිකයන්ගේ පැමිණීම පහත දැක්වෙන අයුරින් පැවතියේ ය.

| නම | සහභාගිවූ රැස්වීම් ගණන | 2025 මූල්‍ය වසර තුළ පවත්වන ලද රැස්වීම් ගණන |
|---|---|---|
| සෝමසිරි ඒකනායක මහතා | 15 | 15 |
| කේ. ටී. එම්. ප්‍රේමරත්න මහතා (මහා භාණ්ඩාගාර නියෝජිත) | 15 | 15 |
| ඉන්දික බද්දේවිතාන මහතා | 12 | 15 |
| කේ. ඒ. පී. ද සිල්වා මහත්මිය | 14 | 15 |
| සී. එස්. දිසානායක මහතා | 13 | 15 |
| එස්. එෆ්. එච්. ප්‍රනාන්දු මහතා | 12 | 15 |
| ජූඩ් ඩිනාල් පීරිස් මහතා | 7 | 15 |
| අතුල හරස්චන්ද්‍ර මහතා | 12 | 15 |
| කේ. එන්. ප්‍රේමශාන්ත මහතා | 13 | 15 |

### 1.1.3 මණ්ඩලීය ලේකම්

නියමිත කාර්ය පටිපාටි, අණපනත් හා වෙනත් අදාළ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූලතාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ මණ්ඩලය වෙත කලට වේලාවට විශ්වාසදායක සහ අදාළ වන්නා වූ තොරතුරු සැපයීම අරබයා මණ්ඩලයට වගකිව යුතු වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් ආයතනික ලේකම් වරයෙකුගේ උපදෙස් හා සේවා සලසා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන්හට ඉඩ ප්‍රස්ථාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ කාර්ය පටිපාටි අනුගමනය කෙරෙන බවට මණ්ඩලීය ලේකම් වගබලා ගත යුතු අතර මණ්ඩලයට ඵලදායක ලෙස ඔවුන්ගේ කාර්යයන් ඉටු කරනු පිණිස මණ්ඩල පත්‍රිකා කලට වේලාවට බෙදා හැරිය යුතු ය.

### 1.1.4 මණ්ඩලීය ලේකම්ගේ කාර්ය භාරය

මණ්ඩලීය ලේකම්, සම්මත අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පරිපාටි නිසි අයුරින් අනුගමනය කෙරෙන බවට වගබලා ගත යුතු අතර මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ නෛතික නියමයන් පිළිබඳ මාර්ගෝපදේශ ලබාදිය යුතු ය. ඊට අමතර වශයෙන්, පහත සඳහන් කටයුතු ද ලේකම්වරයාගේ කාර්යභාරයෙහිලා ගැනේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම් දීම්, රැස්වීම් වාර්තා හා මණ්ඩල පත්‍රිකා අනෙකුත් අදාළ ලිපිලේඛන සමග දන්වා යැවීමට සැලැස්වීම;
- අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ඉටු කිරීම;
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර තොරතුරු සපයා දීමෙන් ඔවුන්ට සහය සැලසීම.

### 1.1.5 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාව

ආයතනය ඵලදායි ලෙස කළමනාකරණය කර එය, යහපාලනයේ ඉහළතම ප්‍රමිතීන් කරා මෙහෙයවමින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය වන්නා වූ විශේෂඥ දැනුම, කුසලතාව සහ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සතුව පවතී. ඔවුහු ඉදිරි දැක්ම, නායකත්ව ලක්ෂණ, සාධිත නිපුණතාව සහ ඍජු අවංකභාවය යනාදී ගුණාංගවලින් හෙබි තැනැත්තන් වන්නා හ. මණ්ඩලීය සාමාජිකයින්ගේ පෞද්ගලික වෘත්තික විස්තර මෙම වාර්තාවේ 40 පිටුවෙහි ගෙනහැර දක්වා ඇත.

### 1.1.6 ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ප්‍රමාණවත් කාල වෙලාව

සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මාසික කාල විරාමයක් සහිතව රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා වැය වන සාමාන්‍ය කාලය පැය 03 ක් පමණ වන්නේ ය. අදාළ මණ්ඩල පත්‍රිකා පරිශීලනය කර අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණවත් කාල වේලාවක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

හට ලබා දීම සහතික වනු පිණිස ඒවා සාමාන්‍යයෙන් වැඩ කරන දින තුනකට නොඅඩු කාලයකට පෙර ඔවුන් අතර බෙදා හරිනු ලැබේ.

## 1.2 සභාපති / ප්‍රධාන විධායක නිලධාරි

සමස්ත ආයතනික පාලන තන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරි වරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, සැලසුම් හා වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුත් වන්නේ ය.

### 1.2.1 සභාපති වරයාගේ පත්කිරීම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරිවරයා වනුයේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ය. සභාපති වරයා පත්කරනු ලබන්නේ අමාත්‍යතුමා විසිනි.

### 1.2.2 සභාපති වරයාගේ වගකීම්

සමස්ත ආයතනික පාලනතන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරිවරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි උපාය මාර්ගික දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, උපාය මාර්ගික සැලසුම් හා මූලාරම්භක වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුත් වන්නේ ය.

### 1.2.3 උපායමාර්ගික සහ මෙහෙයුම් කටයුතුවල සමබරතාවය

භූමිකාවන්හි පැහැදිලි බව සහ වගකීම් එළදායී ලෙස වෙන් කිරීම තුළින් සුදුසු බල තුලනය සහතික කෙරේ. සභාපතිවරයාගේ කාර්යභාරය සාමාන්‍යාධිකාරිවරයාගේ කාර්යභාරයෙන් වෙන්ව පවතී. සභාපති විධායක අධ්‍යක්ෂවරයෙකු වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. සාමාන්‍යාධිකාරිවරයා මෙහෙයුම් කටයුතුවලට නායකත්වය සපයන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරක් දරන්නේ නැත. සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරිවරයාගේ ප්‍රධාන භූමිකාවන් / වගකීම් පහත දැක්වේ:

#### සභාපති

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත උපාය මාර්ගික දැක්ම

ඉහළ මට්ටමේදී උපායමාර්ගික හැසිරීම් සකස් කිරීම

සියළුම උපාය මාර්ගික දිශානතීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එළදායිත්වය

ශ්‍රී ලංකා රජය ඇතුළුව සියලුම පාර්ශවකරුවන් සමග ඵලදායි සන්නිවේදනය පවත්වා ගැනීම

ප්‍රමාණවත් තොරතුරු සියළුම අධ්‍යක්ෂවරුන්ට ලබාගත හැකි බව සහතික කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සදාචාර හැසිරීම ස්ථාපිත කිරීම

#### සාමාන්‍යාධිකාරි

දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පරමාර්ථ සකස් කරමින් උපයා මාර්ගික දැක්ම ක්‍රියාවට නැංවීම

ආයතනික සැලැස්මේ දක්වා ඇති කාර්ය සාධන අරමුණු අත්කර ගැනීම

ඉලක්ක පිළිබඳ නිරන්තර නියාමනය සහ ඒවායේ අත්කරගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම

මණ්ඩලය අනුමත අවදානම් රුචිය සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනය තුළ ක්‍රියාත්මක වන බව සහතික කිරීම

ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට මෙහෙයුම් නායකත්වය ලබාදීම



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු



# විගණන කමිටු
## වාර්තාව - 2025

### කමිටුවේ ප්‍රඥප්තිය

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් අනු කමිටුවක් ලෙස, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන විධි හා අභ්‍යන්තර විගණනය යනාදී කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ඉටු කිරීම සඳහා ඊට සහය වෙයි.

### කමිටුවේ සංයුතිය සහ රැස්වීම්

විගණන කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

| නම | තනතුර | සහභාගි වූ රැස්වීම් ගණන |
|---|---|---|
| කේ. ටී. අයි. ප්‍රේමරත්න මහතා | කමිටුවේ සභාපතිනි | 2/2 |
| කේ. එන්. ප්‍රේමශාන්ත මහතා | කමිටු සාමාජික | 1/2 |
| කේ. ඒ. පී. ද සිල්වා මහත්මිය | කමිටු සාමාජික | 2/2 |
| කේ. එස්. වැලිවිට මහතා | කමිටුවේ ලේකම් | |

### විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ ප්‍රධාන කර්තව්‍යයන් පහත ගෙනහැර දැක්වේ:

- ක්‍රියාත්මකව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධති සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි සමාලෝචනය කිරීම, ඒවා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් කෙරෙහි දක්වන අනුකූලතාව සමාලෝචනය කිරීම සහ ඊට අදාළ නියාමන අවශ්‍යතා යනාදියෙහි ප්‍රමාණවත්භාවය හා සඵලතාවය සමාලෝචනය කිරීම;
- කළමනාකරණය විසින් සිදු කරනු ලබන අර්ථාන්විත ඇස්තමේන්තු සහ නිශ්චයමතීන් සමාලෝචනය කිරීම;
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

### අභ්‍යන්තර විගණනය

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කාර්යය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) වරයාගේ ප්‍රධානත්වයෙන් මෙහෙයවනු ලැබේ. විගණන කමිටුව විසින්, අභ්‍යන්තර විගණනයේ නිගමන සහ නිර්දේශ, කළමනාකරණය ඊට දක්වන ප්‍රතිචාරය සමඟ සමාලෝචනයට හසු කරනු ලැබ, සමස්ත පාලන යාන්ත්‍රනය සවිමත් කරනු පිණිස එම නිර්දේශ ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය පිළිබඳව නිරන්තර පසු විපරමට භාජනය කරනු ලැබ තිබේ.

### බාහිර විගණනය

විගණන කමිටුව විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තා විධිමත් පරිදි සැලකිල්ලට යොමු කොට, ඒවා සමාලෝචනයට හසු කර සාකච්ඡාවට භාජනය කරනු ලැබ තිබේ.

### අවධානය යොමු කෙරෙන ප්‍රමුඛ ක්ෂේත්‍ර

වෙන් කර නොපැවති ලැබීම්, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය, හිඟ මුදල් ඇණවුම්, ප්‍රාදේශිය කාර්යාල විසින් කරනු ලබන රැස්කිරීම් සහ මුදල් හා චෙක්පත් බැංකුගත කිරීම්, පනතට කරනු ලබන සංශෝධනවල ප්‍රගතිය, නවම් මාවතෙහි පිහිටි රථගාලෙහි ආදායම, මූල්‍ය වාර්තාකරණය, දායක මුදල් හා අධිභාර එකතු කිරීම් සේවකයන් වෙත ගෙවනු ලබන අධ්‍යාපන ප්‍රදාන, වනික් සහ ඇල්කඩුව ආයෝජන සහ රත්නපුර ප්‍රාදේශිය කාර්යාලයේ ක්‍රියාත්මක කිරීමේ අංශයේ ලිපිගොනු යනාදි කටයුතු පිළිබඳව කටයුතු පිළිබඳව විගණන කමිටුව විසින් වර්ෂය තුළ දී සලකා බලනු ලැබ ඇත.

### වාර්තාකරණය

කමිටු රැස්වීම්වල වාර්තා සහ එහි නිර්දේශ කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සභාගත කෙරුනු අතර, කළමනාකරු (අභ්‍යන්තර විගණන) විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඊට අදාළ කරුණු අවශ්‍ය පරිදි වාචිකව ඉදිරිපත් කර සිටියා ය.

### නිමාව

වසර තුළ දී, කමිටු රැස්වීම්වලට ඉදිරිපත් කරනු ලබන විෂය කරුණු සහ අදාළ විගණන නිරීක්ෂණ යනාදිය පිළිබඳව ගැඹුරු ලෙස සලකා බලා, ඒවා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කර, මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට අවශ්‍ය මගපෙන්වීම් ද කමිටුව විසින් සලසා දෙනු ලැබ තිබේ. ආයෝජන සුරක්ෂිතව ඇති බවට වග බලා ගනු පිණිස ප්‍රමාණවත් පියවරයන් ගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති මූල්‍ය තත්ත්වය සහ ප්‍රතිඵල, සත්‍ය තොරතුරු සහිතව, ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරව පවත්නා බවට සහතික කර ගැනීම සඳහා එම පියවර ප්‍රමාණවත් වන බව විගණන කමිටුවේ මතයයි.

විගණන කමිටුව වෙනුවෙන්,

**අත්සන් කළේ**
කේ. ටී. අයි. ප්‍රේමරත්න
සභාපති,
විගණන කමිටුව.



# කළමනාකරණ අවදානම් කමිටු වාර්තාව

## අරමුණ

අපගේ ව්‍යාපාරික පරිසරයට ආවේණික වන්නා වූ අවදානම හඳුනා ගැනීමටත්, එය තක්සේරු කර බැලීමට හා කළමනාකරණය කිරීමටත් ව්‍යවසායික අවදානම් කළමනාකරණය (ERM) නිර්මාපණය කෙරේ. ඉදිරියේ දී විය හැකි විභව අහිතකර අවදානම් තත්ත්වයන් පුරෝකතනය කිරීමටත්, ඒවා විෂයයෙහි ඵලදායී ලෙස ප්‍රතිචාරාත්මක වීමටත් මෙම ප්‍රවේශය මගින් අපට හැකියාව සලසා දෙනු ඇත. අපගේ අවදානම් කළමනාකරණ පරිචය හා භාවිතයන්, උපාය මාර්ගික පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ හා අප පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් සුරක්ෂිත කිරීමේ කාර්යයෙහිලා මුඛ්‍ය අංගයක් වනු ඇත.

## අවදානම පාලනය කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන කමිටුවේ සහ කළමනාකරණ අවදානම් කමිටුවේ සහය සහිතව කටයුතු කරමින්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා වගකිව යුතු වේ.

## ප්‍රධාන අවදානම්

| අවදානම | සමනය කිරීමේ උපාය මාර්ග |
|---|---|
| ණය අවදානම<br>**සේවා යෝජකයෙකුට තම සාමාජික දායකත්ව වගකීම් හා බැඳීම් ඉටු කිරීමට නොහැකි වූ විට වග බලා ගැනේ.** | • ප්‍රදේශ අනුව නිරන්තර සමාලෝචනය.<br>• මාසික වාරික ගෙවීමේ සැලසුම්.<br>• ප්‍රාදේශිය කාර්යාල ජාල සේවය හරහා සක්‍රිය බලාත්මක කරවීමේ කටයුතු. |
| නීතිමය සහ නියාමන අවදානම<br>**ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට සාරානුකූල නොවීම හේතුවෙන් උද්ගත වේ.** | • සියලුම ප්‍රතිපත්ති වෙනස් වීම් සහ නීති අණ පනත් හා රෙගුලාසි වෙනස් වීම් පිළිබඳව විමසිලිමත් ලෙස දැනුවත්ව සිටීම.<br>• නියාමන දැනුවත්භාවය වැඩි දියුණු කර ගැනීම හා ගතික සාකච්ඡා සැසි පැවැත්වීම. |



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

| අවදානම | සමනය කිරීමේ උපාය මාර්ග |
|---|---|
| **ආයෝජන අවදානම්**<br>**කිසියම් ආයෝජනයක ඉදිරියේ දී විය හැකි අලාභය හෝ ඌන කාර්ය සාධනය පිළිබඳ අවදානම හා බැඳේ.** | • නිරන්තර ආයෝජන කමිටු රැස්වීම්.<br>• ආයෝජන කොටස් කළඹ සම්බන්ධයෙන් වෙළඳපොලින් වෙළඳපොළට ප්‍රති ඇගයීම් සිදු කිරීම.<br>• ආයෝජන ප්‍රතිපත්ති සමාලෝචන සහ ඒවාට අනුකූලතාව දැක්වීම.<br>• අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා සමාලෝචනය කරනු ලැබීම |
| **පොලී අනුපාත අවදානම්**<br>**පොලී අනුපාතයන්හි වෙනස්කම් ඇති කරන අවදානම, මූල්‍ය මෙවලම්වල වටිනාකම විෂයයෙහි බලපෑම් ඇති කරනු ඇත.** | • නිරන්තර ආර්ථික සමාලෝචනය.<br>• ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමිති අනුව තක්සේරු කිරීම්.<br>• විද්‍යාත්මක පුරෝකථන ක්‍රම යොදා ගැනීම. |
| **සංවිධානමය මානව අවදානම්**<br>**ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම කළමනාකරණ මට්ටම්වල දක්ෂ කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට නොහැකි වීමේ අවදානම.** | • අනුක්‍රමික සැලසුම්කරණය.<br>• නිපුණතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන්.<br>• ශ්‍රම පිරිවැටුම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර.<br>• රේඛීය අමාත්‍යාංශය සමඟ නිරන්තර සාකච්ඡා.<br>• කාර්ය මණ්ඩල සුබසාධන වැඩසටහන්.<br>• සංස්කෘතික වැඩි දියුණු කිරීම්. |
| **මෙහෙයුම් අවදානම්**<br>**ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති, පුද්ගලයින් හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ඇති වන අලාභයේ අවදානම.** | • ක්‍රියාවලි සම්බන්ධයෙන් අධීක්ෂණය වැඩි දියුණු කිරීම්.<br>• අභ්‍යන්තර පාලන විධි පිළිබඳ නිරන්තර සමාලෝචනය.<br>• අතින් වැඩ කිරීම වෙනුවට පරිගණක වැඩසටහන් භාවිතයට යොදා ගැනීම.<br>• විගණනය හා සහතිකායනය. |
| **තාක්ෂණය හා දත්ත ආශ්‍රිත අවදානම**<br>**තොරතුරු තාක්ෂණයේ අසමත්කම්, බිඳ වැටීම්, නතරවීම් සම්බන්ධ විභවයන්ට අවදානම අදාළ වන අතර, එය, ප්‍රකෘතිමත් වීමේ ඌනතාව පිළිබඳ පෙර දැනුවත් කිරීම් සිදු කරයි.** | • උපස්ථ නිසි ලෙස නඩත්තු කිරීම.<br>• පද්ධති ආරක්ෂණය වැඩි දියුණු කිරීම්.<br>• දැනට පවත්නා වැඩසටහන් උත්ශ්‍රේණිගත කිරීම.<br>• දත්ත පවිත්‍රණය. |
| **සයිබර් ආරක්ෂණ අවදානම**<br>**තොරතුරු තාක්ෂණ පද්ධතිවල අසාර්ථකත්වය හෝ සයිබර් ප්‍රහාර හේතුවෙන් ඇති විය හැකි විභව මූල්‍ය අලාභවලට, මෙහෙයුම් කටයුතු කෙරෙහි වූ බාධා සිදුවීම්වලට සහ කීර්තිනාම හානි හා සම්බන්ධ අවදානම්වලට මෙම අවදානම අදාළ වේ.** | • අථත්‍ය පුද්ගලික ජාල සේවා (vpn) භාවිතය.<br>• වැඩි දියුණු කළ පද්ධති ආරක්ෂාව හා ෆයර්වෝල් (Firewall) ආරක්ෂණය.<br>• විශේෂඥ උපදේශන.<br>• ආයතනික දැනුවත්වීමේ වැඩසටහන්. |

## නිමාව

විභව අවදානම් හඳුනාගැනීම සඳහාත්, ඒවා කළමනාකරණය කර සමනය කර ගැනීම සඳහාත් ප්‍රමාණවත් කළමනාකරණ කාර්ය රාමුවක් ස්ථාපනය වී පවතින බවට කළමනාකරණ අවදානම් කමිටුව විසින් වග බලා ගනු ලබනවා ඇත.

**අත්සන් කළේ**
ඩී. එල්. සී. ඩී. කුමාර මහතා
කළමනාකරු (අභ්‍යන්තර විගණන)
අවදානම් කළමනාකරණ සම්බන්ධීකාරක.



# ආයෝජන
# කමිටු වාර්තාව

මණ්ඩලයේ ආයෝජන කමිටුව පිහිටුවනු ලැබ ඇත්තේ, මණ්ඩලීය ආයෝජන ප්‍රතිපත්තියෙහි ගෙන හැර දක්වා ඇති පරිදි ආරක්ෂාව, ද්‍රවශීලතාව සහ ප්‍රතිලාභ ලබා ගැනීම යන එහි මූලික ආයෝජන අරමුණු සපුරා ගනු වස් ආයෝජන අංශයට මග පෙන්වමින් ඒ සඳහා උපදෙස් ලබා දීම පිණිස ය. තවද, ආයෝජන ප්‍රතිපත්තිවල වත්කම් වෙන්කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ පාලන කාර්ය රාමුව තුළ පසුවෙමින් විවිධ මූල්‍ය නිපැයුම්හි සිදු කළ

## සංයුතිය

වර්ෂය තුළ ආයෝජන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ :

| නම | තනතුර |
|---|---|
| අතුල හරිස්චන්ද්‍ර මහතා | අධ්‍යක්ෂ |
| ඉන්දික බද්දේවිතාන මහතා★ | අධ්‍යක්ෂ |
| කේ. වී. සී. දිල්රුක්ෂි මහත්මිය | මහා භාණ්ඩාගාර නියෝජිත |
| ආර්. කේ. ජයලත් මහතා ★★ | සාමාන්‍යාධිකාරී (වැඩ බලන) |
| එම්. ඒ. කේ. අළුත්ගමගේ මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) |
| කේ. ඩී. ඒ. පී. කරුණාරත්න මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) |
| කේ. එස්. වැලිවිට මහතා★★★ | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) |

ආයෝජනවල කාර්යක්ෂමතාව නිරීක්ෂණය කිරීමෙහිලා මණ්ඩලයට සහය වීම සඳහා ද මෙම කමිටුවට නියමිත වේ. අවදානම් නැඹුරුවක් සහිත ආයෝජන (කොටස් මිලදී ගැනීමේ සැලැස්ම සහ ණයකර යනාදිය) සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම සඳහාත්, ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල හා කොටස් ආයෝජනවල කාර්ය සාධනය සමාලෝචනය කිරීම සඳහාත් මෙම කමිටුව යටත් පිරිසෙයින් මසකට එක් වරක් හෝ රැස් වෙයි.

| නම | සහභාගි වූ / ස්වීම් ගණන |
|---|---|
| අතුල හරිස්චන්ද්‍ර මහතා | 11/12 |
| ඉන්දික බද්දේවිතාන මහතා★ | 09/12 |
| කේ. වී. සී. දිල්රුක්ෂි මහත්මිය | 11/12 |
| ආර්. කේ. ජයලත් මහතා★★ | 03/12 |
| එම්. ඒ. කේ. අළුත්ගමගේ මහතා | 12/12 |
| කේ. ඩී. ඒ. පී. කරුණාරත්න මහතා | 10/12 |
| කේ. එස්. වැලිවිට මහතා | 00/12 |

★ අථත්‍යව සහ භෞතිකව

★★ 2025 ජූලි මස මණ්ඩලීය සේවයෙන් ඉවත් වන ලදි

★★★ 2025 අගෝස්තු මස සිට මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම යන ලදි.

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු



# කළමනාකරණ කමිටු වාර්තාව

## සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සාමාජිකයින් පහත සඳහන් පරිදි විය:

## සභාපති, සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරරිත්වය

අරමුදලට අයත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම සභාපතිවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ පාලනය යටතට පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමේ වගකීම ඔවුහු දරන්නාහ. මනා විමසුම් සහගත තීරණවලට එළඹීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබා දීමේ කාර්යයෙහි සභාපතිවරයා හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම නියැලෙයි. ඔවුහු මණ්ඩලයේ ඉලක්ක හා අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරන අතරම එහි කාර්යක්ෂම කළමනාකරණය උදෙසා වූ සැලසුම්, අයවැය ලේඛන, පිළිගත් පද්ධති, ක්‍රියාපටිපාටි හා පාලන විධි සැකසීමෙහි ද නිරතව සිටිති.

එබැවින්, මණ්ඩලයේ වාරමය ප්‍රගති පිරික්සුමෙහි මුඛ්‍යාංග යක් ලෙස කළමනාකරණ කමිටුව ක්‍රියා කරයි. කමිටුවේ විශේෂ අවධානය යොමුවන කරුණු පහත දැක්වේ:

- මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති මීට පෙර රැස්වීම්වල දී ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ.
- ඉලක්ක දිශාභිමුඛ කාර්ය සාධන ක්‍රියාදාමයෙහි ඇතිවන පරතර හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සහිතව විධිමත් පිළිවෙත්වලින් බැහැරව කටයුතු කිරීමේ යුක්ති සහගතභාවය හඳුනා ගැනීම.
- ඉදිරි කාර්තු සඳහා වන මුදල් ප්‍රවාහයේ ආකාරය හා ඉලක්ක ගත අවශ්‍යතා අතිශය තීක්ෂණ අයුරින් ඇගයීම.
- ණය සහ මුදල් කළමනාකරණය.
- හදිසි මිලදී ගැනීම් වළක්වනු පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමාදවීම් ඇත්නම් ඒවා පිළිබඳව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හා බදු යනාදී ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි සිදු වන බවට වගබලා ගැනීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසුවනු පිණිස යුක්ති සහගත හේතු මත අවශ්‍ය උසස් තාක්ෂණමය උත්ශ්‍රේණිගත කිරීම් සලසා ගැනීම.
- විවිධ මාධ්‍ය ඔස්සේ පළවන පැමිණිලි ඇතුළුව ගනුදෙනු කරුවන්ගේ තෘප්තිමත්භාවය / අතෘප්තිමත්භාවය පිළිබඳ පසු විපරම් කටයුතු කරමින් ඒවා වැඩි දියුණු කිරීම / නිවැරදි කිරීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- ප්‍රතිශෝධිත ආයතනික සැලැස්ම තුළ ඇතුළත් කළ යුතු යම් යම් නව යෝජනා වේ නම් ඒවා ඉදිරිපත් කිරීම.
- පරිපාලනමය හා ආයතනික කාර්යයන්ට අදාළ සියලු කටයුතු.
- මෙහෙයුම් කාර්යයන් අළලා එදිනෙදා උද්ගත වන වෙනත් යම් ගැටලු.




# අවදානම් කළමනාකරණය

## පසුබිම

මනා අයුරින් පාලනය වන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සිය කාර්ය නිරාවරණය තුළ යම් අධිකාරිත්වයක් දරමින් අවදානමට මුහුණ දෙන්නේ ව්‍යාපාරික අවස්ථාවක් ලෙස ය. එමෙන්ම, ව්‍යාපාරික අරමුණු යන නිර්වචනයෙන් ආරම්භ වන අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස අවදානම් පාලනය සැලකිල්ලට භාජනය කරයි. ඉන් අනතුරුව විමසා බැලෙනුයේ, උපකල්පනය කළ හැකි, කළ යුතු හෝ නොකළ යුතු ව්‍යාපාරික නිරාවරණයන් පිළිබඳ ප්‍රතිපත්ති පිළිපැදීම, අවදානම් සාධක හඳුනා ගැනීම හා තක්සේරු කිරීම මෙන්ම ස්වකීය ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් කළමනාකරණය සඳහා වන ක්‍රම සහ විධි සූක්ෂම අයුරින් යොදා ගැනීම යන කරුණු කාරණායි.

සෑම සංවිධානයක්ම එහි සාර්ථකත්වයට තර්ජනයක් වන අවදානම්වලට මුහුණ දෙයි. කම්පන හෝ ස්වභාවික සිදුවීම්, වසංගත අර්බුද හා පාරිසරික / සමාජීය / පාලනමය ගැටලු ජාතික මෙන්ම ගෝලීය ආර්ථිකයට පවා අහිතකර ලෙස බලපෑම් එල්ල කළ හැකි සංසිද්ධීන් ය. තාක්ෂණය අපේ ජීවිතයේ අනිවාර්ය අංගයක් වී ඇති නමුත් නව තාක්ෂණයේ දියුණුව, ආර්ථික වර්ධනය උපදවන ඵලදායිතා මට්ටම් ඉහළට ඔසවා තැබීම දුර්මුඛ කර තිබේ.

කෙසේ වෙතත්, ෆින්ටෙක් (Fintech) හා රෙග්ටෙක් (Regtech), ක්‍රිප්ටොඇසෙස්ට්ස් (Cryptoassets), මූල්‍ය අපරාධ, සයිබර් සෙකියුරිටි (Cyber Security) සහ ඩේටා සෙකියුරිටි (Data Security) යනාදී අනර්ථකාරී නවෝත්පාදනයන්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය විෂයයෙහි උද්ගතව ඇති හිතකර නොවන සලකා බැලීම් වන්නේ ය.

## ඵලදායී ප්‍රතිපත්ති කරා දිවෙන මාවත

පාලනය, අවදානම සහ අනුකූලතාව හෙවත් 'GRC' යන කෙටි යෙදුම වඩා ඉහළ පිළිගැනීමක් සහිත පාඨයක් වන අතර එකී අංගයන්, වත්මන් ව්‍යවසායන් තම ව්‍යාපාර කාර්යයන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරන නව ආකාරයේ පිළිබිඹුවක් බවට පත් කර ගෙන ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ද පාලනය, අවදානම සහ අනුකූලතාව හෙවත් 'GRC' යන පාඨය හැකි උපරිම ආකාරයෙන් තම ව්‍යවසාය වර්ධනය පිණිස ඉවහල් කර ගත හැකි මහාර්ඝ ආදර්ශයකි.

## අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් කළමනාකරණය පිළිබඳ කාර්යභාරයේ බලය අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරයි.

සියලු වර්ගවල අවදානම් හඳුනා ගැනීම, මානනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම යන කටයුතු ස්වාධීනව සමාලෝචනයට හසු කිරීම අරබයා අවදානම් කළමනාකරණ කමිටුව වගකීම උසුලයි. තව ද, අවදානම් කළමනාකරණ කමිටුව, ආයතනයේ ව්‍යාපාරික උපාය මාර්ගවලට අනුකූලව අනුමත කරනු ලැබීම සඳහා විචක්ෂණශීලී අවදානමක් සහිත මුදල් ප්‍රමාණයක් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරයි. අවදානම අවබෝධ කර ගැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා අවදානම් විශ්ලේෂණය කිරීම, මානනය කිරීම සහ කළමනාකරණය කිරීම යන අවස්ථාවල දී වැදගත් කාර්යභාරයක් ඉටු කරන ආරක්ෂක මාදිලියේ තෙවැදෑරුම් රේඛා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් අනුගමනය කරනු ලැබ ඇත.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු


පාලනය
මෙහෙයුම් කළමනාකරණය සහ සහාය තුළින්
ශක්තිමත් ආචාර ධර්ම කාර්යක්ෂමතාව
උපාය මාර්ග
ක්‍රියාවලිය
මහජනතාව
තාක්ෂණය
අවදානම් නැඹුරුව
බාහිර රෙගුලාසි
අවදානම් කළමනාකරනය
අනුකූලවීම

# අවදානම් සැසඳුම


අනෙකුත් සියලු අංශ
සේ.නි.භා.අ.
ගෝලීය අවදානම් වර්ණාවලිය
උපාය මාර්ගික සහ මෙහෙයුම්
ණය, ද්‍රවශීලිතාවය, වෙළඳපොළ ආයෝජනය

| අභ්‍යන්තර අවාදනම් ධාවක | අවදානම් සාධක | අවම කිරීමේ උපාය මාර්ගය |
|---|---|---|
| **උපායමාර්ගික අවදානම** | ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම් හා අහිතකර ව්‍යාපාරික තීරණ නිසාත්, තීරණ නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම හෝ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්වීමේ ඌනතාවය හේතුවෙන් පැන නගින ඉපැයීම්වලට සහ ප්‍රාග්ධනය වෙත එල්ල වන වත්මන් හෝ අනාගත අවදානම. | අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීමෙන් ද, මුළු මහත් ආයතනය සඳහා ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම කල්තියා සකස් කර ගැනීමෙන් ද, විචලනයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමෙන් ද අභ්‍යන්තර හා බාහිර උපායමාර්ගික අවදානම අවම කර ගැනේ. |
| **මෙහෙයුම් අවදානම** | ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන් හේතුවෙන් ද, පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ද ඇති වන අලාභයේ අවදානම. | පාලන විධි, රක්ෂණය හා පද්ධති විගණනය යොදා ගැනීමෙන් සහ නිතිපතා තොරතුරු තාක්ෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමෙන් ද, ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් හා ආපදා ප්‍රතිසාධන ක්‍රියා පටිපාටි, තොරතුරු සහ සයිබර් ආරක්ෂාව මෙන්ම භෞතික ආරක්ෂාව සම්බන්ධ අවදානම් පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණුව යනාදිය මගින් ද මෙහෙයුම් අවදානම අවම කර ගැනේ. |
| **ණය අවදානම** | තම වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රතිපාර්ශවය හෝ නිකුත් කරන්නා විසින් ගනු ලබන පියවර හේතුවෙන් සිදු වන අලාභයේ අවදානම. | ගිවිසුම් අත්සන් කිරීම, ණය සීමා පවත්වා ගැනීම හා ඒවා අධීක්ෂණය මගින් ද, ඇපකර ලබා ගැනීම මගින් ද ණය අවදානම අවම කර ඇත. |
| **වෙළඳපළ අවදානම** | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි එක් ප්‍රධාන අරමුණක් වන්නේ, දේශීය මූල්‍ය වෙළඳපොළේ මුදල් ආයෝජනය කිරීමෙන් ප්‍රතිලාභ උත්පාදනය කර ගැනීම වන අතර එහි ස්වභාවය මිල අවිනිශ්චිතතාවය මත පදනම් වේ. මූල්‍ය සාධන පත්වල අගයයෙහි සිදු වන වෙනස්වීම් හේතුවෙන් අලාභ උද්ගත වනු ඇත. | අති සුවිශේෂී ආයෝජන පවත්වා ගෙන යාමේ විධි හා මෙවලම් යෙදීම හරහා අස්ථායී අවදානම් වෙළඳපළ තුළ දුවශීලතා අවදානම් පොලී අනුපාත අවදානම සහ කොටස් මිල අවදානම සලකා බැලීම මගින් වෙළඳපළ අවදානම අවම කර ඇත. |
| **ආයෝජන අවදානම** | ආයෝජනය යනු වර්තමාන සම්පත් භාවිතය අත්හැරීමේ තීරණයයි. ඒ වෙනුවට, ඒවායේ වත්මන් අගයන්හි ආයෝජන අවදානමට වඩා වැඩි අනාගත ප්‍රතිලාභ ලැබීමට ඒවා භාවිතා කළ හැකිවේය යන විශ්වාසය තුළ මෙම අනාගත ප්‍රතිලාභ ක්‍රියාත්මක නොවීම හෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවීම අවදානමක් වේ. | පාරිසරික, සමාජීය හා පාලනමය සාධක හරහා වගකිව යුතු ආයෝජන පිළිබඳ සංකල්පය සලකා බැලීමෙන් ආයෝජන ප්‍රතිපත්තියට අනුගත වීම ඔස්සේ ආයෝජන අවදානම් අවම කර ගැනීම සිදු කර ඇත. |
| **ද්‍රවශීලතා අවදානම** | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ද්‍රවශීලතාවය රඳා පවතින්නේ, වෙනත් දේ අතර, සාමාජික හිමිකම් ගෙවීම සඳහා එහි ක්ෂණික මුදල් අවශ්‍යතාවය, දැනට එහි ඇති මුදල් ප්‍රමාණය සහ එහි ආයෝජන වත්කම් කෙතරම් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි ද යන කරුණු මත ය. | කල්පිරීමේ හිනිපෙත ඉදිකිරීම, සත්‍ය සහ ගිවිසුම්ගත මුදල් ලැබීම් විශ්ලේෂණය කිරීම, 'රිපෝ' වැනි ප්‍රති මිලදී ගැනුම් ද්‍රව වත්කම්වල ආයෝජනය, විවිධාංගීකරණය වූ අලෙවි කළ හැකි කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනය යනාදිය මගින් ද්‍රවශීලතා අවදානම අවම කර ඇත. |

## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම හඳුනාගෙන විවිධ හේතූන් යටතේ වර්ගීකරණය කර ඇත: ක්‍රියාවලි, පුද්ගලයින්, පද්ධති සහ බාහිර සිදුවීම් නිසා සේ. නි. භාර අරමුදල් මණ්ඩලය මුහුණ දෙන විවිධ මෙහෙයුම් අවදානම් තක්සේරු කර, පසුව මෙහෙයුම් අවදානමේ ප්‍රතිවිපාක අවදානම අවම කිරීම සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙල තීරණය කිරීම සඳහා අවදානම් ශ්‍රේණිගත කර, අවදානම් ලේඛනයක් ඉදිකර ඇත.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

| කොට්ඨාසය / අංශය / කමිටුව | | | | වෙළෙඳපළ අවදානම් පාලනය - 2 වන පෙළ සුරක්ෂිතතාව | | | | | | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
| | | | | පහළ | මධ්‍යම | ඉහළ | පහළ | මධ්‍යම | ඉහළ | |
| 1 | සාමාජික ගිණුම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | තොරතුරු තාක්ෂණ පද්ධති පාලන විධි මගින් රාජකාරි වෙන්කර නියම කිරීම |
| 2 | යාවත්කාලීන කිරීම | සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධති ප්‍රවේශ ලොගයේ මුරපද හා එහි විකල්ප අයථා පරිහරණය - වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ | | | × | | | × | i. තොරතුරු තාක්ෂණ දත්ත ගබඩාව නඩත්තු කිරීම<br>ii. වඩාත් සංකීර්ණ මුරපද |
| 3 | මුරපද පාලනය | මෙහෙයුම් අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ | | | × | | | × | i. විස්තීරණ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කිරීම<br>ii. තොරතුරු තාක්ෂණ පද්ධති විගණනය කිරීම |
| 4 | තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | i. සාමාජික ප්‍රධාන ගොනු දත්ත වෙනස් කිරීම් සඳහා සීමිතව අවසර දීම සහ අධිගාමී පහසුකම ලබා දීම |
| 5 | සාමාජික ප්‍රධාන ගොනු දත්තවලට සිදු වන වෙනස්කම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතියෙහි ඇති සාමාජික ජාතික හැඳුනුම්පත් / ගමන් බලපත්‍ර අංක බැංකු පත්‍රිකා ගෙවුම් පද්ධතියට ඒකාබද්ධ කිරීම |
| 6 | හිමිකම් ඉල්ලුම් ක්‍රියාවලිය - වැඩ පත් සකස් කිරීම | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ | | | × | × | | | වැඩ පත්වලට දත්ත සටහන් පිවිසුම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ පද්ධති පාලනය |
| 7 | වෙන් නොකළ ලැබීම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | | | × | වෙන් නොකළ ලැබීම් සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ පද්ධති පාලනය |
| 8 | සාමාජිකයාගේ නම සහ හැඳුනුම්පත් අංකය නොමැති සාමාජික ගිණුම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | | | × | i. සංක්‍රමණික ගිණුම් අවහිර කිරීම<br>ii. 2015 වර්ෂයට පෙර ගිණුම් අවහිර කිරීම<br>iii. 2015 වර්ෂයේ සිට ගිණුම් යාවත්කාලීන කර කමිටුව වෙත ප්‍රගතිය ඉදිරිපත් කිරීම |

| | කොට්ඨාසය / අංශය / කමිටුව | | | වෙළෙඳපළ අවදානම් පාලනය - 2 වන පෙළ සුරක්ෂිතතාව | | | | | | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
| | | | | ඉහළ | මධ්‍ය | අඩු | ඉහළ | මධ්‍ය | අඩු | |
| 9 | සචලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධති ප්‍රවේශ ලොගය පවත්වා ගෙන යාම | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ | | | × | × | | | උපස්ථ දත්ත වසර 3 ක් දක්වා දීර්ඝ කිරීම |
| 10 | ඉකුත් ජාතික හැඳුනුම්පත මකා දැමීමේ දී නව ජාතික හැඳුනුම්පත ඇතුළත් කිරීම | i. වංචා කිරීමේ අවදානම<br>ii. ද්විත්ව ගෙවීම් අවදානම<br>iii. දත්ත අහිමි වීම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ | | | × | × | | | බලාත් ප්‍රවේශය හඳුනා ගැනීම |
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 22 වන වගන්තියට අනුව පොලී වියදම හඳුනා ගැනේ. ඉන් කියැවෙනුයේ, "අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන්, අමාත්‍යවරයා සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි, වර්ෂයක සියයට තුනකට නොඅඩු යම් අනුපාතයක පොලියක්, එකී වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතුය" යනුවෙනි.

### 2.3.3 ලාභාංශ ආදායම් හා වියදම්

ලාභාංශ ආදායමට අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි ලාභාංශ ආදායම හඳුනා ගැනේ. ලාභාංශ වියදම් හඳුනා ගැනෙනුයේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය අනුව ය. ඉන් කියැවෙනුයේ, අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබා ගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතුය යනුවෙනි.

### 2.3.4 වෙනත් ආදායම්

සේවකයන්ගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලබන සේවක මණ්ඩල ණය මුදල්හි සාධාරණ අගය මානනය කිරීම මත ලැබෙන පොලී ආදායම හැරුණු විට, වෙනත් අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි වෙනත් ආදායම් හඳුනා ගැනේ.

## 2.4 බදුකරණය

### 2.4.1 ප්‍රවර්තන බදු

රපෝර්තු දිනට පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද බදු අනුපාතික සහ ඉකුත් වසරට අදාළව ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැළපුම් යොදා ගනිමින් වර්ෂය සඳහා බදුවන අදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු වන්නා වූ අපේක්ෂිත බදු ප්‍රවර්තන බදු වන්නේ ය.

ක්‍රමක්ෂය ලාභය සහ ආදායම් බදු වියදම පිළිබඳව යුක්ති සහගත මතයක් ලබා ගැනීමේ අරමුණින් යුතුව එය ක්‍රමක්ෂ්‍ය ලාභ ගිණුමට ආපසු එකතු කරනු ලැබීමේ අටියෙන් වර්ෂය සඳහා වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත ඉපැයූ ආදායමට අදාළ රඳවා ගැනීමේ බද්දෙහි ප්‍රමාණය හඳුනාගනු පිණිස මණ්ඩලය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළේය.

දැනට ගෙවිය යුතු සහ කල් දැමූ බදුවල එකතුව ආදායම් බදු වියදම් නියෝජනය කරනු ලබයි.

ගෙවිය යුතු ප්‍රවර්තන බද්ද පදනම්වී ඇත්තේ වර්ෂය සඳහා බදුවන ලාභය මතය. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදනය පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි සහ දේශිය ආදායම් පනතේ විධිවිධාන අනුව ආගණනය කර ඇති පරිදි වන්නා වූ අදායම් හා වියදම් මූලාංග මත පිහිටා ය.

### 2.4.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු ප්‍රතිපාදනය කරනු ලබනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා වූ ඒවායේ ධාරණ අගයන් අතර ශේෂ පත්‍රයේ දිනට පවත්නා සියලුම තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතයට යොදා ගනිමිනි.

අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි ඉහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැර හඳුනා ගැනේ. අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි පහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් ද, යම් අප්‍රයෝජිත බදු අලාභ හෝ අප්‍රයෝජිත බදු බැර සඳහා ද විලම්බිත බදු බැර හඳුනා ගැනේ. ආපසු අයකර නොගැනීමේ වැඩි හැකියාවක් ඇති ඉහළම මුදල් ප්‍රමාණයට, ප්‍රවර්තන හෝ ඇස්තමේන්තුගත අනාගත බදුවන ලාභය පදනම් කරගෙන, විලම්බිත බදු මානනය කෙරේ.

සෑම රපෝර්තු දිනයකදී ම විලම්බිත බදු වත්කම්වල ශුද්ධ ධාරණ අගය සමාලෝචනයට හසු කෙරන අතර අනාගතයේදී බදු මත ලාභවල ප්‍රවර්තන තක්සේරුව නිරූපණය වනු පිණිස ගළපනු ලැබේ. යම් ගැළපුමක් වෙතොත්, ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ.

විලම්බිත බදු ගණනය කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන කාල පරිච්ඡේදයට අයත් බදු මත ලභය (බදු ආලභය) කෙරෙහි අදාළ වීමට අපේක්ෂිත බදු අනු ප්‍රමාණ හෝ බේරුම් කළ යුතු වන්නා වූ විලම්බිත බදු බැරකම් අනුව, රපෝර්තු කාල පරිච්ඡේදය අවසානය වන විට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙස පනවනු ලැබ ඇති බදු අනු ප්‍රමාණවල පදනම මත පිහිටා ය.

## 2.5 විදේශ ව්‍යාවහාර මුදල් පරිවර්තනය

සමාගමේ ක්‍රියාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මූල්‍ය ප්‍රකාශ පිළිගන්වනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් වලින් සිදු කෙරෙන ගනුදෙනු, අදාළ ගනුදෙනුව සිදුවන දිනයේ පාලනය වන ක්‍රියාත්මක මුදල් ඒකකය මත මූලිකවශයෙන් වාර්තා කරනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකවලින් නාමනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍රයේ දිනට පාලනය වන ක්‍රියාත්මක මුදල් ඒකක විනිමය අනුපාතය අනුව නැවත පරිවර්තනය කෙරේ. සිදුවන සියලු වෙනස්කම් ලාභය හෝ අලාභය වෙත උකහා ගැනේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක අනුසාරයෙන් ඓතිහාසික පිරිවැය ප්‍රකාරව මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම, අදාළ මූලික ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක් අනුසාරයෙන් සාධාරණ අගය මත මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම අදාළ සාධරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ.

## 2.6 ආයෝජන හා වෙනත් මූල්‍ය වත්කම්

### 2.6.1 වර්ගීකරණය

2018 ජනවාරි 1 දින සිට, මණ්ඩලය එහි මූල්‍ය වත්කම් පහත සඳහන් මැනීම් වර්ගීකරණ තුළ වර්ගීකරණය කරයි

- සාධාරණ අගයට (අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් හො ලාභය හෝ අලාභය තුළින්) පසුකාලීනව මනිනු ලබන මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්
- මෙම වර්ගකීකරණය රඳා පවතින්නේ ආයතනයේ මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ගිවිසුම්ගත නියමයන් මතවේ.

සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වතක්ම් සඳහා, ලාභ හෝ අලාභ ලාභය හෝ අලාභය තුළ හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරනු ලැබේ. වෙළඳාම සඳහා තබා නොමැති ස්කන්ධ උපකරණවල අයෝජන සඳහා, අරමුදල අනෙකුත් විස්තරාත්මක අදායම තුළින් සාධාරණ අගයට (FVOCI) ස්කන්ධ ආයෝජනය සඳහා ගණනය කිරීම සඳහා මුලින් හඳුනාගන්නා අවස්ථාවේදී වෙනස් නොකලහැකි තේරීමක් සිදු කර ඇත යන පදනම මත රඳා පවතී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ ඉදිරිපත් කරන ප්‍රමාණය පසුකාලීනව ආදායම් ප්‍රකාශනයට මාරු නොකෙරේ. එවැනි ආයෝජන මත ලාභාංශ අදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

අරමුදල ණය ආයෝජන වර්ගීකරණය කරන්නේ එවැනි වත්කම් කළමනාකරණය කිරීම සඳහා එහි ව්‍යාපාර මාදිලිය වෙනස්වන විට පමණක් වේ.

### 2.6.2 හඳුනා ගැනීම සහ හඳුනා නොගැනීම

මූල්‍ය වත්කම් නිත්‍ය ආකාරයෙන් මිලදී ගැනීම් සහ විකුණුම්, වත්කම් මිලදී ගැනිමට හෝ විකිණිම කළ දිනය අනුව වෙළෙඳ දිනට හඳුනාගනී. මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත්වී ඇති විට හෝ මාරු කර ඇති විට සහ අරමුදල විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් හඳුනා නොගනී.

### 2.6.3 මැණුම්කරණය

මූලික හඳුනාගැනිමේදී, අරමුදල මූල්‍ය වත්කම් එහි සාධාරණ වටිනාකම සමඟ, ලාභ හෝ අලාභ (FVTPL) හරහා සාධාරණ වටිනාකමක් නොලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, මූල්‍ය වත්කම් අත්පත්කර ගැනිම සඳහා සෘජුවම ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය මනිනු ලබයි. FVTPL ට ගෙන යන මූල්‍ය වත්කම්වල ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කෙරේ. බද්ධ වූ ව්‍යුත්පන්න සහිත මූල්‍ය වත්කම්, ඒවායේ මුදල් ප්‍රවාහයන් තීරණය කිරීමේදී මූලික මුදලත් පොලිය පමණක් සලකා බලනු ලැබේ.

#### 2.6.3.1 ණය උපකරණ

ණය උපකරණවල පසුකාලීන මැණුම්කරණය, වත්කම කළමනාකරණය තරමට අරමුදලේ ව්‍යාපාර මාදිලිය සහ වත්කමේ මුදල් ප්‍රවාහ ගතිලක්ෂණ මත රඳා පවතී. අරමුදල ණය උපකරණ වර්ගීකරණය කරන මිණුම්කරණ තුනක් ඇත.

**ක්‍රමක්ෂය කළ පිරිවැය :** ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා දරාගෙන සිටින වත්කම්වල එම මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොලිය ගෙවීම් පමණක් නියෝජනය කර අවස්ථාවක ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලබයි. මෙම මූල්‍ය වත්කම්වලින් පොලි ආදායම ඵලදායි පොලි අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය ආදායම තුළ ඇතුලත් කෙරේ. හඳුනා නොගැනීම මත ඇතිවන යම් ලාභ හෝ අලාභ සෘජුවම ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර විදේශ විනිමය ලාභ සහ අලාභ සමඟ එක්ව වෙන් ලාභ/ (අලාභ) තුළ ඉදිරිපත් කෙරේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශනය තුල වෙනම තිරුවක ඉදිරිපත් කෙරේ.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

**වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය (FVTOCI) :** ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා දරාගෙන සිටින වත්කම්, එම වත්කම්වල මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොලිය ගෙවීම් පමණක් නියෝජනය කර අවස්ථාවක, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබයි. ධාරණ අගය තුළ වෙනස්වීම් අදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා හානිකරණ ලාභ හෝ අලාභ, පොලී ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ හඳුනාගැනීම හැර අනෙකුත් විස්තරාත්මක ආදායම් තුළින් ගනු ලැබේ. මූල්‍ය වත්කම් හඳුනා නොගන්නා විට, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ මෙයට පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධවල සිට ලාභය හෝ අලාභ දක්වා නැවත වර්ගීකරණය කර වෙනත් ලාභ/ (අලාභ) තුල හඳුනා ගනී. මෙම මූල්‍ය වත්කම්වලින් පොලී ආදායම එළදායි පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය අදායම තුළ ඇතුළත් කෙරේ. විදේශ විනිමය ලාභ සහ අලාභ වෙනත් ලාභ/ (අලාභ) තුළ ඉදිරිපත් කරන අතර හානිකරණ වියදම් ආදායම් ප්‍රකාශනය තුළ වෙනම තීරුවක ඉදිරිපත් කෙරේ.

**ලාභය හෝ අලාභය තුළින් සාධරණ අගය:** FVTPL ක්‍රමක්ෂය පිරිවැය හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය සඳහා නිර්ණායක නොසපුරන වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පසුකාලීනව මනින ණය උපකරණයක් මත ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර ලාභ/ (අලාභ) තුළ ශුද්ධ ලෙස ඉදිරිපත් කෙරේ.

**2.6.3.2 කොටස් හිමිකම් සාධන පත්‍ර**

අරමුදල සිය සියලු කොටස් හිමිකම් ආයෝජන සාධාරණ අගයට අනුව පසු කාලීනව මානනය කරයි. අරමුදල් කළමනාකරණය විසින් වෙනත් විස්තීරණ ආදායම් තුළ කොටස් හිමිකම් ආයෝජන මත සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ ඉදිරිපත් කරනු ලැබීමට තෝරා ගනු ලැබ ඇති අවස්ථාවක දී, අදාළ ආයෝජනය හඳුනා නොගැනීම මත සිදුවන සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ කරා පසු කාලීනව ප්‍රතිවර්ගීකරණයට යටත් නොවේ. ගෙවීම් ලබා ගැනීම පිළිබඳ වූ අරමුදලට අයත් ස්වකීය අයිතිය තහවුරු වූ කල්හි ලාභ හෝ අලාභ තුළ එම ආයෝජන වෙතින් උත්පාදනය වන ලාභාංශ වෙනත් විස්තීරණ ආදායම් වශයෙන් හඳුනා ගැනීම නොකඩවා සිදු වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත ගණනය කරන ලද මූල්‍ය වත්කම්හි සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම්, අදාළ වන පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ වෙනත් ලාභ / (අලාභ) යටතේ හඳුනා ගැනේ. වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ මානනය කරන ලද කොටස් හිමිකම් ආයොජන මත සිදුවන අපහායන අලාභ (සහ අපහායන අලාභ වල ප්‍රත්‍යාවර්තනය) සාධාරණ අගය විෂයෙහි සිදුවන වෙනස්කම්වලින් වෙන් කරනු ලැබ වාර්තා නොකෙරේ.

**මූලික මූල්‍ය මෙවලම්**

අලෙවිය සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම් නියමිත සහ විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම් යනුවෙන් මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. මූලික හඳුනා ගැනීමේ අවස්ථාවේදී සමාගම ස්වකීය මූල්‍ය වත්කම් පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

**ණය සහ ලැබීම් නියමිත**

ණය ලැබීම් නියමිතවලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු සහ වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත ඇතුළත්වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ගණනය කෙරෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හැරුණු විට, සියළුම මූල්‍ය මෙවලම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත සාධාරණ අගයට අනුවය.

ණය සහ ලැබීම් නියමිත වනුයේ සක්‍රිය වෙළඳපළක් තුළ මිල ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසුකාලීනව ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

**මූල්‍ය වත්කම් හානියට පත් වීම**

මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇති බවට කිසියම් ආත්මානුරූපික වූ සාක්ෂි තිබේ ද යනුවෙන් සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදී ම තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇති බවට සලකනු ලබන්නේ, අදාළ වත්කම විෂයයෙහි එම දුබලතා මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ එක් සිදුවීමක හෝ ඊට වැඩි සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ බවට ආත්මානුරූපික වූ සාක්ෂි ඇත්නම් සහ එම අලාභ සිදුවීම, විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත බලපෑමක් ඇති කරන්නේ නම් පමණක් ම වන්නේ ය. ණයගැතියන් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවලට හෝ පොලී හෝ මූලික ගෙවීම් පැහැර හැරීම්වලට හෝ ඒවා ගෙවීමෙන් වැළැකී සිටීම්වලට මුහුණ දෙමින් සිටින බවට පිළිබිඹු වන කරුණු ද, ඔවුන් බංකොලොත් භාවයට පත් වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් වීමේ සම්භාවිතාව යන කරුණු ද, හිඟ හිට ඇති මුදල්වල වෙනස්වීම් හෝ මුදල් ගෙවීම් පැහැර හැරීම් සමග සහසම්බන්ධ වන ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ අගයෙහි මැනිය හැකි යම් අඩුවීමක් ඇති බව දත්ත මගින් නිරීක්ෂණය වන කරුණු ද වත්කම් හානියට පත් වීම පිළිබඳව හඟවන සළකුණුවලට අන්තර්ගත විය හැකි ය.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ කොන්ත්‍රාත්තුමය ගිවිසුමේ හරය සහ මූල්‍ය බැරකම්වල අර්ථකථනය අනුව ලාභය හෝ අලාභය හරහා හෝ වෙනත් මූල්‍ය බැරකම් හරහා සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය බැරකම් වශයෙනි.

ලාභය හෝ අලාභය හරහා ගණනය කරනු ලැබ සටහන් කරනු ලබන මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට, සියලුම මූල්‍ය මෙවලම් ආරම්භයේදී මානනය කරනු ලබන්නේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත ඒවායේ සාධාරණ අගයට අනුවය.

පොලී දරන ණය සහ ණය ගැනුම් ද, වෙනත් මූල්‍ය බැරකම්ද (වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත) ඇතුළු මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ, අත්කර ගැනීම් කෙරහි සෘජුවම ආරෝපනය කළ හැකි ගණුදෙනු කිරීමේ පිරිවැය අඩුකරන ලද සාධාරණ අගය අනුව වන අතර ඒවා පසුකාලීනව සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ, නිකුතුව මත වන්නාවූ යම් වට්ටම් හෝ අධිමිල සහ සඵල පොලී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි.

මූල්‍ය බැරකමක් හඳුනා නොගනු ලබන්නේ, බැරකම යටතේ පවත්නා බැඳියාව නිදහස් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ කල්ඉකුත් වන කල්හිය. දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් සැලකිය යුතු අයුරින් වෙනස් කම් දක්වන නියමයන් මත එකම පාර්ශවකරුවා විසින් ඉදිරිපත්කරනු ලබන වෙනත් මූල්‍ය බැරකමකින් ප්‍රතිස්ථාපනය කෙරෙන්නේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක නියමයන් ප්‍රමාණවත් පරිදි වෙනස් කෙරෙන්නේ නම් එබඳු හුවමාරුවක් හෝ අමුතු කිරීමක් මුල් බැරකම නොපිලිගැනීමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලබන්නේය. මුල් මූල්‍ය බැරකමෙහි ධාරණ අගය සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

## 2.7 දේපළ, පිරියත හා උපකරණ

### 2.7.1 හඳුනා ගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සම්භාවිතාව පවතී නම් හා වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනේ. රුපියල් 10,000 ක් වූ ප්‍රමාණයට වඩා අඩු අයිතමයක ඒකක පිරිවැයක් (උපයෝගී පිරිවැය ද ඇතුළුව) දේපළක්, පිරියතක් සහ උපකරණයක් ලෙස හඳුනා නොගෙන එම අයිතම, වියදමක් ලෙස හඳුනාගැනීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වන්නේ ය. කෙසේ වෙතත්, ඉඩම්, ගොඩනැගිලි සහ වාහනවල පිරිවැය (උපයෝගී පිරිවැය ද ඇතුළුව), ඒකක සීමාව රුපියල් 10,000 ක් වූ ප්‍රමාණය නොතකා ප්‍රාග්ධනීකරණය කෙරේ.

### 2.7.2 මානනය කිරීමේ පදනම

නිරවුල් ඉඩම් හැර වෙනත් දේපල, පිරියත සහ උපකරණ අයිතම, පිරිවැය ඌන සමුච්චිත ක්ෂය වීම් එල්ලේ සහ යම් දුබලතා අලාභ කිසිවක් වේ නම් එවා එල්ලේ මිනිනු ලැබේ.

වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයං නිර්මිත වත්කම්වල පිරිවැය, ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමයෙන් ද, වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන එනු පිණිස සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් යම් වියදම්වලින් ද, අයිතම වල කොටස් ගැලවීමට හා ඉවත් කිරීමට සහ ඒවා පවතින අඩවිය ප්‍රතිස්ථාපනය කිරීමට දරන්නා වූ පිරිවැයෙන් ද සමන්විත වන අතර සුදුසුකම් සහිත ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලැබ ඇත.

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවලට අයත් කොටස්වල විවිධ ප්‍රයෝජ්‍ය ආයු කාල ඇති විට, ඒවා දේපල, පිරියත සහ උපකරණ යන වෙනම අයිතම ලෙස ගිණුම්හි ගණනය කරනු ලැබේ.

### 2.7.3 තදනන්තර පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගල ඒමේ සම්භාවිතාවක් තිබේ නම් හා එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, එම අයිතම කොටස රැගෙන යන ධාරණ වටිනාකමේ ප්‍රමාණයෙන් හඳුනා ගෙන ඇත. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි රැගෙන යන ධාරණ වටිනාකමේ ප්‍රමාණය හඳුනා ගනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා කිරීම් සඳහා වන වියදම් ඒවායේ වැය දැරීමට සිදු වන අවස්ථාවේදී දරනු ලැබේ.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් බලාපොරොත්තු වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා වන වියදම, එය දරනු ලබන කල්හි, ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස හඳුනාගැනේ.

### 2.7.4 ක්ෂය වීම

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයක එක් එක් අංගයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ, සරල මාර්ග පදනමක් මත, ලාභය හෝ අලාභය තුළ ක්ෂය වීම හඳුනාගැනේ. ඉඩම් ක්ෂය නොකෙරේ. තනි වත්කම්වල සැලකිය යුතු අංග තක්සේරු කරනු ලබන අතර, එම වත්කමේ ඉතිරිව ඇති කොටසට වඩා වෙනස් වූ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් යම් අංගයකට තිබේ නම්, එම අංගය වෙන් වශයෙන් ක්ෂය කරනු ලැබේ.වත්කමක් ක්ෂය වීම ආරම්භ වන්නේ, එය භාවිතය පිණිස පවත්නා කල්හි වන අතර, එය, අදාළ වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කර ඇති දිනය හෝ වත්කම හඳුනා ගනු නොලබන දිනය යන දෙකින් කලින් එළඹෙන දිනයේ දී අවසන් වේ.

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ, එය භාවිතය සඳහා පවතින මාසයේ දී වන අතර ඒවා ව්‍යපහරණය කළ මාසයේ දී ක්ෂය නොකෙරේ.ක්ෂය වීම් ක්‍රම, ප්‍රයෝජ්‍ය ආයු කාල සහ අවශේෂ අගයන් වාර්තා කරන දිනයේ දී තක්සේරු කර, සුදුසු වන්නේ නම්, ඊට ගැළපුම් සිදු කරනු ලැබේ.

| | වසර ගණන ප්‍රයෝජනවත් ආයු කාලය | ක්ෂයවීම් අනුපාතය |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 40 | 2.5% |
| මෝටර් වාහන | වසර 05 | 20% |
| පරිගණක උපකරණ | වසර 05 | 20% |
| ගෘහ භාණ්ඩ | වසර 10 | 10% |
| සවි කිරීම් සහ වැද්දුම් | වසර 10 | 10% |
| වෙනත් උපකරණ | වසර 05 | 20% |

### 2.7.5 දේපල, පිරියත හා උපකරණ හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් සහ මුලින් හඳුනාගත් කිසියම් සැලකිය යුතු කොටසක් බැහැර කිරීමේ දී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන කල්හි හෝ හඳුනාගනු නොලැබේ. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන යම්කිසි ලාභයක් හෝ අලාභයක්, එම වත්කම හඳුනා ගනු නොලබන කල්හි ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

දේපල, පිරියත සහ උපකරණවල අවශේෂ අගයන්, ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂය වීමේ ක්‍රම එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර, සුදුසු වන්නේ නම්, භවිත්‍ය ලෙස ඊට අවශ්‍ය ගැළපුම් සිදු කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතම සම්මුච්චිත ක්ෂය සහ යම් දුබලතා අලාභ වෙතොත් ඒවා අඩුකරන ලද ඓතිහාසික පිරිවැයට අනුව මානනය කෙරේ. ක්ෂයවීම් සඳහා අය කෙරෙනුයේ වාර්ෂික අනුප්‍රමාණ අඩුකළ වත්කම්හි පිරිවැය වෙන්කර දෙනු ලැබිය හැකි අයුරින් වන අතර, පහත දැක්වෙන දේපළ, පිරියත හා උපකරණ ක්ෂය වීම් සඳහා එය යොදා ගැනේ.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි හා සින්නක්කර ඉඩම් | ... | 2.5% |
| ජල සම්පාදන යෝජනා ක්‍රමය | ... | 10% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | |
| - පොම්ප හා උපකරණ | ... | 20% |
| - වෙනත් (මේස ලුණු බලාගාරය, අයඩිකරණ කම්හල, දොඹකර සහ වෙනත් පිරියත) | ... | 20% |
| උපකරණ | ... | 10% |
| ලීබඩු සහ සවිකිරීම් | ... | 10% |
| මෘදුකාංග සහ අනෙකුත් පරිගණක ජාලයන් | ... | 50% |
| මොටර් වාහන | | |
| - මහමාර්ග වාහන | ... | 10% |
| - ට්‍රැක්ටර් සහ ට්‍රේලර් | ... | 20% |
| සංවර්ධන වැඩ | ... | 20% |
| වැඩුනු වතුවගා - පොල් | ... | 02% |

වත්කමක ක්ෂය අනුපාතය, ප්‍රයෝජන ආයු කාලය හෝ අවශේෂ අගය තුළ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් විද්‍යාමාන වේ නම් එම වත්කම ආශ්‍රිත ශේෂය නව අරමුණු පිළිබිඹු වනු පිණිස ඉදිරියට බලාත්මක වෙන පරිදි ප්‍රතිශෝධනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යාපහරණය මත හෝ එහි භාවිතයෙන් හෝ ව්‍යපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීමක් සිදු නොකෙරේ. එසේ වත්කම හඳුනා නොගැනීම නිසා උද්ගත වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ව්‍යපහරණ මුදල හා වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරන ලද) එකී වත්කම පිළිනොගැනෙන වර්ෂය තුළ ලාභයෙහි හෝ අලාභයෙහි අන්තරගත කරනු ලැබේ.

- **ජෛවවත්කම්**

ජෛව වත්කම්, පරිණත වූ ජෛව වත්කම් සහ පරිණත නොවූ ජෛව වත්කම් යනුවෙන් වර්ග දෙකකට බෙදේ. පරිණත වූ ජෛව වත්කම් වනුයේ, අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්ත්වයට පත් වූ හෝ නිරතුරුව අස්වනු දැරිය හැකි හෝ වත්කම් වර්ගයෝයි. පරිණත නොවූ ජෛව වත්කම් වනුයේ, මේ වන විටත් අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්ත්වයට පත් නොවූ වත්කම් වර්ගයෝයි. පොල් වගා සහ පැල තවාන් ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. ධාරක ජෛව වත්කම්වලට, විකිණීමට හෝ අස්වනු නෙලා ගැනීමට අදහස් නොකරන එහෙත්, කෘෂි නිෂ්පාදන ලෙස අස්වනු ලබා ගැනීම පිණිස යොදා නොග ැනෙන ජෛව වත්කම් ඇතුළත් වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ වත්කම් හා බැඳී පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභ තමන් වෙත ගලා එනු ඇතැයි සහ එම වත්කම්වල සාධාරණ අගය හෝ පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කරනු ලැබිය හැකි වෙතැයි අස්ථිත්වය විසින් අනුමාන කරනු ලබන කල්හි සහ එම අස්ථිත්වය එකී අදාළ වත්කම් පාලනය කරනු ලබන අවස්ථාවක දී පමණක් එම අස්ථිත්වය තම ජෛව වත්කම් හඳුනා ගනියි. ජෛව වත්කම් විෂයයෙහි සිදුවන ස්ථිර හායනයවීම් පූර්ණ වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයන් හි අයගත කරනු ලැබ, අදාළ අලාභය නිශ්චය වශයෙන් දැන ගැනීමෙන් පසුව, එකී අලාභය සිදුවූ වසර තුළදී එම වත්කම්වලට අයත් ශුද්ධ ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණවලට අවකරණය කරනු ලැබේ.

- **ධාරක ජෛවවත්කම්**

ධාරක ජෛව වත්කම්, අංක 16 දරන ලංකා ගිණුම් ප්‍රමිත - දේපළ, පිරියත සහ උපකරණ අනුව, ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හායන අලාභ ඇත්නම් ඒවා ද අඩු කරන ලද පිරිවැය මත, මනිනු ලැබේ.පැල සිටුවීම සහ අස්වනු නෙලීම (පැල රෝපණය කරන ලද ප්‍රදේශය මෝරා වැඩුනු අවස්ථාව වන විට) අතර කාලය තුළ සිදුවූ ඉඩම් පිළියෙළ කිරීම, පුනරුත්ථාපනය, අභිනවයෙන් පැල සිටුවීම, නැවත පැල සිටුවීම, භෝග විවිධාංගීකරණය, අතුරු පැල සිටුවීම සහ පොහොර යෙදීම යනාදිය සඳහා වූ පිරිවැය පරිණත නොවූ වගාවන් ලෙස වර්ගීකරණය කෙරේ. මෙම පරිණත නොවූ වගාවන්, එකී පරිණත නොවූ වගාවන් සඳහා මූල්‍යනය සලසනු පිණිස යොදා ගැනුනු දිගු කාලීන ණය මුදල්වලට ආරෝපණය වන පොලී ප්‍රමාණ ද ඇතුළු අනෙකුත් ආරෝපිත වන්නා වූ පොදු කාර්ය වියදම් සහිත වූ සෘජු පිරිවැයට අනුව ගෙන හැර දක්වනු ලැබේ. වසර තුළදී එල දරන ධාරක ජෛව වත්කම්(පොල්)මත දරනු ලබන වියදම්, පරිණත වූ වගාවන් වෙත මාරු කෙරේ.

**2.8 ආයෝජන දේපළ**

ආයෝජන දේපළ, ඒවායේ ගනුදෙනු කිරීමේ පිරිවැයද ඇතුළුව ආරම්භක අවස්ථාවේදී පිරිවැයට මානනය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, වාර්තාකරණ දිනයට අදාල වෙළඳපොළ තත්ත්වය පිළිබිඹු කෙරෙන සාධාරණ අගයට අනුව ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපලවල සාධාරණ වටිනාකම තුළ සිදුවන වෙනස්කම් නිසා උද්ගතවන යම් ලාභ හෝ අලාභ ඒවා පැනනගින කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි අන්තර්ගත කරනු ලැබේ.

මණ්ඩලය සතු ආයෝජන සෑම තෙවසරකට ම වරක් විවෘත වෙළඳපොළ තුළ පවත්නා අගය අනුව එහි ධාරණ අගයක් වෙතොත් එහි වෙනස ද සමග විස්තීර්ණ අදායම් ගිණුමෙහි හඳුනාගනු ලැබ ප්‍රත්‍යාගණනය කළ යුතු වන්නේය. ලැබිය යුතු කුලිය ඒවායේ කල්බදු කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විහිදුවා හැරිය යුතුය. යම් කුලී නිවැසියෙකුට කිසියම් දිරිගැන්වීමක් (කුලී රහිත කාල සීමාවක් වැනි) ලබා දෙන්නේ නම්, අදාළආයෝජන දේපළෙහි ධාරණ අගයෙන් මෙම පදනම මත කුලී ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනමම වත්කමක් සේ වාර්තාවූ මුදල් ප්‍රමාණ කිසිවක් බැහැර විය යුතු වන්නේය.

මණ්ඩලය සතුව කොළඹ 02, නවම් මාවතෙහි පිහිටි අක්කර 2 රූඩ් 1 පර්චස් 28 ක වපසරියකින් යුත් ඉඩමක් පවතින අතර, එය රජයේ තක්සේරුකරු විසින් 2022 අගෝස්තු මස 24 වන දින තක්සේරු කරන ලදි. එම තක්සේරුකරුගේ වාර්තාවට අනුව, එම ඉඩමෙහි සාධාරණ අගය රු.4,587,406,450 ක් වූ ප්‍රමාණයක් දක්වා



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

ඉහළ ගොස් තිබුණි. 2023 වසරේ අවසන් ගිණුම් සකස් කිරීම සඳහා එම ඉඩම තක්සේරු කිරීම සඳහා ලිපියක් යොමු කරන ලද අතර, එම ලිපියට පිළිතුරු වශයෙන් එම දෙපාර්තමේන්තුව 2023 සැප්තැම්බර් මස 23 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ මෙම දේපල සම්බන්ධයෙන් නිකුත් කර ඇති තක්සේරු වාර්තාව 2018 දෙසැම්බර් මස 31 දිනැති භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛ අංක 4/2018 දරණ චක්‍ර ලේඛය අනුව වසර 05කට වලංගු බවය.

**2.8.1 (අ) මණ්ඩලය සතු ආයෝජන දේපළවල තොරතුරු - ප්‍රමාණය සහ පිහිටි ස්ථානය**

| පිහිටි ස්ථානය | ප්‍රමාණය (පර්චස්) | ආයෝජන දේපළෙහි සාධාරණ අගය |
|---|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02. | 388 | රු. 4,566,000,000.00 |

| පිහිටි ස්ථානය | ගොඩනැගිලි (වර්ග අඩි) | ආයෝජන දේපළෙහි සාධාරණ අගය |
|---|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02. | 19,319 | රු. 21,406,450.00 |

**2.8.2 (ආ) මණ්ඩලය සතු ආයෝජන දේපළවල තොරතුරු - තක්සේරු**

| වෘත්තීය තක්සේරුකරුගේ නම / පිහිටි ස්ථානය හා ලිපිනය | තක්සේරු කිරීමේ ක්‍රමය සහ සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම් | නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම් සඳහා වන ඇස්තමේන්තු පරාසය රු. | ආයෝජන දේපළෙහි සාධාරණ අගය රු. |
|---|---|---|---|
| රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, "තක්සේරු මන්දිරය", අංක 748, මරදාන පාර, කොළඹ 10. | වෙළඳපළ සංසන්දනාත්මක ක්‍රමය • පර්චස් එකක මිල • වර්ග අඩියක මිල | පර්චස් එකක් 11,823,212.50 බැගින්<br>වර්ග අඩියක් 625 - 1955 බැගින් | 4,566,000,000.00<br>21,406,450.00 |

**2.8.3 (ඇ) සමූහය සතු ආයෝජන දේපළවල සාධාරණ අගය මානනය කිරීමේ තක්සේරු ශිල්ප ක්‍රම හා එහි සංවේදකතාවය**

| තක්සේරු ශිල්ප ක්‍රමය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහෙන තක්සේරු යෙදවුම් | යෙදවුම් එල්ලේ සාධාරණ අගය මානනය කිරීමේ සංවේදකතාවය |
|---|---|---|
| වෙළඳපළ සංසන්දනාත්මක ක්‍රමය - ප්‍රතිතක්සේරු කිරීමට භාජනය වන දේපළවල සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී, ඒ හා සමාන දේපළක යුක්ති සහගත නුදුරු කාල පරිච්ඡේදයක් තුළ පැවති විකුණුම් මිල මෙම ක්‍රමය මඟින් සලකා බැලේ. මෙයට සමාන වත්කම්වල පැවති මෑත කාලීන සක්‍රිය වෙළඳපළ මිල තක්සේරු කිරීම මීට අදාළ කර ගනු ලබන අතර එකී නිශ්චිත දේපළෙහි ප්‍රමාණය, ස්වභාවය, ස්ථානීය පිහිටීම සහ තත්ත්වය යනාදියෙහි වෙනස්කම් සඳහා සුදුසු ගැළපීම් කිරීම ද එහි දී සිදු වේ. | • පර්චස් එකක මිල<br>• වර්ග අඩියක මිල | ඇස්තමේන්තුගත සාධාරණ අගය පහත දැක්වෙන තත්ත්වයන් යටතේ වැඩි වනු ඇත./ (අඩු වනු ඇත.)<br>- පර්චස් එකක මිල වැඩි වන්නේ / (අඩු වන්නේ) නම්;<br>- වර්ග අඩියක මිල වැඩි වන්නේ / (අඩු වන්නේ) නම්. |

**2.9 අස්පෘශ්‍ය වත්කම්**

**2.9.1 බාහිර වශයෙන් අත්කරගන්නා ලද අස්පෘශ්‍ය වත්කම්**

වෙන් වෙන්ව අත්කර ගත් අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනීමේ අවස්ථාවේදී පිරිවැයට අනුව මානනය කෙරේ. එසේ ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩුකළ පිරිවැයට අනුවය. අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය නියත හෝ අනියත වශයෙන් තක්සේරු කරනු ලැබේ.

නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර අදාළ අස්පෘශ්‍ය වත්කම දුබලත්වයට පත්ව ඇති බවක් විද්‍යාමාන වන කල්හි ඒවායේ දුබලතා එල්ලේ ද තක්සේරු කිරීමක් කරනු ලැබේ. යටත් පිරිසෙයින් එක් වාර්තකරණ කාල පරිච්ඡේදයක් අවසානයේ දී, නියත ප්‍රයෝජ්‍ය ආයු කලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහාවූ ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය සහ අදාළ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනයට භාජනය කෙරේ. වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ හෝ වත්කම තුළ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත

පරිභෝජන රටාව තුළ සිදුවන වෙනස්කම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් සලකා බලනු ලබන අතර ගිණුම් ඇස්තමේන්තු තුළ සිදුවන වෙනස්කම් ලෙස සලකනු ලබන්නේය. නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත සිදුවන ක්‍රමක්ෂය වියදම් අදාළ අස්පෘශ්‍ය වත්කමෙහි ක්‍රියාකාරිත්වය හා අනුකූල වන පරිදි වියදම් කාණ්ඩය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගතව වන ලාභ හෝ අලාභ, ශුද්ධ ව්‍යපහරණ මුදල සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙස මානනය කරනු ලබන අතර එකී වත්කම නොපිලිගැනෙන අවස්ථාවේ දී, එය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.9.2 පරිගණක මෘදුකාංග පැකේජ

පරිගණක මෘදුකාංග පැකේජ අත්කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ අවස්ථාවේදී දරනු ලබන මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර වසර තුනක කාල සීමාවක් ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.10 කල්බදු දේපළ

දේපළ, පිරියත හා උපකරණ යටතේ කලින් වර්ගීකරණය කර තක්සේරුව අනුව සටහන් කරන ලද ඉඩම් පරිහරණය පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් කල්බදුකර දේපළ, "කල්බදුකර දේපළ" ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබ තිබේ. හම්බන්තොට පිහිටි ඉඩම සඳහා ගෙවන ලද කල්බදු මුදල වසර 30ක් වූ කල්බදු කාල සීමාවක් මුළුල්ලේ ප්‍රාග්ධනීකරණය කර ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

### 2.10.1 මෙහෙයුම් කල්බදු

හිමිකාරිත්වය කෙරෙහි ආනුෂංගික වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් පරිදි මණ්ඩලය වෙත (මෙහෙයුම් කල්බදු) මාරු කරනු නොලබන අවස්ථාවේදී, බදුකරය යටතේ ගෙවිය යුතුවන්නාවූ මුළුකුලී මුදල් ප්‍රමාණ බදු කාලසීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

### 2.11 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. එසේ ගණනය කරනු ලබන්නේ අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසුවය.

අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසු එකී වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිකාම යනු, සාමාන්‍ය වෙළෙඳ ක්‍රියා මාර්ගය තුළ අදාළ වට්ටෝරු භාණ්ඩ විකුණුම සම්පූර්ණ කිරීම පිණිස ඇස්තමේනතුගත පිරිවැය හා අදාළ විකුණුම් සිදුකිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද එය විකුණනු ලැබිය හැකි මිලය.

පහත දැක්වෙන පිරිවැය විධික්‍රම උපයෝගී කර ගනිමින්, අදාළ භාණ්ඩ තොග ඒවායේ වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා වැය කරන ලද වියදම ගණනය කරනු ලැබේ.

අමුද්‍රව්‍ය - පළමුව පැමිණ පළමුව පිටවන පිරිවැය පදනම මතවූ ගැනුම් වියදම අනුව

නිමි භාණ්ඩ - සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සුදුසු ප්‍රාදේශීය නිෂ්පාදන පොදු කාර්ය වියදම්වල අනුපාතයන් සඳහාවූ වියදම අනුව

කෙරෙමින් පවත්නා වැඩ - සනත්වයේ 12 වන මට්ටමට සහ ඉන් ඉහළට තැන්පත්ව පැවති ලුණුවල ගණනය කරන ලද ප්‍රමාණයට අනුව විභජනය කරන ලද පසුගිය අස්වනු වාරයේදී පැවති කරදිය සංසරණය සහ ලුණු ලියැදි සැකසීමේ වියදමින් 25% ක්වූ ප්‍රමාණයට අනුව

පරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර කොටස් - පළමුව පැමිණ පළමුව පිටවන පදනම මත ගැනුම් පිරිවැය අනුව

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ක්‍රියා මාර්ගය තුළ විකුණුම් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද ඇස්මේන්තු ගත විකුණුම් මිලය.



www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

## 2.12 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 2.12.1 සේවක ප්‍රතිලාභ

සමාගම සන්තකයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන දෙවර්ගය ම පවතී. නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, සමාගම විසින් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලැබීමක් යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් මගින්, සේවකයා ස්වකීය සේවයෙන් විශ්‍රාම ගැනීමේදී තමාගේ සේවා කාලය හා ඊට අදාළ වන්දි මුදල මත පදනම්ව ලබා ගන්නා විශ්‍රාම වැටුප් මුදලකි.

### 2.12.2 නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලැබේ. මණ්ඩලය විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

පවත්නා ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරවසියලුම සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලැබේ. සමාගම විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% ක් සහ 3% ක් වනසේ පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

### 2.12.3 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

අර්ථ දක්වා ඇති නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්මේ පිරිවැය සහ එහි වගකීමේ වර්තමාන වටිනාකම තීරණය කෙරෙනුයේ, ආයුගණක තක්සේරුව භාවිතා කරමිනි. ආයුගණක තක්සේරුව විෂයයෙහි අනාගත තථ්‍ය වර්ධනයන්ගෙන් වෙනස් විය හැකි උපකල්පනවලට එළඹීම් අදාළ වේ. මෙහිලා, වට්ටම් අනුපාතය තීරණය කිරීම ද, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත ද ඇතුළත් වේ. තක්සේරුකරණයේ සංකීර්ණත්වය, ඊට පාදස්ථ වන උපකල්පන සහ එහි දිගු කාලීන ස්වභාවය හේතුවෙන්, අර්ථ දක්වා ඇති ප්‍රතිලාභවල වගකීම, මෙම උපකල්පනවල වෙනස්වීම් කෙරෙහි ඉතා සංවේදී වේ. සියලු උපකල්පන සෑම වාර්තාකරණ දිනයක දීම සමාලෝචනයට හසු කෙරේ.

යෝග්‍ය වට්ටම් අනුපාතය තීරණය කිරීමේ දී, අර්ථ දක්වා ඇති නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ අපේක්ෂිත කාල සීමාවට අනුරූප වන කල්පිරීම් සහිත ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල පොලී අනුපාත, කළමනාකරණය විසින් සලකා බලනු ලබයි. මරණ අනුපාතිකය, ප්‍රකාශිතව පළවී ඇති මරණ අනුපාතික වගු මත පදනම් වේ. අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාතිකය සහ සමාගම අනාගතයේ දී අපේක්ෂා කරන වැටුප් වැඩිවීම් මත ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය පදනම් වේ. ආයුගණක තක්සේරු කිරීම්වල දී භාවිතා කරන ප්‍රධාන උපකල්පනවල විස්තර මූල්‍ය ප්‍රකාශනවලට කෙරෙන 34 වන සටහනෙහි ගෙන හැර දක්වා ඇත.

## 2.13 සම කොටස් හිමිකම

### 2.13.1 සාමාජික අරමුදල

වර්ෂය තුළ සාමාජික සාමාජිකවන් වෙත ගෙවන ලද ආපසු ගෙවිය යුතු අරමුදල් අඩුකරන ලද සාමාජික සාමාජිකාවන් වෙතින් ලද හා ලැබිය යුතු දායක මුදල් ඊට ඔවුන් වෙුවෙන් උපචිත වන්නා වූ පොලි හා ලාභාංශ ද සමග සාමාජික අරමුදල සමන්විත වන්නේය.

### 2.13.2 ලාභාංශ

ලාභාංශ හඳුනාගනු ලබනුයේ, ඒවා ලැබගැනීමේ අරමුදල සතු අයිතිය තහවුරු වූ කල්හිය.

### 2.13.3 සංචිත

ප්‍රත්‍යාගණන සංචිතය, සින්නක්කර ඉඩමෙහි හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයට අදාළ වන අතර අදාළ ප්‍රත්‍යාගණන දිනයට පවත්නා ඉඩම් හා ගොනැගිලිවල සාධාරණ අගයෙහි වෙනස්කම් ඉන් නියෝජනය කරයි. ඒ අනුව, නවම් මාවතේ පිහිටි ඉඩමේ ගැණුම් පිරිවැය ඉක්මවූ වෙළඳපොළ වටිනාකමේ ඉහළ යාම අනුව සංචිතය ගොඩ නැගී ඇත.

රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් ලාභාංශ හා පොලි ගෙවීමෙන් පසුව උද්ගතවන අතිරික්ත ලාභය මණ්ඩලය විසින් ලාභාංශ සමකිරීමේ සංචිත ගිණුමට මාරුකරනු ලබයි. මෙම සංචිතය පිහිටුවීමේ අරමුණ වනුයේ, මතු අපේක්ෂිත ලාභාංශ ගෙවීම් සපුරාලීමත්, රඳවාගත් ඉපැයුම් වෙතින් මුදල් විගලනය අඩුකිරීමත් යන කරුණුය.

වත්කම් හඳුනා නොගැනීම හෝ ඒවා දුබලතාවයටපත්වන තෙක් විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයෙහි සමුච්චිත ශුද්ධ වෙනස විකුණුම් සඳහා පවත්නා සංචිතය තුළ සමන්විතවේ.

**2.14 ප්‍රතිපාදන**

අවිනිශ්චිත කාල නිර්ණ සහ මුදල් ප්‍රමාණ හා බැඳි බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනාගනු ලැබ ඇත. රිපෝර්තු දිනය වන විට අදාළ බැඳියාව නිරවුල් කරනු පිණිස අවශ්‍ය වන්නා වූ වියදමෙහි ප්‍රශස්තම වියදම් ඇස්තමේන්තුව මත ප්‍රතිපාදනය මනිනු ලැබ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොල තක්සේරුව මත සහ අදාළ බැරකමට විශේෂිත වන්නා වූ අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් මත එය වට්ටම් ගත කරනු ලැබේ.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව වර්තමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් පවත්නා විට ද, අදාළ බැඳියාව නිරවුල් කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ පවරාදීමක් අවශ්‍ය වේදැයි යනුවෙන් හෝ අදාළ මුදල විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකි වේදැයි යනුවෙන් අනුමානයක් පවතින කල්හිද නෛතික හිමිකම් ඉල්ලා සිටීම සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

අදාළ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ එකී බැඳියාවට අදාළ වන්නා වූ විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් යොදා ගනිමින් එම බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍යවන්නාවූ අනාගත මුදල් ප්‍රමාණයෙහි වර්තමාන වටිනාකම මත ප්‍රතිපාදනය මනිනු ලැබේ. කල්ගතවීම නිසා ප්‍රතිපාදනයෙහි සිදුවන වැඩිවීම් පොලී වියදමක් ලෙස හඳුනා ගනු ඇත.

**2.15 වෙළඳ හා වෙනත් ලැබිම් නියමිත**

බොහොමයක් විකුණුම් සිදු කෙරෙනුයේ සාමාන්‍ය ණය කොන්දේසි පදනමක් මතය. ඊට අදාළ ලැබිම් නියමිත තුළ පොලී නොදැරේ. සාමාන්‍ය ණය කොන්දේසි ඉක්මවා යමින් ණය විස්තාරණයක් සිදුවන අවස්ථාවකදී සඵල පොලී අනුපාතය උපයෝගි කර ගනිමින් ලැබිම් නියමිත ගණනය කෙරෙනුයේ ක්‍රමක්ෂිත පිරිවැයට අනුවය. එක් එක් රිපෝර්තු කාල පරිච්ඡේදය අවසානයේදී වෙළඳ හා වෙනත් ලැබිම් නියමිතවල ධාරණ අගය, අදාළ මුදල් ප්‍රමාණ ආපසු අයකර ගත නොහැකි වෙතැයි යනුවෙන් යම් විෂය නිශ්‍රිත සාක්ෂි පවතීදැයි නිශ්චය කරනු පිණිස සමාලෝචනයට භාජනය කරනු ලැබේ. එසේ පවතීනම්, වහාම ලාභය හෝ අලාභය තුළ දුබලතා අලාභයක් හඳුනා ගනු ඇත.

**2.16 වෙළඳ ගෙවීම් නියමිත**

වෙළඳ ගෙවීම් නියමිත යනු සාමාන්‍ය ණය කොන්දේසි මත වන්නාවූ බැඳීම් වන අතර, ඒ සඳහා පොලී නොදැරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයකින් නාමනය කරන ලද වෙළඳ ගෙවීම් නියමිත රිපෝර්තු දිනය වන විට පවත්නා විනිමය අනුපාතය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් විනිමය ලාභ හෝ අලාභ වෙනත් ආදායම තුළ හෝ වෙනත් වියදම් තුළ අන්තර්ගතවේ.

**2.17 මුදල් හා මුදලට සමාන දෑ**

මුදල් හා මුදලට සමාන දෑ යනු දන්නා මුදල් අගයන්ට යුහුසුළුව පරිවර්තනය කළහැකි සහ වටිනාකම හා බැඳි වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමකට යටත් අතැති මුදල් ද, ඒක්ෂණ තැන්පතු ද, කෙටිකාලීනවූ අතිශය ද්‍රවශීල ආයෝජනද වන්නේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ තුළ පරිශේෂව පවත්නා බැංකු අයිරා අඩුකරන ලද අතැති මුදලද, බැංකුවෙහි ඇති තැන්පතුද අඩංගු වන්නේය. කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන එනම්, ඒවා අත්කරගත් දින සිට තෙමසක් හෝ ඊට අඩු ආයෝජනයන්ද සැලකෙනුයේ මුදලට සමාන දෑ ලෙසය.

**2.18 ප්‍රදාන සහ සහනාධාර**

මණ්ඩලය විසින් වත්කම්වලට අදාළ මූල්‍ය ප්‍රදාන, පිරිවැය ලෙස හඳුනා ගනු ලබන අතර, ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ විලම්බනය කර වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ. ලද ප්‍රදානය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි ක්‍රමක්ෂ කර ඇත්තේ පහත දැක්වෙන පරිදි ය.

| | |
|---|---|
| පරිගණක මෘදුකාංග | 33.33% |
| මෝටර් වාහන | 20% |



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ සියලුම ඒ හා සම්බන්ධ කොන්දේසිවලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ඇති විට ප්‍රදාන හඳුනා ගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වන විට, එය, ඒ සඳහා හානි පූරණය කිරීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ප්‍රදානය ගැළපීමට අවශ්‍ය කාල සීමාව මුළුල්ලේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විට, එය අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා විලම්බිත ආදායමක් ලෙස පිහිටුවා ගැනේ. මණ්ඩලයට මූල්‍ය නොවන ප්‍රදාන ලැබෙන විට, වත්කම සහ එම ප්‍රදානය නාමික ප්‍රමාණවලින් සටහන් කර පහත සඳහන් පරිදි සමාන වාර්ෂික වාරිකවලින් අදාළ වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශය වෙත මුදා හරිනු ලැබේ :

ලැබෙන ප්‍රදාන, සංචිත ගිණුමකට බැර කරනු ලැබ පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශයට ක්‍රමක්ෂය කෙරේ.

| | |
|---|---|
| අයඩීකරණ යන්ත්‍රාගාරය සඳහා ප්‍රදානය | 10% |
| මෝටර් රථය සඳහා ප්‍රදානය | 10% |
| ගොඩනැගිලි සඳහා ප්‍රදාන | 2.5% |
| පොම්පාගාරය සඳහා ප්‍රදානය | 2.5% |

සේවකයින්ට වන්දි ලබා දීම සඳහා ප්‍රදානය - ගෙවනු ලබන වන්දි මුදලින් අඩු කිරීම.

## 2.19 වත්කම් අපහායනය

### 2.19.1 මූල්‍ය වත්කම් අපහායනය

SLFRS 9 අනුව ණයකර ආයෝජන සහ ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන වෙනත් මූල්‍ය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු සඳහා මණ්ඩලය ප්‍රතිභාගයන් වාර්තා කරයි.

**ඉදිරි දැක්මක් සහිත අවස්ථා ඇතුළත් කිරීම**

දරණ ලද අලාභ ආකෘතියට ප්‍රතිවිරුද්ධව, අනාගත අපේක්ෂිත අලාභ SLFRS 9 විසින් හඳුන්වා දෙන ලද අපේක්ෂිත ණය අලාභ ආදර්ශය යටතේ තක්සේරු කිරීමට අවශ්‍ය වේ. එයට ඉදිරිය දකින සාර්ව ආර්ථික දත්ත සහ ආයතනයට සෘජුව සම්බන්ධ නොවන උපකල්පන භාවිතය අවශ්‍ය වේ. මෙය ආර්ථික සාධක ගැලපීම හරහා හානිකරණය ගණනය කිරීම තුළට ඇතුළත් කෙරේ.

**ණය සුරැකුම්පත් තුළ අයෝජනය සඳහා අපහායන එළඹුම (FVTPL නොවන)**

බාහිර ණය ශ්‍රේණිගතකරණ දත්ත වෙන්කිරීම් ස්ථාපිත කිරීමට භාවිතා කළ හැකිය. තව ද, ණය ශ්‍රේණිගතකරණය පිරිහීම, ප්‍රකාශිත මූල්‍ය සහ වෙනත් තොරතුරු ණය අවාදනම තුළ සැලකියුතු වැඩිකිරීම් තක්සේරු කිරීමට සහ ජීවකාල වෙන්කිරීමක් සිදු කිරීම පිණිස උපකරණ ආයෝජන ශ්‍රේණියක් ද යන්න සමාලෝචනය කළ යුතුව ඇත. බාහිර ශ්‍රේණිගතකරණ දත්ත නොමැතිකම තුළ, පැහැර හැරී අනුපාත අපේක්ෂිත ණය අලාභ ස්ථාපිත කිරීම පිණිස ව්‍යුහගත ක්‍රම/ ණය විසිරීම්/ ණය ලකුණු භාවිතා කරමින් ස්ථාපිත කළ යුතුව ඇත.

**අපේක්ෂිත ණය පාඩුවල මූලික සංරචක**

- **ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාව තක්සේරු කිරීම**
  ණයකර, ස්ථාවර තැන්පතු සහ ණය සහ ලැබිය යුතු දේ සඳහා ඓතිහාසික ගෙවීම් පැහැර හැරීමේ දත්ත නොතිබූ හෙයින්, S & P Global Ratings විසින් ප්‍රකාශයට පත්කළ 2018 Annual Gloval Corporate Default Study and Rating Transitions හි දත්ත භාවිතා කරන ලදි.

- **පාඩු ඇති කරන පැහැරහැරීම (LGD) තක්සේරු කිරීම**
  ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් SLFRS 9 අදාළ කර ගැනීම සම්බන්ධව බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව, දත්ත හෝ ආදාන මඳවීම නිසා බලපත්‍රලාභී බැංකුවකට පාඩු ඇති කරන පැහැර හැරීම් ගණනය කරගැනීමට නොහැකිවූ විට, එවැනි බැංකුවක් එවැනි නිරාවරණයක් සඳහා අවම වශයෙන් සියයට 45 ක පාඩු ඇති කරන පැහැර හැරීම් තක්සේරුවක් යොදාගත යුතුය.

- **ගෙවීම් පැහැර හැරීම් නිරාවරණය (EAD) තක්සේරු කිරීම**
  අපේක්ෂිත ණය අලාභ ආයතනය ණය අලාභයට නිරාවරණය වන කාලසීමාව පුරා මනිනු ලබයි. පැහැර හැරීමේදී වන කාලසීමාව පුරා මනිනු ලබයි. පැහැර හැරීමේදී නිරාවරණය යනු ණය අලාභයට නිරාවරණය වන සමහර මූල්‍ය උපකරණවල අයෝජනය කරන මුදලේ ප්‍රමාණයයි.

  2019 ජනවාරි 1 දින සිට, ක්‍රමක්ෂය පිරිවැයට සහ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට ගෙන යන ණය උපකරණ හා බැඳුනු අපේක්ෂිත ණය අලාභ (ECL) අනාගතය දකින පදනමකින් අරමුදල තක්සේරු කරයි. යොදා ගන්නා හානිකරණ ක්‍රමවේදය ණය අලාභවල සැලැකිය යුතු වැඩිවීමක් තිබේද යන්න රඳා පවතී.

මණ්ඩලය ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොමනින ලද පහත සඳහන් මූල්‍ය උපකරණ මත අපේක්ෂිත ණය අලාභ (ECL) සඳහා අලාභ දීමනා හඳුනා ගනී.

- ලැයිස්තුගත - ණයකර
- ස්ථාවර තැන්පතු
- රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව සමග ණය යෝජනා ක්‍රම තැන්පතුව
- ජාතික සංවර්ධන බැංකුව සමඟ ණයයෝජනා ක්‍රමය

### 2.19.2 මූල්‍ය නොවන වත්කම් දුබලතාවයට පත්වීම

කිසියම් වත්කමක් දුබලතාවයට පත්විමේ ලක්ෂණ පහළවී තිබේ දැයි යනුවෙන් සෑම රපෝර්තු දිනකම මණ්ඩලය තක්සේරු කර බලයි. ඒ පිළිබඳව හඟවන යම් කරුණු වේ නම් හෝ කිසියම් වත්කමක් විෂයෙහි වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වේ නම් අදාළ වත්කමෙහි ආපසු අයකර ගතහැකි වටිනාකම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. වත්කමක ආපසු අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි විකුණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගයෙහි හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම ආපසු අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම දුබලතාවයට පත්වූ ලෙස සලකා එහි ආපසු අයකර ගත හැකි වටිනාකම ලියා දක්වනු ලැබේ.

භාවිත වටිනාකම තක්සේරු කිරීමෙහිලා ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ, අදාළ මුදලෙහි කාලානුරූප වටිනාකමෙහි ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරුව හා අදාළ වත්කමට විශේෂිත වන්නා වූ අවදානම් ප්‍රවර්තන වෙළෙඳපොළ තක්සේරුව පිළිඹිබු වන බදු පූර්ව වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඒවායේ ප්‍රවර්තන අගය අනුව වට්ටම් ගත කෙරේ. සාධාරණ අගයෙන් අඩු කළ විකුණුම් පිරිවැය නිශ්චය කිරීමෙහිලා ප්‍රශස්ත තක්සේරු කිරීමේ ආකෘතියක් යොදාගනු ලැබේ. මෙම ආගනනයන්, තක්සේරුවල බහුවිධ ක්‍රම, ප්‍රසිද්ධ වෙළඳ සමාගම් වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා වෙනත් සාධාරණ අගය දැක්වීමේ දර්ශක මගින් තහවුරු කෙරේ.

වත්කම් සඳහා පූර්ව වශයෙන් හඳුනාගන්නා ලද දුබලතා අලාභ තව දුරටත් නොපවතින්නේ ද නැතහොත් අඩුවී තිබේ ද යන්න පිළිබඳව තක්සේරුවක් සෑම රපෝර්තු දිනයකදීම සිදු කරනු ලැබේ. එබඳු දැනවුමක් පවතී නම්, අදාළ වත්කමෙහි හෝ මූල්‍ය උත්පාදන ඒකකයෙහි ආපසු අයකරගත හැකි වටිනාකම මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. අවසන් දුබලතා අලාභය හඳුනාගන්නා ලද අවස්ථාවේ වත්කමෙහි ආපසු අයකර ගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන් හි වෙනසක් පවතින්නේ නම් පමණක් පූර්ව වශයෙන් හඳුනාගන්නා ලද දුබලතා අලාභය අවලංගු කෙරේ. වත්කම සඳහා පූර්ව වර්ෂ තුළ අදාළ දුබලතා ආලභ කිසිවක් හඳුනාගෙන නොතිබියේ නම්, ක්ෂය වීම් අඩු කළ වත්කමෙහි ධාරණ වටිනාකම එහි ආපසු අයකරගත හැකි මුදල ඉක්මවා නොයන අයුරින් හෝ නිශ්චය කරනු ලැබිය යුතුව තිබූ ඊට අදාළ ධාරණ අගය ඉක්මවා නොයන අයුරින් එකී අවලංගු කිරීම සීමා කරනු ලැබේ. එබඳු අවලංගුකිරීම් ආදයම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

## 2.20 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

### 2.20.1 ආයෝජනමය දේපළ තක්සේරු කිරීම

ස්වකීය ආයෝජනමය දේපළවල සාධාරණ අගය නිශ්චය කර ගැනිම පිණිස ආයතනය බාහිර තක්සේරු කරුවෙකු ලවා ඒවා හා සම්බන්ධ තක්සේරු කිරීම් ඉටුකරවා ගනියි. මෙම තක්සේරු කිරීම්, අනාගත කුලී ආදායම්, අපේක්ෂිත නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන වියදම් සහ ප්‍රශස්ත වට්ටම් අනුපාත ඇතුළු උපකල්පන මත පදනම්වී ඇත. මෙහිලා තක්සේරු කරුවා මේ හා සමාන දේපළවල ගනුදෙනු කිරීමේ මිල ගණන් ආශ්‍රිත වෙළඳ පොල සාක්ෂි පිළිබඳවද අවධානය යොමු කරයි.

### 2.20.2 මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගනිමින් මිල ප්‍රකාශිත නොවූ මූල්‍ය මෙවලම්හි සාධාරණ අගය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි. වට්ටම් අනුපාත සහ අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු ඇතුළුව යොදාගනු ලැබ ඇති උපකල්පන මගින් එබඳු ශිල්ප ක්‍රම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කරයි. එම කාරණයෙහිලා, එලෙස ලබා ගන්නා සාධාරණ අගය පිළිබඳ ඇස්තමේන්තු ස්වාධීන වෙළඳපළ තත්ත්වයන් සමඟ සංසන්දනය කිරීම මගින් සෑම විටම සනාථ කළ නොහෙන අතර බොහෝ අවස්ථාවලදී ඒවා වහා උපලබ්ධි කර ගැනීමේ හැකියාවක් ද නොමැති විය හැකිය.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

### 2.20.3 දේපළ, පිරියත හා උපකරණ සඳහා ප්‍රශස්ත ප්‍රයෝජ්‍ය ආයුකාල සහ අවශේෂ අගය

ආයතනය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කරමින් ඉහත අයිතමවල ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ඒවායේ අවශේෂ වටිනාකම් වල ඇස්තමේන්තු ප්‍රශස්තව පවතින්නේදැයි වාර්ෂිකව පරීක්ෂා කර බලයි.

### 2.20.4 ව්‍යාපාර සංකලන සහ පාලනමය නොවන සබැඳියා අත්කර ගැනීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1997 වර්ෂයේදී සීමාසහිත ලංකා ලුණු සමාගමේ කොටස් වලින් 90% ක්වූ ප්‍රමාණයක් අත්කරගෙන ඇත. ඒ හා බැඳි කීර්ති නාමයෙහි වටිනාකම රුපියල් 378,926,440 ක් වශයෙන් ගණනය වන අතර එලෙස එම කොටස් අත්කරගත් දිනයේ සිට බලපැවැත්වෙන ගිණුම් පරිචයන් මත පදනම්ව අදාළ අත්කරගත් දිනයේ සිට ආරම්භ වන 05 අවුරුදු කාලසීමාවක් මුළුල්ලේ එකී කොටස් වටිනාකම ක්‍රමක්ෂය වන බව හඟිනු ලැබ ඇත.

මෙම ව්‍යාපාර සංකලනය පිළිබඳ විස්තර පහත දක්වේ.

| | සමූහය | |
|---|---|---|
| | රු. | රු. |
| පවරන ලද ප්‍රතිෂ්ඨාව<br>හඳුනාගත් ශුද්ධ වත්කම් වල පිළිගන්නා ලද<br>වටිනාකමෙහි සමානුපාතික කොටස | | 470,960,938 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 31,500,000 | |
| සංචිත | 60,534,498 | 92,034,498 |
| **කීර්ති නාමය** | | **378,926,440** |

කීර්ති නාමය පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරනු ලැබ තිබූ හෙයින්, සමාලෝචනයට භාජනය වන වසර තුළ ගිණුම් ද්වයම වෙනුවෙන් ගැළපුම් කිසිවක් නොවීය.

## 3. සාමාජික අරමුදලට කළ ගැළපුම්

### 3.1 2025 සාමාජික අරමුදලට කළ ගැළපුම්

| | රු. |
|---|---|
| ගෙවනු ලැබූ දායක මුදල් සඳහා අධිභාර | 755,637.59 |
| දායක මුදල් (C/A 150) | - |
| වැඩිපුර ගෙවන ලද ආපසු ගෙවීම් | (2,304,626.56) |
| ගෙවන ලද දායක මුදල් සඳහා අධිභාර | (2,912,504.48) |
| **එකතුව** | **(4,461,493.45)** |

| | | සටහන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2025 | 2024 | 2025 | 2024 |
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **4** | **පොලී ආදායම** | | | | | |
| | පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන | 4.1 | 69,064,442 | 62,194,449 | 68,766,748 | 61,819,095 |
| | | | **69,064,442** | **62,194,449** | **68,766,748** | **61,819,095** |
| | | | | | | |
| **4.1** | **පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන** | | | | | |
| | ස්ථාවර තැන්පත් පොලී | | 332,706 | 421,675 | 42,966 | 52,714 |
| | ණයකර පොලී | | 525,227 | 674,976 | 525,227 | 674,976 |
| | භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිලාභ | | 67,325,013 | 56,742,181 | 67,325,013 | 56,742,181 |
| | භාණ්ඩාගාර බිල්පත් මත ආන්තිකය | | 350,609 | 3,728,228 | 350,609 | 3,728,228 |
| | ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් පොලී | | 441,292 | 537,942 | 441,292 | 537,942 |
| | මුදල් වෙළඳපොළ පොලී | | 4,367 | 3,712 | 4,367 | 3,712 |
| | වියන නිවාස ණය පොලී | | 43,309 | 51,536 | 43,309 | 51,536 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය පොලී | | 10,832 | 9,297 | 10,832 | 9,297 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පතුව මත පොලී | | 1,082 | 473 | 1,082 | 473 |
| | **සේවක ණය** | | | | | |
| | විශේෂ ණය මත පොලිය | | 1,055 | 1,120 | 1,055 | 1,120 |
| | වාහන ණය මත පොලිය | | 10,902 | 7,550 | 10,902 | 7,550 |
| | විශේෂ ආපදා ණය මත පොලිය | | 17,646 | 15,398 | 9,691 | 9,006 |
| | විශේෂ උත්සව ණය මත පොලිය | | 401 | 361 | 401 | 361 |
| | විශේෂ අත්තිකාරම් මත පොලිය | | - | 1 | - | 1 |
| | | | **69,064,442** | **62,194,449** | **68,766,748** | **61,819,095** |
| | | | | | | |
| **5** | **ශුද්ධ වෙළඳ ආදායම** | | | | | |
| | ශුද්ධ ආදායම | 5.1 | 2,507,205 | 3,450,552 | - | - |
| | (-) විකුණුම් පිරිවැය | | (1,999,540) | (2,175,081) | - | - |
| | | | **507,665** | **1,275,472** | **-** | **-** |
| | | | | | | |
| **5.1** | **ශුද්ධ ආදායම** | | | | | |
| | දළ ආදායම | | 2,958,501 | 4,071,652 | - | - |
| | (-) එකතුකළ අගය මත බදු සහ ජාතිය ගොඩනැඟීමේ බද්ද | | (451,297) | (621,099) | - | - |
| | | | **2,507,205** | **3,450,552** | **-** | **-** |
| | | | | | | |
| **6** | **ලාභාංශ ආදායම** | | | | | |
| | කොටස් මත ලාභාංශ - ලැයිස්තුගත | | 918,268 | 955,397 | 918,268 | 955,397 |
| | කොටස් මත ලාභාංශ - ලැයිස්තුගත නොවන | | 319,350 | 539,065 | 319,350 | 539,065 |
| | | | **1,237,618** | **1,494,462** | **1,237,618** | **1,494,462** |
| | | | | | | |
| **7** | **ලාභ හෝ අලාභ හිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/ (අලාභ)** | | | | | |
| | මිල ප්‍රකාශිත කොටස් විකිණීමෙන් ලාභ | | 567,925 | 1,143,331 | 567,925 | 1,143,331 |
| | කොටස් මත සාධාරණ වටිනාකම ගැලපීම | | 81,385 | 896,887 | 81,385 | 896,887 |
| | | | **649,310** | **2,040,218** | **649,310** | **2,040,218** |



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | සටහන | 2025 | 2024 | 2025 | 2024 |
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 8 | **වෙනත් ආදායම** | | | | | |
| | රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම | | 3,073 | 5,329 | 1,360 | 3,617 |
| | කුලී ආදායම | | 2,024 | 1,996 | 300 | 320 |
| | අධිභාර | | 534,359 | 560,922 | 534,359 | 560,922 |
| | සේවක ණය ආදායම | | 40,825 | 31,576 | 40,825 | 31,576 |
| | විවිධ ආදායම | | 18,055 | 18,739 | 3,822 | 2,698 |
| | රථගාලෙන් ලද ලාභය/ (පාඩුව) නවම් මාවත | | 44,609 | 37,915 | 44,609 | 37,915 |
| | නිවාඩු නිකේතනයෙන් ලද ලාභය/ (අලාභය) | | (2,852) | (2,915) | (2,852) | (2,915) |
| | ආදායම (ආපසු ලියා හැරීම) | | 1,500 | - | 1,500 | - |
| | ප්‍රවාහන අයකිරීම් | | 6,712 | 16,507 | - | - |
| | | | **648,305** | **670,069** | **623,923** | **634,132** |
| | | | | | | |
| 9 | **කාර්ය මණ්ඩල වියදම්** | | | | | |
| | වැටුප් හා වේතන | 9.1 | 882,845 | 867,526 | 786,517 | 765,481 |
| | කොටිකාලීන මුල්‍ය සහ මුල්‍ය නොවන ප්‍රතිලාභ | 9.2 | 628,036 | 671,235 | 474,252 | 455,649 |
| | නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම | 9.3 | 62,229 | 70,126 | 58,866 | 53,950 |
| | වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ | 9.4 | 171,007 | 157,795 | 133,841 | 125,535 |
| | | | **1,744,117** | **1,766,683** | **1,453,476** | **1,400,616** |
| | | | | | | |
| 9.1 | **වැටුප් හා වේතන** | | | | | |
| | **සේවක පිරිවැය (අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු ඇතුළුව)** | | | | | |
| | වැටුප් | | 641,480 | 628,870 | 548,670 | 533,429 |
| (ආ) | 2025 මාර්තු 25 දිනැති අංක 01/2025 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 20 ඡේදය | සේවක වර්ගීකරණය අනුව ගෙවන ලද සංයුක්ත දීමනා මුදල සේවක මට්ටම අනුව ගෙවීමට චක්‍රලේඛය මගින් නියෝග කර තිබුණද, ඉන් බැහැරව කටයුතු කර තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 (ආ) (iii) ඡේදය | ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය මගින් ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිළිබඳ සාමාජිකයින් දැනුවත් කිරීමේ ක්‍රියාවලියට අදාල ප්‍රසම්පාදන කමිටුව විසින් පළමු රැස්වීමේ දීම පුළුල් ප්‍රචාරණයක් ලබා ගැනීම සඳහා ප්‍රචාරණය සිදුකළ යුතු දින, ආකාරය, ප්‍රසම්පාදන ලේඛන නිකුත් කිරිම, ලංසු යෝජනා භාරගැනීම, අවසන් කිරීම, විවෘත කිරීම දින තීරණය කළ යුතු වුවද, රු. මිලියන 15ක් වැයකර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාලව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමූහයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති නොමැති බව.

(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 (1) වගන්තිය අනුව සේවා නියුක්තයා උපයන මුළු ඉපයීම්වලින් සියයට තුනක් පමණ වන දායක මුදලක් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර සේවායෝජකයා විසින් අරමුදලට ගෙවිය යුතු වුවත්, 2001 ත් හා 2019 ත් අතර කාලයේදී මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද ඇඟලුම් කර්මාන්තශාලා 20 ක් ආරම්භයේ සිට ද, පිරිසිදු කිරීමේ පහසුකම් සපයන ආයතන 15 ක් ද, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල හෝටල් සහ ආපනශාලා ආයතන පිළිවෙලින් 29 ක් හා 12 ක් 2025 වර්ෂය සඳහා දායක මුදල් ගෙවා නොතිබුණි. එම ආයතන අතරින් ආයතන 51 ක් ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා ද ලක්කර නොතිබුණි.

(ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16.3 වගන්තිය අනුව සේවායෝජකයින් විසින් මණ්ඩලය වෙත ප්‍රේෂණය කරනු ලබන දායක මුදල් ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කළ යුතු වුවද, 2026 අප්‍රේල් 27 දින වනවිට 1981 සිට 2024 වර්ෂය දක්වා සේවායෝජකයින් 6,612 ක් විසින් මණ්ඩලය වෙත බැර කරන ලද රු.මිලියන 911.27 ක මුදලක් එලෙස බැර කර නොතිබුණි. මේ තුළ 2015 ත් 2024 ත් වර්ෂයට අදාලව සේවායෝජකයින් 6,211 ක් සඳහා රු.මිලියන 896.74 ක මුදලක් පැවතුණි. 2026 මැයි 22 දින වනවිට සේවායෝජකයින් සංඛ්‍යාව 5,960 ක් දක්වා අඩුවී විභජනය නොකළ මුදල් ශේෂය රු.මිලියන 876.4 ක් වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

(අ) නව පරිගණක පද්ධති ව්‍යාපෘති කටයුතු සඳහා 2023 වර්ෂයේ දී මිලදී ගනු ලැබූ මුළු වටිනාකම රු.2,478,000 ක් වූ QR Code Printers 21 ක් හා මුළු වටිනාකම රු.2,277,572 ක් වූ QR Code Scanners යන්ත්‍ර 44 ක් භාවිතයෙන් තොරව වසර තුන හමාරක් තිස්සේ ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) චෙක්පත් එකතු කිරීමේ පහසුකම් ලබා දීම වෙනුවෙන් ලංකා බැංකුව හා මණ්ඩලය අතර 2006 අගෝස්තු 06 දිනැති ලිපිය ප්‍රකාරව ඇති වූ එකඟතාවය අනුව රු.මිලියන 10 ක සහ රු.මිලියන 490 ක තැන්පතු දෙකක් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලැබේ. අවුරුදු 20 කට ආසන්න කාලයක සිට පවත්වාගෙන යනු ලබන මෙම තැන්පතු සඳහා සාපේක්ෂව ඉහළ වෙළඳපොළ පොලී ලබා ගැනීමට මණ්ඩලය අවධානය යොමු කර නොතිබුණි. රු.මිලියන 500 වැනි මුදලක් අඛණ්ඩව මෙතරම් කාලයක්

ලංකා බැංකුව තුළ රඳවා තබා ගැනීමේ දී මණ්ඩලයට ඉහළ ප්‍රතිලාභයක් ලබා ගැනීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2011 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක කොටස් 761,478 ක් මිලට ගෙන තිබූ අතර, 2025 දෙසැම්බර් 31 දිනට එහි වෙළඳපළ අගය රු.48,811,600 කි. 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා මෙම ආයෝජන සඳහා ලාභාංශ ලැබී නොමැති අතර සමාලෝචිත වර්ෂයේ ලද ලාභාංශ මුදල රු.383,739කි. 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අතර කාල සීමාව තුළ මෙම සමාගම සම්බන්ධයෙන් මණ්ඩලය කොටස් වෙළඳපල ගනුදෙනුවලට අවතීර්ණ වී නොමැති අතර මෙම මුදල ඵලදායී ප්‍රතිලාභයක් ලැබෙන සමාගම්හි ආයෝජනය කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2002 වර්ෂයේ දී ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ කොටස් 3,302,188ක් රු.2,224,218,565ක පිරිවැය යටතේ මිල දී ගෙන තිබුණි. ඉකුත් වර්ෂ 5 තුළ මෙම කොටස් සඳහා ලැබූ ලාභාංශ ප්‍රමාණය ද රු.13,241,773කි. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කොටස් 2008 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත විකිණීම නතර කර වසර 17ක කාලයක් ඉකුත්ව ගොස් තිබුණ ද මෙම කොටස් සඳහා ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමෙන් තොරව මණ්ඩලය දිගින් දිගටම පවත්වාගෙන යනු ලබයි. සාමාජිකයාගේ මුදලින් සමන්විත මෙම අරමුදලේ මුදල් දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන යාමෙන් සාමාජිකයාට හිමිවන ප්‍රතිලාභ මට්ටම කෙරෙහි බලපෑමක් සිදු වී තිබුණි.

(ඉ) මණ්ඩලය සතු නවම් මාවත පිහිටා ඇති වර්ග අඩි 19319 කින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනට පිරිවැය වටිනාකම රු.මිලියන 21.41 ක්වූ දෙමහල් ගොඩනැගිල්ල කිසිදු ආයෝජන ආදායමක් ඉපයීම සඳහා උපයෝගී කරගෙන නොතිබුණි.

3. වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් තුළ ඇතුලත් ඇල්කඩුව වැවිලි සමාගමේ ණයකර සඳහා ලැබිය යුතු පොලී ආදායම රු. 24,793,485ක් හා මුළු වටිනාකම රු.3,175,000,000ක ලැයිස්තුගත ණයකර ආයෝජන 05කට අදාලව එම ආයතන වලින් ලැබිය යුතු ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අරමුණු හා කාර්යයන් ඉටුකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති මුළු සේවායෝජක සංඛ්‍යාව 235,624 ක් වුවත්, ඉන් සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය අවසානයට 84,491 ක් හෙවත් සියයට 35.8 කි. සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව තවදුරටත් වර්ධනය කර ගැනීමට හා නව සේවායෝජකයින් හඳුනා ගැනීමට මණ්ඩලය ගනු ලබන ක්‍රියාමාර්ග තවදුරටත් වර්ධනය කරගත යුතු විය.

(ii) 2024 වාර්ෂික වාර්තාව මගින් අනාවරණය කර ඇති පරිදි සාමාජිකයන්ට තම පෞද්ගලික ගිණුමේ ශේෂය කෙටි පණිවිඩයක් මගින් දැනගැනීමට මණ්ඩලය පහසුකම් ලබාදී ඇති බව සඳහන්ව පවතී. සක්‍රිය සාමාජික සංඛ්‍යාව වූ මිලියන 2.6 න් වර්තමානය වනවිට මෙම සේවාව ලබාගැනීම සඳහා මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව 35,662 ක් බව විගණනය වෙත වාර්තා කර ඇත. ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කිරීමේ දී තමා සක්‍රිය සාමාජිකයෙකු ද යන්න දැනගැනීමේ පහසුකම් විද්‍යුත් සේවාව ඔස්සේ ලබාගැනීම සඳහා මෙම ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීම තවදුරටත් වර්ධනය කළයුතු මට්ටමක පැවතුණි.

(iii) මණ්ඩලයේ කාර්යයන් හා සේවාවන්හි කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩිකිරීමේ අරමුණින් සාමාජිකයින් කේන්ද්‍රගත වූ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ ඒකාබද්ධව වසර 3 කින් නිමකිරීමේ අරමුණින් 2016 නොවැම්බර් මස අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද වර්තමානය වනවිටත් පද්ධතිය නිල වශයෙන් සජීවී ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකිව

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

පවතී. සැලසුම් කල කාලය තුල ව්‍යාපෘති කටයුතු නිම නොවීම මත තොරතුරු තාක්ෂණ උපදේශකයෙකුගේ සේවයද වසරක කාලයක් සඳහා ලබාගෙන ඒ සඳහා රු.2,400,000 ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණු අතර 2025 දෙසැම්බර් අවසානය වනවිට ව්‍යාපෘතිය වෙනුවෙන් මණ්ඩලය දරා තිබූ මුළු වියදම රු.මිලියන 193ක් විය. ව්‍යාපෘතිය සාර්ථකව අවසන් වී නොමැති බැවින් නව ගිවිසුමකට එළඹීමට මණ්ඩලය මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ ආයෝජිත දේපලක් වූ නවම් මාවත රථගාල වර්තමාන තක්සේරු වටිනාකම රු.මිලියන 4,566ක් වන අතර එහි වාර්ෂික ඉපැයීම රු.මිලියන 44ක් වෙ. රථගාල පවත්වාගෙන යාම, ආදායම් එකතු කිරීම, ගිවිසුම් ගත වීම සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මණ්ඩලය සතු නවම් මාවත භූමි පරිශ්‍රය තුළ වර්තමානය වනවිටත් වෙළඳ දැන්වීම් පුවරු 2ක් සවිකර ඇති අතර, ඉන් එක් ආයතනයක දැන්වීම් පුවරුව 2016 වර්ෂයේ සිටද, අනෙක් ආයතනයේ දැන්වීම් පුවරුව 2022 වර්ෂයේ සිට ද පවත්වාගෙන එනු ලබයි. ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව දිගින් දිගටම එකම ආයතනය සඳහා අවස්ථාව ලබාදීමට මණ්ඩලය කටයුතු කර ඇති අතර, ආයතන සමඟ ගිවිසුම්ගත වීමටද මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ii) වාහන නැවතුම්කරුවන්ගෙන් 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු ශේෂ වටිනාකම රු.6,858,325ක් වූ අතර මේ තුළ දින 90ක් ඉක්මවා ඇතත් නොගෙවූ ශේෂ වටිනාකම රු.3,950,000 කි. මාසික කුලී පදනම මත රථවාහන ගාල් කරන ආයතන 78ක් පැවතියද එක් ආයතනයක් සමඟ පමණක් මණ්ඩලය ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර තිබුණි.

(iii) රථගාලේ නැවතුම් පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් මාසික නැවතුම් ගාස්තුව මෙන් තුන් ගුණයක මුදලක් ආරක්ෂිත තැන්පතු ලෙස තැන්පත් කළ යුතු වුවද, වාහන 111ක නැවතුම් පහසුකම් ලබා ගන්නා ආයතනයක් රු.2,664,000ක මුදලක් (8,000x3x11) ආරක්ෂිත තැන්පත් ලෙස ගෙවිය යුතු වුවද රු.1,584,000ක් පමණක් තැන්පත් කර තිබීමෙන් රු.1,080,000ක හිඟ මුදල මේ දක්වා අයකරගෙන නොතිබුණි.

(ඇ) තොරතුරු වත්කම්වල රහස්‍යභාවය, උපයෝජ්‍යතාව සහ විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා ඒවා වෙත අනවසරයෙන් වන ප්‍රවේශ වීම, වළක්වාලීම, වෙනස් කිරීම හෝ විනාශ කිරීම වලින් තොරතුරු වත්කම් ආරක්ෂා කිරීම සඳහා හඳුන්වා දී ඇති සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට සියළුම රාජ්‍ය ආයතන අනුගතව කටයුතු කළ යුතු බව තාක්ෂණ අමාත්‍යාංශයේ 2023 මැයි 02 දිනැති අංක MOT/2023/01 දරන චක්‍රලේඛය මගින් හඳුන්වා දී තිබුණි. චක්‍රලේඛ නිර්ණායකවලට අනුකූලව මණ්ඩලය තුළ තොරතුරු ආරක්ෂණ කමිටු පිහිටුවීම, අවදානම් කළමනාකරණ කමිටු පිහිටුවීම, තොරතුරු වත්කම් ලේඛනය හා තොරතුරු තාක්ෂණ වත්කම් ලේඛනය පවත්වාගෙන යාම ආදී කටයුතු මෙතෙක් සම්පූර්ණ කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 1,106ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය 848ක් වීමෙන් පුරප්පාඩු 258ක් විය. මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීමේ ක්‍රියාවලියේ දී කාර්ය මණ්ඩලයේ දායකත්වය, බඳවා ගැනීම සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) තනතුරට 2021 වර්ෂයේ දී බඳවා ගනු ලැබූ නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂාවේ දී ඔහුගේ සේවා පළපුරුද්ද සඳහා ලකුණු පිරිනැමීමට අදාල සේවා සහතික ගොනුගත කර නොතිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1–10 ප්‍රකාරව පත්වීම් බලධරයකු විසින් මොනම හේතුවක් නිසා හෝ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය රහිතව පත්වීමක් පෙරදාතම නොකළ යුතු වුවත් 2020 සැප්තැම්බර් 01 දින සිට සහකාර පරිපාලන නිලධාරියෙකු ලෙස පත්වීම් ලද පුද්ගලයෙකුගේ තනතුරේ පත්වීම් දිනය 2016 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙර දාතම් කර තිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.1.2 අනුව වැඩ බැලීමේ පත්වීම් සඳහා නිර්දේශ කරනු ලබන නිලධාරියාට අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සෑම අයිත්ම සුදුසුකම් තිබිය යුතු වුවද, කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ II ශ්‍රේණියේ තනතුරක රාජකාරී ඉටු කරමින් සිටි නිලධාරියකුට 2021 දෙසැම්බර් 22 දින සිට කළමනාකරු, ප්‍රතිලාභ පරිපාලන තනතුරෙහි (MM I-3) වැඩ බැලීම සඳහා පත්කර තිබුණි.

(iv) අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 15ක් වුවද 2025 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 05ක් විය. සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක) තනතුර 2023 වර්ෂයට පෙර සිටම පුරප්පාඩුව පවතින අතර, වර්තමානයේ අනුයුක්ත කාර්ය මණ්ඩලයෙන් නිලධාරීන් 03 දෙනෙකු පමණක් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණි.

(ඊ) 2016 අගෝස්තු 26 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවේ දී මණ්ඩලයේ සභාපති හා විධායක නිලධාරී තනතුර එකම පුද්ගලයකු දැරීම, පනත් සංශෝධනය මගින් වෙනස්කළ යුතු බවට නියෝග කර තිබුණද, එම රැස්වීම පවත්වා වසර 08 ක කාලයක් ඉකුත්ව ගොස් තිබුණද එම කාර්යය කඩිනම් කර සංශෝධනය කිරීමට අපොහොසත් වී තිබුණි.

(උ) අරමුදල මගින් සිදුකරන ආයෝජනයන්හි වෙළඳපොළ මිලෙහි ඇතිවන විශාල උච්චාවචනයක් නිසා සාමාජිකයන්ගේ බෙදිය හැකි ලාභ වලට බලපෑමක් ඇති වූ විට එහි අහිතකර බලපෑම් වැළැක්වීමේ අරමුණින් ආරම්භ කරන ලද ලාභ සමකිරීමේ සංචිතයට 2015 සිට 2022 වර්ෂය දක්වා ලාභයෙන් වෙන් කිරීම සිදුකර නොමැති අතර 2023, 2024 හා 2025 වර්ෂයන්හි දී පිළිවෙලින් රු.මිලියන 10ක්, රු.මිලියන 3ක් හා රු.මිලියන 5.8ක් ආදී වශයෙන් වෙන් කිරීම් සිදු කර ඇත. නිශ්චිත ප්‍රතිපත්ති එකහතාවයකින් බැහැරව ලාභ සමකිරීමේ සංචිතයට මෙලෙස ශේෂය මාරුකිරීම මගින් සාමාජිකයින්ට බෙදිය හැකි ලාභය අඩුවීමේ හැකියාවක් පැවතුණි.

(ඌ) 2025 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 9.029 ක් වූ අතර ඒ තුළ වර්ෂ 2001 ත් 2024 ත් අතර කාල පරාසයට අයත් වටිනාකම රු.මිලියන 4.6 ක් විය. මෙම ශේෂ නිරවුල් කිරීමට හෝ නැවත සාමාජික ගිණුමට බැර කිරීමට හෝ ගනු ලබන ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 1982 වර්ෂයේ සිට 2022 දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවායෝජකයින් හඳුනාගත නොහැකිව සමාලෝචිත වර්ෂය දක්වා දිගින් දිගටම පැවත එන V999 නම් අවිනිශ්චිත ගිණුමෙහි පවතින ශේෂය රු.මිලියන 6.52 ක් වී තිබුණි.

(ඒ) විශ්‍රාම ගොස් ආසන්න වශයෙන් වසර 1.5ත් වසර 17 ත් අතර කාලයක් ගතවී ඇති නිලධාරීන් 06 දෙනෙකුට අදාල ණය නොවන අයවිය යුතු මුදල් ශේෂය රු.108,415ක් වන අතර විශ්‍රාම ගොස් වසර 1.5 ත් වසර 4 ත් අතර කාලයක් ගතවී ඇති නිලධාරීන් 04 දෙනෙකුට අදාලව අය විය යුතු රු.3,211,035ක ණය ශේෂය 2026 අප්‍රේල් 30 දිනට වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

# 2025 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන්

# **කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම**

**2.2.2 නීති/රීති විධානයන්ට අනුකූල නොවීම.**

(අ) 2024 විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාවේ ප්‍රගතිය මසක් ඇතුලත ලබාදීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරන අතර 2025 වර්ෂයට අදාලව කළමණාකරන විගණකාධිපති වාර්ථාවක් ඉදිරිපත් කරන්නේ නම් ප්‍රමාදයකින් තොරව අදාල ප්‍රගතියන් ලබාදීමට අවශ්‍ය උපදෙස් කළමනාකාරිත්වය වෙත ලබාදීමට කටයුතු කර ඇත.

(ආ) **රු.6,868/64**

මෙය පරිගණක පද්ධතියේ සිදු වී ඇති දෝෂයක් හේතුවෙන් 2018 වසරේ සිට මේ දක්වා මෙම අගය මාස 06 ක් ඉක්ම වූ චෙක්පත් පිළිබඳ වාර්තාවේ සඳහන් වේ. (System Error)

**රු.1,669/05**

මෙම අගය සහිත චෙක්පත A/23775/240 සාමාජික අංක දරණ ඒ.ආර්.ඒ.ආර්. සෙනෙවිරත්න මහතා වෙත 2023/515801 දරන ලොට් අංක යටතේ නිකුත් කරණ ලද චෙක්පතකි. මෙය Unpresented චෙක් ලැයිස්තුවේ ඍණ අගයක් (1669.05-) ලෙස සඳහන් වි තිබුණි. මෙය පරිගණක පද්ධතියේ දෝෂයක් නිසා සිදු වුවක් වන අතර මෙහි සඳහන් වන අගය වැරදි බැවින් ඒ වෙනුවට 2023/527336 දරණ ලොට් අංකය යටතේ සාමාජිකයාට මුදල් ගෙවා නිරවුල් කර ඇත.

ඉහත සඳහන් චෙක්පත් අංක දෙකම පරිගණක පද්ධතියේ Unpresented චෙක්පත් ලැයිස්තුවේ පෙන්නුම් කරනු ලබන්නේ පරිගණක පද්ධතියේ දෝෂයක් (System Error) හේතුවෙනි. මෙම චෙක්පත් දෙකම පරිගණක අංශයේ සහය ඇති ව චෙක්පත් ලැයිස්තුවෙන් ඉදිරියේ දී ඉවත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස අදාල අංශවලට උපදෙස් ලබා දීමට අපේක්ෂා කරමි.

**රු.147,939/16, රු.415,865/10, රු.154,438/25, රු.10,349/59**

මෙම චෙක්පත් රඳවා ගත් බදු නිදහස් කිරීමේ දී සාමජිකයන්ට ගෙවිය යුතු මුදල් නිදහස් කිරිම සඳහා නිකුත් කරන ලද චෙක්පත් වේ. මේවා Unclaim වලට මාරු කිරීමේ දී පරිගණක පද්ධතියේ දෝෂ සිදු විය හැකි බැවින් Unpresented ලැයිස්තුවෙන් ඉවත් කර Unclaims වලට මාරු කර නැත.

පරිගණක පද්ධතිය මගින් සිදු වී ඇති දෝෂයන් නිසා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අපහසු බැවින් මෙම දෝෂ නිවැරදි කිරීමට විගණන හා කලමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබාගැනීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය මත ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

(ඇ) (i) 2026 වර්ෂයේ සිට නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. 2026 වර්ෂයේ පළමු කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා ඇති අතර දෙවැනි කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ රැස්වීම ජුනි මාසයේ පැවැත්වීමට සැලසුම් කර ඇත.

(ii) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට (SLIDA) සීමාසහිත ලංකා ලුණු සමාගම (පරිපාලිත සමාගම) සම්බන්ධයෙන් ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීමට අවශ්‍ය කාර්යය ලබාදී ඇති අතර වර්තමානය වනවිට එහි කටයුතු සිදුවෙමින් පවතී. මෙහි ප්‍රගතිය ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරනු ලබයි.

2026.03.30 වන දින රු.529,444/44ක ඇස්තමේන්තුගත මුදලක් යටතේ ඉහත සඳහන් ආයතනයට ප්‍රතිපත්ති මාලාව සකස් කිරීමට ලබාදීම සඳහා ලංකා ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඇස්තමේන්තුගත මුදලින් 50% ක මුදලක් වර්තමානය වනවිට ගෙවා වැඩ කටයුතු ආරම්භ කර ඇත.

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

**(iii) මෙහෙයුම් කාර්ය පටිපාටි සංග්‍රහය**

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත දැනට භාවිතා කරන මණ්ඩලයේ මෙහෙයුම් කාර්ය පටිපාටිය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) සහයෝගය සහිතව යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇති අතර එකී කටයුතු අවසන් වීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතව පවතී.

**මූල්‍ය කාර්ය පටිපාටි සංග්‍රහය**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ක්‍රියාපටිපාටි අත්පොත (Financial Procedure Manual) 2022 ජූනි 23 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. අනුමත කරන ලද අත්පොත මෙතෙක් නැවත ලැබී නොමැත. අනුමැතිය කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් අදාළ අංශවලට ලබා දීමට කටයුතු කරනු ලබයි.

(ඈ) සංයුක්ත දීමනා ගෙවීම සම්බන්ධව නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛණ වල පැවති වගන්ති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2018 ට අනුව සංශෝධනය කිරීම සඳහා 2024.03.25 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලබාදී ඇති අනුමැතිය පරිදි පෙර පැවති අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2006/26හි 1 වැනි වගන්තිය සංශෝධනය කර මාසික මූලික වැටුප පදනම් කරගෙන සංයුක්ත දීමනාව ගෙවීමට කටයුතු කර ඇත. එහෙත් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025හි 20වන වගන්තිය දක්වා ඇති පරිදි උපලේඛන අංක 111හි සඳහන් සේවක වර්ගීකරණය අනුව සංයුක්ත දීමනා ගෙවීම් සම්බන්ධයෙන් ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතියට යොමු කිරීමට තීරණය වේ.

(ඉ) 2024 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 2.4.(ආ) iii ජේදය පරිදි ප්‍රසම්පාදන කමිටුව තම පළමු රැස්වීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ දින නියම කිරීම සිදු කර නොමැති බවට වූ කරුණට එකග වේ. එම දෝෂය 2026 වර්ෂයේ සිට නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. පළමු ප්‍රසම්පාදනයේ දී දින වකවානු තීරණය නොකළ ද විගණන ජේදයේ දක්වා ඇති කාර්යයන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වීමේ දී දින වකවානු ලබා දී ඇත. තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරනු ලබයි.

අ. ප්‍රචාරණය සිදු කළ යුතු දින ගිවිසුමේ වගන්ති අංක 3 යටතේ ඉදිරිපත් කර ඇත.

ආ. ප්‍රසම්පාදන ලේඛන නිකුත් කිරීම හා ලංසු යෝජනා භාර ගැනීම, අවසන් කිරීමට අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලිපි ලේඛන අධ්‍යයනය කිරීම තුළින් ලබාගත හැකිය.

ඇ. ප්‍රසම්පාදන ලේඛනය විවෘත කරන දිනය 2025 පෙබරවාරි 05 වන දින පෙරවරු 10.30 සිදු කර ඇත.

**2.2.3**

(අ) විගණන ජේද මඟින් පෙන්වා දී ඇති කරුණු සමග එකග වන අතර විගණන ජේද මඟින් පෙන්වා දී ඇති ආයතන සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර නොමැති බව ද නිරීක්ෂණය වේ. කරුණු එසේ වුව ද මේ තුළින් මණ්ඩලය විසින් විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති කරුණු විසඳීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුනොකර ඇති බව ගම්‍ය නොවේ.

මණ්ඩලය විසින් සක්‍රීය සේවායෝජකයින් 86,000ක් හඳුනාගෙන ඇති අතර ඒ තුළින් දායක මුදල් ක්‍රමවත් ලෙස නොගෙවා ඇති ආයතන සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර ඇත. අක්‍රීය සේවායෝජකයින් 125,000 හඳුනාගෙන ඇති අතර එසේ හඳුනාගෙන ඇති සේවායෝජකයින් සක්‍රීය තත්ත්වයට යොමුකර ගැනීමේ අරමුණින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් ද සිදුකර ඇත.

ඉහත දක්වා ඇති කරුණු සාර්ථක කර ගැනීමේ අරමුණින් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා කොට්ඨාසය පිහිටුවා ඇති අතර කටයුතු වඩා විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා දිවයින ආවරණය වන ලෙස ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇත. එම කාර්යාල විසින් මූලික වශයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකරන අතර 2008 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සිදුකර ඇති සේවායෝජක පරීක්ෂාවන් සංඛ්‍යාව 47,020කි. එහි සාරාංශයක් පහතින් පෙන්නුම් කර ඇත.

| කාලය | ආයතන ප්‍රමාණය |
|---|---|
| 2008/07 – 2012/12 | 9,112 |
| 2013/01 – 2016/12 | 14,182 |
| 2017/01 – 2021/12 | 13,894 |
| 2022/01 – 2025/12 | 9,832 |
| **එකතුව** | **47,020** |

විගණන ඡේද මගින් පෙන්වා දී ඇති ආයතන කඩිනමින් පරීක්ෂා කර වර්තමාන ප්‍රගතිය ලබාදීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති අතර මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති දායක මුදල් නිසි පරිදි නොගෙවන හා අක්‍රිය සේවායෝජකයින් හඳුනාගෙන එම ආයතනවල වර්තමාන මෙහෙයුම් ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂාවක් පිළිගත හැකි නිර්ණායකට අනුව ශ්‍රේණිගත කර ඉදිරි අවුරුදු 05ක කාලයක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඉදිරිපත් කරන ලෙස අදාල අංශවලට උපදෙස් ලබාදී ඇත. මේ අනුව ඉදිරියේදී එම සැලසුමට අනුව කටයුතු කර ඇති ද යන්න හා ඒ තුළින් මණ්ඩලය ලබා ඇති ප්‍රගතිය පරීක්ෂා කර මාවෙත වාර්තා කරන ලෙස මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයට උපදෙස් ලබාදී ඇත. මීට අමතරව මාසිකව ප්‍රාදේශීය කාර්යාල සමග පවත්වන ප්‍රගති රැස්වීම්වලදී සාකච්ඡා කර පසු විපරම් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත. ඉහත දක්වා ඇති අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීම තුළින් මෙම ගැටලුව විසඳීමට අවශ්‍ය යාන්ත්‍රණය සකස් කර ඇත.

මීට අමතරව විගණන ඡේද මගින් පෙන්වා දී ඇති ගැටලුව කළමනාකරණය කර ගැනීම සඳහා පහත දැක්වෙන නිශ්චිත ඉලක්ක ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදී ඇත.

1. මාසික පරීක්ෂා කළයුතු ස්ථාන ප්‍රමාණයන්
2. ඵලදායී ස්ථාන පරීක්ෂණ ප්‍රතිශතය
3. හඳුනා ගත් නව සාමාජිකයින් ප්‍රමාණය
4. මාසික ස්ථාන පරීක්ෂණ මත ගණනය කරන ගෙවීම් නියෝජිත වටිනාකම

ඉහත ඉලක්ක සපුරා ගැනීම තුළින් පහත සඳහන් කාර්යයන් ප්‍රාදේශීය කාර්යල විසින් සිදුකරනු ලබයි.

1. මෙතෙක් දායක මුදල් නොගෙවන ලද සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි ආයතන වෙත දායක මුදල් ගෙවීම සඳහා ලිඛිතව දැනුවත් කිරීම් සිදුකිරීම.

2. ගෙවීම් ප්‍රමාද වී ඇති සේවායෝජක ආයතනවලට ගෙවීම් සිදුකිරීම සඳහා දැනුම්දීම් කිරීම.

3. ඉහත දැනුවත් කිරීම් සඳහා ප්‍රතිචාර නොදක්වනු ලබන සේවායෝජකයින්ගේ ආයතන පරීක්ෂා කොට හිඟ මුදල් අයකිරීම් කටයුතු කිරීම.

4. සේවකයින් වෙනුවෙන් දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි භාරගැනීම, විමර්ශණය කිරීම හා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම.

විගණන ඡේද අංක 2 හා 3 මගින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී මණ්ඩලයේ විෂයපථයෙන් පරිබාහිරව ඇති කරුණුද පවතින අතර ඒ තුළින් සිදුවන අවහිරතා මත ද මෙම ගැටලු විසඳීමට අපහසු වී ඇත. එම කරුණු නම්,

1. ක්‍රියාත්මක කිරීම් කටයුතුවලට අදාල තොරතුරු පරිගණකගත කිරීම 2008 වර්ෂයේදී සිදුකරන ලද අතර ඊට පෙර වර්ෂවල තොරතුරු ලබාගැනීමේ ප්‍රායෝගික ගැටලු පැවතීම.

2. සේවායෝජක ස්ථාන වසාතිබීම/හැර ගොස් තිබීම/සොයාගත නොහැකි වීම මත ප්‍රමාදයන් සිදුවීම.

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

3. සේවායෝජක ආයතන වසා තිබුණ ද මණ්ඩලයේ ගිණුම්වලින් අදාල තොරතුරු කපා හැරීමට නොහැකි වීම.

ඉහත දක්වා ඇති කරුණු විසඳීමට අවශ්‍ය ක්‍රමවේදයන් අධ්‍යනය කර මෙම ගැටලු කඩිනමින් විසදීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

(ආ) 2026.05.22 දින වනවිට සේවායෝජකයින් සංඛ්‍යාව 5,960 දක්වා අඩු වී ඇති අතර විභජනය නොකළ මුදල් මිලියන 20කින් අඩු වී ඇත. ඒ අනුව 2026.05.20 දිනට විභජනය නොකළ මුදල් ශේෂය රු.876,405,046.75.

ඉදිරියේදී මෙම කටයුතු අවම කිරීම සඳහා ඊ.ටී.එෆ්. දායක මුදල් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රේෂණය කිරීම අනිවාර්ය කර ඇත. මීට අමතරව Form II Text File මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාදීම අනිවාර්ය කර ඇත.

2015 - 2024 දක්වා විභජනය නොකළ මුදල් කඩිනමින් විභජනය කිරීම සඳහා අදාල අංශ වෙත ලිඛිතව උපදෙස් ලබා දීමට කටයුතු කර විගණනය දැනුවත් කිරීමට කටයුතු කරනු ලබයි.

**2.2.4**

(අ) මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ දෙවන භාගය තුල ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. සැලසුම් කළ පරිදි නියමිත කාලසීමාව තුල මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීමට නොහැකි විය. අදාල දෘඩාංග උපාංග මිළදී ගැනීම සිදුකළ යුතු බව ICTA ආයතනය මගින් දිගින් දිගටම අවධානය ලක්කර තිබු බැවින් ර්බීය ආමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය සිදුකර ඇත. මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු මෙම යන්ත්‍රවල අවශ්‍යතාවය මතුවන අතර ඒ අනුව මේවා යොදාගැනීමට සැලසුම් කර ඇත.

(ආ) වාර්ෂිකව නැවත අළුත් කිරීමේ පදනම මත රුපියල් මිලියන 500 ක් ස්ථාවර තැන්පතු හා ප්‍රතිමිළදී ගැණුම්වල ආයෝජනය කර ඇත්තේ මණ්ඩලයේ ප්‍රධානතම දායක මුදල් රැස්කිරීමේ ගිණුමක් පවත්වාගෙන යාමේ පහසුව ලබා දීම වෙනුවෙන් ලංකා බැංකුව සහ මණ්ඩලය අතර ඇති වූ එකගතාවයක් අනුවය. එසේම එම ආයෝජනයන් වාර්ෂිකව අළුත්කරන (Renew) අවස්ථාවේදී ප්‍රතිමිළදී ගැනීම් හා ස්ථාවර තැන්පතු සඳහා රාජ්‍ය බැංකු 3 හි එම දිනට පවතින පොලී අනුපාතයක් සංසන්ධනය කර වඩා වාසිදායක පොලී අනුපාතයක් යටතේ ලංකා බැංකුවේ ආයෝජනය කරනු ලැබේ. ඒ අනුව වාර්ෂිකව වෙළඳපොළ පොලී අනුපාතවල විචලනය අනුව පවත්නා පොලී අනුපාත යටතේ එම තැන්පතු පවත්වා ගැනීමට අවකාශය සැළසී ඇත.

මණ්ඩලය වෙත චෙක්පත් මගින් කෙරෙන දායක මුදල් රැස්කිරීම් සඳහා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන බැංකු ගිණුම වන ලංකා බැංකු ගිණුම් අංක 1839 මගින් 2025 වර්ෂයේ චෙක්පත් 512,981 ක් සඳහා රු.මිලියන 7,940 ක් වටිනා ගණුදෙනු සිදු කර ඇත. අමතරව ගිණුමට අදාලව වර්ෂයේ අගරු චෙක්පත් 1,707 ක වටිනාකම රු. මිලියන 33 ක් වේ.

මෙම ගිණුම් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් විශේෂ පහසුකම් ලංකා බැංකුව වෙතින් ලබා දීම සිදු වේ.

- දිනකට දෙවරක් ලංකා බැංකුවේ කුරියර් සේවාව විසින් මණ්ඩලය වෙත පැමිණ චෙක්පත් රැගෙන යාම (ප.ව.12.00 සහ ප.ව.2.30)
- බැංකු ප්‍රකාශන සහ අගරු චෙක්පත් මණ්ඩලය වෙත භාර දීම
- බැංකුව වෙත ප.ව.12.00 දක්වා ලබා දෙන චෙක්පත්වල වටිනාකම එදින බැංකු ගිණුමට බැර කිරීම සහ ඉන් පසුව ලබා දෙන චෙක්පත්වල වටිනාකම පසුදින හෝ ඊට පසුදින වන විට ගිණුම වෙත බැර කිරීම
- මණ්ඩලය වෙත දෛනිකව ගිණුමේ ගනුදෙනු සහ ශේෂය පරික්ෂා කිරීම සඳහා ප්‍රවේශණ පහසුකම් සැලසීම.

ඒ අනුව බැංකුව විසින් ලබා දෙන සේවාවන් සහ විශේෂ පහසුකම් සඳහා රු.100,000.00 ක මාසික සේවා ගාස්තුවක් 2005 වර්ෂයේ සිට වර්ථමානය දක්වා කිසිදු වැඩි කිරීමකින් තොරව මණ්ඩලය විසින් ගෙවීම් කෙරේ.

කෙසේ වුවද මෙම ස්ථාවර තැන්පතු නැවත ආයෝජනය කිරීමට ප්‍රථම වර්තමාන තත්ත්වයට වඩා වැඩි වාසිදායක සැළසුමක් යටතේ පවත්වාගෙන යාමට ඇති හැකියාව හෝ වෙනත් වාසිදායක විකල්ප අවස්ථා පිළිබඳ විශ්ලේෂණය කර තීරණය කිරීමට පියවර ගනු ලැබේ

(ඇ) ඉහත සමාගමේ ආයෝජනය දිගු කාලීන ආයෝජන කළඹ තුළ ඇති හෝටල් ක්ෂේත්‍රයට අයත් සමාගමකි. මෙම සමාගමේ ආයෝජනයෙන් 2011 සිට 2020 දක්වා ලාභාංශ ආදායම් ලෙස රු.මිලියන 24.16 ක් ලැබී ඇති අතර, 2011 සහ 2012 වසරවලදී මෙම සමාගමේ කොටස් විකුණා ප්‍රාග්ධන ලාභ ලෙස රු. මිලියන 18 ක් උපයා ගෙන ඇත. නමුත් 2020 වසරේ පැවති කොරෝනා වසංගත තත්ත්වය සහ රටේ පැවති ආර්ථික අවපාතය නිසා සංචාරක හෝටල් ක්ෂේත්‍රය අලාභ ලබන තත්ත්වයට පත් වූ බැවින් 2020 වසරේ සිට 2024 වසර දක්වා ලාභාංශ ප්‍රකාශයට පත් කර නැති අතර, 2025 වසරේ සිට නැවත සංචාරක ක්ෂේත්‍රයේ දියුණුවත් සමග එම සමාගම ද ලාභ ලබන තත්ත්වයට පත්ව ඇති අතර, ලාභාංශ ප්‍රකාශයට පත් කර රු.383,739 ක ලාභාංශයක් ලැබී ඇත. රට තුළ පවතින සංචාරක ක්ෂේත්‍රයේ දියුණුවත් සමගම ඉදිරි වසරවලද ලාභාංශ ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන අතර එම සමාගමේ කොටස්වල කොටස් වෙළඳපොල මිළ සත්‍ය පිරිවැයට වඩා ඉහළ අගයක් ගන්නා විට ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීමට අපේක්ෂා කරමු.

(ඈ) මණ්ඩලය විසින් 2002.11.29 වන දින SLT ආයතනයේ කොටස් මූලික නිකුතුවෙන් (IPO) කොටසක් රු.15.00 බැගින් කොටස් 12,793,288 ක් සඳහා රු.191,899,320 ක ආයෝජනය කර ඇත. එම සියලුම කොටස් 2002 සිට 2006 දක්වා කාලය තුල රු.38,011,523.24 ක් ප්‍රාග්ධන ලාභ සහිතව වරින් වර විකුණා ඇත.

නැවතත් 2006.02.10 වන දින සිට 2009.03.30 වන දින දක්වා කොටස් 4,181,400 ක් විවිධ මිළ පරාසයන් යටතේ මිළදී ගැනීම සහ කොටස් 925,000 ක් රු.මිලියන 6.9 ක ප්‍රාග්ධන ලාභ සහිතව වරින් වර විකිණීම සිදු කර ඇති අතර විගණන විමසුමේ සඳහන් කොටස් ප්‍රමාණය වන 3,302,188 ක් මෙම කාල පරාසය තුළ මිළදී ගෙන ඇත.

2008.02.25 දිනැති ලිපිය මගින් Sri Lanka Telecom ආයතනයේ කොටස් රජයේ හිමිකාරිත්වය කෙරෙහි බලපෑමක් ඇති කරන බැවින් මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව විකිණීම නොකරන ලෙසට මහා භාණ්ඩාගාරයෙන් ලිඛිත උපදෙස් ලැබී තිබුණි. ඒ අනුව SLT ආයතනයේ කොටස් වෙළඳපොලේ ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීම නතර කරන ලදී. 2009.03.30 වන දින වන විට SLT ආයතනයේ කොටස් 3,302,188 ක හිමිකාරිත්වයක් මණ්ඩලය සතු වූ අතර, එහි මුළු සත්‍ය පිරිවැය රු.110,340,299.24 ක් වූ අතර කොටසක සත්‍ය පිරිවැය රු.33.41 ක් විය.

SLT සමාගමේ කොටසක මිළෙහි සැළකිය යුතු වැඩිවීමක් පවත්නා වර්ෂවලදී දැකිය හැකිය. එනම් රු.33.41 ක් වූ කොටසක් මේ වන විට රු.88.50 ක මිළකට වෙළඳපොළෙහි අලෙවි විය. 2026.04.30 දිනට කොටසක සත්‍ය පිරිවැය රු.33.41 ක වන විට එහි වෙළඳපොළ මිළ රු.86.00 ක් විය. මෙම කොටස 2026.02.02 දින රු.107.25 ක් ලෙසට ඉහළ වෙළඳ පොළ අගයකට ගනුදෙනු සටහන් වී ඇත.

SLT ආයතනයේ කොටස් 2008 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත විකිණීම නතර කරන ලද බැවින් වසර 17ක කාලයක සිට එම කොටස් ප්‍රමාණය ප්‍රාග්ධන ලාභ නොමැතිව රඳවා තබා ගැනීමට මණ්ඩලයට සිදුව ඇත. 2023 සහ 2024 වර්ෂ වලදී සාමාජිකයාට ගෙවූ ලාභාංශ 7% සහ 6.5% ට අමතරව එම සෑම වසරක් සඳහා ම 3% ක පොලියක් ද ගෙවා ඇත.

(ඉ) නාගරික සංවර්ධන අධිකාරිය සමඟ නව ආයෝජන අවස්ථා ඇති කර ගැනීම සඳහා මණ්ඩලය වර්තමානයේ සාකච්ඡා කරමින් පවතින අතර ඒ තුළින් ප්‍රශස්ථ ආයෝජන අවස්ථාවන් තෝරා උපරිම ප්‍රතිලාභයන් ලබාගැනීමට හා මණ්ඩලයේ භාවිතයට නොගෙන ඇති සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ආයෝජනය කිරීමට අපේක්ෂා කෙරේ.

## 03. වෙනත් කරුණු

**(අ) Elkaduwa Plantation Debenture**

මෙම සමාගම විසින් මාසිකව රු. 300,000.00 බැගින් හිඟ පොලී මණ්ඩලය වෙත ගෙවමින් පවතින අතර, සමාගම ඈවර කිරීම සම්බන්ධව නීතිමය කටයුතු අවසන් නොවී ඇති බැවින්, සනාථ කිරීම් ලිපි ලබා ගැනීමේ හැකියාවක් නොමැත.

**(ආ)** (i) සාමාජික ප්‍රමාණය වර්ධනය කිරීම සඳහා මණ්ඩලය විසින් විවිධ ක්‍රමෝපායන් : හඳුන්වා දී ඇති අතර ඒ පිළිබඳ තොරතුරු මණ්ඩලයේ වෙබ් පිටුව, දේශීය පුවත්පත් මගින්, ප්‍රචාරක වැඩසටහන් මගින් හා සේවාදායකයන් දැන්වීම් තැපෑලෙන් ලබාදීම තුළින් අදාල ප්‍රචාරණයන් සිදුකර ඇත. මීට අමතරව මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල හරහා අවුරුදු 05 ක් පුරා විහිදෙන ක්‍රමවත් සැලැස්මක් සකස් කිරීමෙන් පසු සක්‍රීය සේවායෝජක සංඛ්‍යාව තවදුරටත් වර්ධනය කර ගැනීමට හා නව සේවායෝජකයින් හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. මේ සම්බන්ධයෙන් අදාල අංශ ප්‍රධානින් ලිඛිතව දැනුවත් කර ඇති අතර මාසික ප්‍රගති රැස්වීම්වලදී තවදුරටත් මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කිරීමට පියවර ගනු ලැබේ. පෙර විගණන විමසුම් වලදී මේ සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය ලිඛිතව දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. 2025 වර්ෂයේ සිට වාර්ෂික වාර්තාව මගින් මණ්ඩලයේ මුල් සේවායෝජක හා සාමාජික සංඛ්‍යාව අනාවරණය කිරීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

(ii) සෘජුවම සාමාජිකයන් දැනුවත් කිරීම සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඔස්සේ දැනට e-service පහසුකම් සාමාජිකයන් වෙත ලබාදීමට පියවර ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස මාස 3ක කාලයක් තුල නව සාමාජිකයන් 1938 ලියාපදිංචි වී ඇති අතර මෙය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල අංශ ලිඛිතව දැනුවත් කිරීමට පියවර ගනු ලබයි. ප්‍රගතිය ත්‍රෛමාසිකව ලබාගෙන ජාතික විගණන කාර්යාලයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි.

(iii) සැලසුම් කල කාලය තුල ව්‍යාපෘති කටයුතු අවසන් නොවීමට ප්‍රධාන වශයෙන් පහත කරුණු බලපාන ලදි.

1. ව්‍යාපෘති කළමනාකාරිත්වය ICTA ආයතනය විසින් දැරූ අතර ව්‍යාපෘති කළමනාකාරිත්වයේ ගැටලු මූලික වශයෙන් ව්‍යාප්තියේ ප්‍රමාදයට බලපෑවේය.
2. කොවිඩ් වාතාරණය නිසා සිදුවූ ප්‍රමාද වීම.
3. වෙනස් ඉල්ලුම් (CR) සම්පූර්ණ කිරීමට සැලකිය යුතු කාලයක් ගතවීම.
4. තවත් ප්‍රධාන වෙනස්කම් කිපයක් පද්ධතිය හා සජීවිව යාමට පෙර සම්පූර්ණ කළයුතුව තිබීම.
5. OAT ආරම්භ කිරීමට පෙර පද්ධතිය පරික්ෂා කිරීමේදි පද්ධතිය තුල ගැටලු සහ දෝෂ ඇතිවීම.

එවකට සිටි ආයතන ප්‍රධානින්ගේ තීරණයක් මත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සිදුකර ව්‍යාපෘතිය සඳහා තොරතුරු තාක්ෂණ උපදේශකයකුගේ උපදේශය සඳහා වසරක කාලයක් 2024 වර්ෂයේ ලබාගන්නා ලදි. මෙහිදි තොරතුරු තාක්ෂණ උපදේශක විසින් ව්‍යාපෘතියේ මෙහෙයුම් පිළිගැනීමේ සැසි (OAT) ආරම්භ කිරීමට පෙර පද්ධතියට අදාලව වැඩ ප්‍රවාහ හඳුනාගැනිම සහ පද්ධතිය පරික්ෂණ ක්‍රියාවලියකට භාජනය කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. මෙහිදි පද්ධතිය තුල සහ ඊට සබැඳිව පද්ධති ගැටලු හඳුනාගැනිමට හැකිවිය.

මණ්ඩලයේ වත්මන් ව්‍යාපාර අවශ්‍යතාවය හා නව පද්ධතිය අතර පරස්පරතාවයක් ඇති බව ද නිරික්ෂණය කරන ලදි. මේ හේතුවෙන් OAT ක්‍රියාවලිය ආරම්භ කිරීම සැලසුම් කළ පරිදි කළ නොහැකි විය. තොරතුරු තාක්ෂණ උපදේශක විසින් මෙම අවස්ථාවේදී පද්ධතියට අදාල වැඩ ප්‍රවාහ නිසි ආකාරයෙන් හඳුනාගෙන ඒවා සියල්ල ආවරණය වන පරිදි පද්ධතිය තුල පරික්ෂා කර බැලීම පුමුඛ කාර්යයක් ලෙස හඳුනාගන්නා ලදි. ඒ අනුව ඊට අදාලව වැඩ කටයුතු සිදුකරන ලදි.

මෙහිදි තොරතුරු තාක්ෂණ උපදේශක මණ්ඩලයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි වෙත රාජකාරි වාර්තා කළ අතර ව්‍යාපෘතියට අදාල ඔහුගේ වාර්තා මණ්ඩලයේ සභාපතිට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වරින්වර ඉදිරිපත් කරන ලදි. 2025 දෙසැම්බර් අවසාන වනවිට ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය දරා ඇති මුලු වියදම රු.මි. 193 ලෙස සඳහන්ව ඇතත් ඉන් රු.මි. 151කට අධික ප්‍රමාණයක් වියදම් කර ඇත්තේ මූලික පද්ධති ව්‍යාප්ති ක්‍රියාත්මක කිරීමට සමගාමිව එදිනෙදා මෙහෙයුම් සුමටව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා දෘඩාංග උපාංග මිළදී ගැනිමටය. අප මණ්ඩලයේ මෙහෙයුම් වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා මෙම උපාංග ඵලදායි ලෙස දැනටමත් යොදාගෙන ඇත.

මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රසම්පාදනය සහ ව්‍යාපෘති කළමනාකරණය සිදුකරනු ලැබුවේ ICTA ආයතනය විසින් ව්‍යාපෘතියට අදාලව රාජ්‍ය ආයතන අතර අවබෝධතා ගිවිසුමක් (MOU) අප මණ්ඩලය සහ ICTA ආයතනය අතර තිබේ. ව්‍යාපෘතිය සංවර්ධනයට අදාල ගිවිසුම ICTA ආයතනය සහ සේවා සපයන්නා අතර පැවතුණු අතර ව්‍යාපෘතියට අදාල මූල්‍ය කටයුතු හසුරුවනු ලැබුවේ ද ICTA ආයතනය විසිනි.

ව්‍යාපෘතියට අදාලව සේවා සපයන්නා හා අප මණ්ඩලය අතර ගිවිසුම් ගතවීමක් සිදු වී නොමැති අතර එසේ ගිවිසුම් ගතවීමක් අවශ්‍ය වන්නේ ව්‍යාපෘතිය අප මණ්ඩලය වෙත නිල වශයෙන් භාරදීමෙන් පසුව විය යුතුය.

ව්‍යාපෘතියේ මෙහෙයුම් වගකීම අප මණ්ඩලයට පැවරීම සඳහා ICTA ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බව පවසා 2026 මැයි 15 වන දින ලිපියක් මඟින් එහි ප්‍රධාන විධායක නිලධාරි (වැ.බ) විසින් අප වෙත දන්වා ඇත. මීට අදාලව අප මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මේ වනවිට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත. ඊට අදාල අනුමැතීන් ලැබීමෙන් අනතුරුව නව ගිවිසුමකට එළඹීමට අදාල කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ.

(ඈ) i) මණ්ඩලයේ සතු නවම්මාවත රථගාලේ සවි කරන ලද දැන්වීම් පුවරු මීට වසර ගණනාවකට පෙර නවම් මාවත රථ ගාල මණ්ඩලයෙන් තවත් පාර්ශවයක් සඳහා බදු පදනම මත ලබා දී තිබූ අවස්ථාවේ ඔවුන්ගේ වියදමින් ඉදිකරන ලද පුවරු බව දන්වනු කැමැත්තෙමි. එම දැන්වීම් පුවරු සඳහා අදාළ කාලසීමාවට ගැලපෙන වටිනාකම මත වසරින් වසර 10% අගයකින් මුදල් අය කරගෙන පවත්වාගෙන ගියද, වාණිජ වටිනාකමක් සහිත මෙම භූමියේ එම අගය ප්‍රමාණවත් නොවන බව පෙනී ගිය හෙයින් රජයේ තක්සේරුවක් ලබාගෙන එම තක්සේරු වටිනාකම මත මිල තීරණය කිරීමට යෝජනා විය. ඒ අනුව එම දැන්වීම් පුවරු අයිති ආයතනය වෙත මේ බව දන්නවා ගිවිසුම් කාලසීමාව අවසන් වන දින තෙක් ප්‍රදර්ශනයට අවස්ථාව ලබාදුනි. එය 2026.03.31 දිනෙන් අවසන් විය. ඒ අනුව මණ්ඩලයේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා 2026.01.12 දින රජයේ තක්සේරුව ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලීම් ලිපයක් යොමු කර ඇතත් තක්සේරු නිලධාරීන්ගේ හිගය මත මෙය කෙටි කාලයකින් නිමකළ නොහැකි බව දන්වා ඇත. අපගේ ලිපියට පිළිතුරු වශයෙන් 2026.05.21 දින තක්සේරු කළ යුතු කොටස් සම්බන්ධයෙන් තොරතුරු විමසීමක් කර ඇත. ඒ අනුව මෙම පුවරු සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ii) නවම් මාවත රථගාලේ නැවතුම් පහසුකම් ලබා ගන්නා ආයතන වෙත සෑම ඉන්වොයිස් පතක් දින 14 ක් ඇතුළත ගෙවීම් කරන ලෙස දන්වා යොමු කරනු ලබයි. එසේ, යොමු කරන ඉන්වොයිස් පත් මගින් 50% ප්‍රමාණයක් කාලරාමුව තුල ගෙවීම් කරන අතර, තවත් කොටසක් ගෙවීම් සඳහා මාසයකට වැඩි කාල සීමාවක් ලබා ගනී. දීර්ඝ කාලයක් මෙම ආයතන අප මණ්ඩලය සමග ඇති සබඳතාවය මත මෙම සේවාව ලබා ගන්නා හෙයින් මෙම ආයතන සඳහා ලබා දෙන පහසුකම ඉවත් කිරීමට හැකියාවක් නොමැත.

එක් මසක ඉන්වොයිස් පත් ගෙවීම් කිරීම ප්‍රමාද වූ විට තවත් මසක ඉන්වොයිස් නිකුත් වීම තුළ එම ආයතනය ඉදිරියේ හිඟ වාරික නිර්මාණය වේ. කරුණු එසේ හෙයින්, හිඟ වාරික නිර්මාණය වීම වැළැක්වීම සඳහා ඉදිරියේදී එක් මසක් ආරම්භයේදී ගෙවීම් සිදු කර මෙම නැවතුම් පහසුකම් සඳහා පෙර ගෙවීම් කිරීමේ ක්‍රමවේදයක් මඟින් නැවතුම් පහසුකම් ලබා ගැනීමේ ක්‍රියාවලියක් සකස් කිරීමට අපේක්ෂා කෙරේ.

iii) නවම් මාවත රථ ගාලේ නැවතුම් පහසුකම් ලබා ගන්නා ප්‍රධාන ආයතනයක් වන N.T.B. ආයතනයේ මගින් ආරම්භයේදී වාහන 66 ක් සඳහා ආරක්ෂිත තැන්පතු මුදල් මණ්ඩලය වෙත බැර කර ඇත. ඉන් පසුව අළුතින් වාහන 45 ක ප්‍රමාණය ඇතුලත් වූ අතර,ඒ සඳහා අයවිය යුතු ආරක්ෂක තැන්පතුව වන රු.1,080,000 මුදල අයකර ගැනිම සඳහා එම ආයතනයේ මේ සම්බන්ධව කටයුතු කරන නිලධාරියා විද්‍යුත් තැපැල් මඟින් (email) හා දුරකථන මාර්ගය දැනුවත් කරන ලදී. ඒ අනුව ඔවුන් විසින් කඩිනමින් මෙම මුදල් ගෙවීමට ක්‍රියා කරන බව දන්වා ඇත.

(ඇ)

- මණ්ඩලය තුළ තොරතුරු ආරක්ෂණ කමිටුව පිහිටුවීමට අදාලව කෙටුම්පත් සකස් වෙමින් පවතින අතර පත්කිරීම්වලට අදාල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එය සිදුකිරීමට කටයුතු සුදානම් කරමින් පවතී.
- මණ්ඩලය තුල අවධානම් කළමනාකරණය කමිටුව පිහිටුවීමට අදාලව මූලික කෙටුම්පත සකස් වෙමින් පවති අතර පත්කිරීම් වලට අදාල අනුමැති ලබාගැනිමෙන් අනතුරුව එය සිදුකිරීමට කටයුතු සුදානම් කරමින් පවති.
- මණ්ඩලය 2026 ක්‍රියාකාරි සැලැස්මට තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහතික කළයුතු ආකාරය දැක්වෙන ක්‍රියාකාරි සැලසුම ඇතුලත් කර ඇති අතර මණ්ඩලය 2026 අයවැය ඇස්තමේන්තු තුලද අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇත.

www.etfb.lk

004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරීත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

- තොරතුරු වත්කම් ලේඛනය සකස් කිරිමට අදාලව උපදේශනයක් (SLCERT) වෙතින් අවශ්‍ය වන අතර ඉන් අනතුරුව මෙය සකස් කිරිමට සැලසුම් කර ඇත. වත්කම් ලේඛනය මේ වනවිට සකස් කරමින් පවති. තොරතුරු තාක්ෂණ වත්කම් ලේඛණය කාර්යක්ෂමව ලබාගැනිමට, යාවත්කාලින කිරිමට හා පවත්වා ගැනිමට මෘදුකාංගයක් මිලදී ගැනිම සඳහා 2026 වර්ෂයට අයවැය ප්‍රතිපාදන ලබාගෙන ඇත.

- මණ්ඩලය තුළ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල හා දත්ත මධ්‍යස්ථානය එකිනෙක SDWAN තාක්ෂණය ඔස්සේ ආරක්ෂිතව සම්බන්ධ වේ. මේ SDWAN තාක්ෂණය ඔස්සේ පරිගණක ජාල හරහා තොරතුරු කේතනය විමක් සිදුකර ගමන් කරයි. ප්‍රධාන දත්ත පද්ධතියට අදාල පරිශීලකයන්ගේ මුරපද කේතනය සිදුකර දත්ත සමුදාය තුළ ගබඩා කර තබයි.

- මණ්ඩලයට අදාල ප්‍රධාන පරිගණක පද්ධතිය ඇතුලු ප්‍රධාන පද්ධති දත්ත මධ්‍යස්ථාන තුළ ස්ථාපනය කර ඇත.ඒ සඳහා අන්තර්ජාතිකව පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇති අතර අන්‍යෝන්‍යතාව තහවුරු කිරිමට පද්ධතියක් ලබාදී ඇත. ප්‍රවේශන පාලන ක්‍රමවේදයක් ද සකස් කර ඇත.

- මණ්ඩලය තුළ ක්‍රියාත්මක වන සියලු පදධති සඳහා ඒවා භාවිතා කරන්නන්ගේ අනන්‍යතාව තහවුරු කර ඔවුන්ට භාවිතා කිරිමට ඇති අවශ්‍යතාවය මත ප්‍රවේශය විමේ අවසර ලබාදී ඇති අතර අන්‍යෝන්‍යතා කළමනාකරණය සහ ප්‍රවේශ පාලන ක්‍රම සකස් කර ඇත.

- මණ්ඩලය සතුව ආපදා ප්‍රතිසාධන ක්‍රමවේදයක් පවති. SLCERT සමග සාකච්ඡා කර සැලැස්ම සකස් කිරිමට කටයුතු සිදුකරමින් පවති.

(ඉ)

i. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සාමාජික සේවා) තනතුරට 2021 වර්ෂයේ දී බඳවාගත් නිලධාරියාගේ සේවා පලපුරුද්ද සහතික කර ගැනිම සඳහා ඔහු තුළින් සේවා කරන ලද සේවා ස්ථාන ප්‍රධානියා වෙත යොමු කළ ලිපියට පිළිතුරු ලිපියක් යොමු කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු වෙමින් පවතී.

ii. සැප්තැම්බර් 01 දින පත්කරනු ලැබූ සහකාර පරිපාලන නිලධාරීගේ උසස් කිරීමේ දිනය පෙරදාතම් කිරීම නිවැරදි කිරීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශ ලබා දී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී.

iii. කනිෂ්ඨ කළමනාකරු මට්ටමේ නිලධාරියාට ලබා දී තිබූ කළමනාකරු (ප්‍රතිලාභ පරිපාලන) තනතුරේ වැඩ බැලීම නිවැරදි කිරීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශ ලැබී ඇති අතර ඒ අනුව ඉදිරියේ දී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ගැටලුව නිරාකරණය කිරීමට කටයුතු කෙරේ.

iv. අභ්‍යන්තර විගණන අංශයේ අංශ ප්‍රධානි විසින් අංශයේ ඉදිරි කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැස්මක් සකස් කර එහි සේවක අවශ්‍යතාවය මත ඉදිරි බඳවාගැනීම් සිදුකිරීමට අවශ්‍ය තොරතුරු පරිපාලන හා මානව සම්පත් අංශයට ලිඛිතව ලබාදීමට කටයතු කිරීමට අපේක්ෂා කර සේවා පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි.

(ඊ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සඳහා යෝජිත 5(2) වගන්තියට අදාල සංශෝධනය ඇතුලු සියලුම සංශෝධන සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට පෙර ඒ පිළිබඳව විෂයභර අමාත්‍යවරයා සමග සාකච්ඡා කර සමාලෝචනය කර ඒ සම්බන්ධයෙන් නිශ්චිතව තීරණය කළයුතු බව 2025.06.27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගත් තීරණය ප්‍රකාරව 2025.08.13 වන දින මුදල් අමාත්‍යාංශයේ දී අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික කටයුතු) සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (නීති කටයුතු) ඇතුලු අමාත්‍යාංශයේ අදාල නිලධාරීන් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපතිවරයා ඇතුලු අදාල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් යෝජිත සංශෝධන සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වනු ලැබීය.

උක්ත සාකච්ඡාවට අදාල තීරණ සහ උපදෙස් මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික කටයුත) විසින් 2025.10.24 දිනැති ලිපිය මඟින් මණ්ඩලයේ සභාපතිවරයාට දැනුම් දි ඇත. එකී ලිපියෙන් පනත සංශෝධනය සම්බන්ධයෙන් අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය සහ අදාල සංශෝධිත ලේඛණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසට මණ්ඩලයේ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශය සහ නැවත සකස් කරන ලද පනතට යෝජිත සංශෝධනවල කෙටුම්පත සඳහා 2025 නොවැම්බර් මස 24 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම (776 වන) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් (අංක 282/2025) ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදි.

ඉන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද පනතට යෝජිත සංශෝධනවල කෙටුම්පත සහ ඊට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත අවශ්‍ය ඉදිරි පියවර ගැනිමට 2025.12.17 වන දින මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත.

(උ) ලාභාංශ තුලන සංචිතයේ (Dividend Equalizatụon Reserve) අරමුණ වන්නේ අරමුදලේ සාමාජිකයින්ට ගෙවන ලාභාංශ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමයි. අහිතකර වෙළඳපොල පොලී අනුපාත උච්චාවචනයන් (වෙනස් වීම්) හේතුවෙන් පොලී ආදායම අඩුවන කාල වකවානුවලදී මෙම සංචිතය ප්‍රයෝජනයට ගනු ලැබේ. මෙම සංචිතය භාවිතා කිරීම මඟින්, අරමුදලට තම සාමාජිකයින් වෙනුවෙන් ස්ථාවර පොලී හා ලාභාංශ අනුපාතිකයක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබේ.

මෙම සංචිතය සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිවය.

හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ 2025.12.31 දිනට තිබූ ශේෂයෙහි 2026.04.30 දිනට පවතින තත්ත්වය පහත පරිදි වේ.

| | Unpaid Death Benefits | |
|---|---|---|
| | **අයදුම්පත් ගණන** | **වටිනාකම (රු)** |
| 2025.12.31 දිනට ශේෂය | 1337 | 29,500,167.18 |
| 2026 වර්ෂයේ නිදහස් කලා | 9 | 742,217.64 |
| 2026.04.30 දිනට ශේෂය | 1328 | 28,757,949.54 |

2026 වර්ෂයේ නිදහස් කරන ලද 09 දෙනාගේ තොරතුරු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 1 | 06/2025/506786/D/M | MADUSANKA H K B | 1,109.96 |
| 2 | 07/2010/532009/D/S | SUBHAWICKRAMA J V | 48,541.86 |
| 3 | 03/2014/513107/D/M | A DEVADAS | 4,273.15 |
| 4 | 11/2015/548361/D/S | SALHAUMMAH A L | 18,584.10 |
| 5 | 07/2017/532127/D/M | B S AMARADASA | 1,717.45 |
| 6 | 10/2020/526270/D/M | INDRAN K | 302,387.01 |
| 7 | 08/2024/512121/D/M | ANULAWATHI M W | 44,104.46 |
| 8 | 03/2017/511876/D/S | K S CHANDRABOSE | 75,634.99 |
| 9 | 12/2023/528441/D/S | RUPASINGHE K | 245,864.66 |
| | | | **742,217.64** |

(ඌ) හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ලෙස ගිණුම් ශේෂයන් ඇති වන්නේ, අප මණ්ඩලයේ මිය ගිය සාමාජිකයින්ට අයත් සාමාජික ගිණුම් ශේෂය ගෙවීම් කිරීමේ දී, මිය ගිය අයගේ උරුමකරුවන් හෝ නාමිකයන් සියල්ලම ප්‍රතිලාභ මුදල් ඉවත් කර ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් නොකිරීම නිසාය. ඒ අනුව ඉදිරිපත් වන උරුමකරුවන් හෝ නාමිකයන්ට අයත් කොටස ගෙවීමෙන් අනතුරුව ඉතිරිය "හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ" ලෙස මණ්ඩලීය ගිණුමේ රඳවා තබා ගන්නා අතර බොහෝමයක් උරුමකරුවන් හෝ නාමිකයන් පිළිබඳ පෞද්ගලික තොරුතුරු අප සතුව නොමැති වීම මෙන්ම, ඔවුන් විදේශ ගතව සිටීම යන හේතූන් මත වාර්ෂික හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ශේෂය ක්‍රමයෙන් වැඩි වී ඇත. සියලුම උරුමකරුවන් ඉදිරිපත් නොවන විටෙක ප්‍රතිලාභ මුදල් නොගෙවා සිටීමේ තීරණයක් ගැනීම මත ඉදිරිපත් වන හිමිකම්ලාභින් එම ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව අහිමිවන බැවින් වාර්ෂිකව මෙම ශේෂය ඉහළ ගිය ද මියගිය සාමාජිකයින්ගේ උරුමකරුවන් කිහිපදෙනෙකුට හෝ ප්‍රතිලාභ භුක්තිවිඳීමේ අවස්ථාවක් මෙමගින් හිමි වේ.



004 අපගේ 45 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම
016 ආයතනික භාරකාරිත්වය
071 මූල්‍ය තොරතුරු
120 අතිරේක තොරතුරු

(එ) ඇතැම් සේවායෝජකයන් විසින් දායක මුදල් මණ්ඩලය වෙත ප්‍රේෂණය කර තිබුණ ද, එම ගෙවීම් සම්බන්ධ සේවායෝජක තොරතුරු නියමිත පරිදි නොලැබීම හේතුවෙන් හඳුනාගත නොහැකි වූ දායක මුදල් V100 හා V999 අවිනිශ්චිත ගිණුම්වල ගිණුම්ගත කර ඇති අතර, අනතුරුව අදාළ සේවායෝජක තොරතුරු ලැබීමෙන් පසු නිවැරදි ගිණුම් වෙත මාරු කිරීම සිදු කර ඇත.

මෙම ගිණුම්වලට අදාළව 2021 වර්ෂයේ පැවති ශේෂය රු. මිලියන 28.309 ක් වූ අතර, නිවැරදි සේවායෝජක ගිණුම් හඳුනාගෙන ශේෂ මාරු කිරීමේ ක්‍රියාවලිය හරහා එම ශේෂය වර්තමානය වන විට රු. මිලියන 6.52 ක් දක්වා අඩු කිරීමට කටයුතු කර ඇත.

එම ශේෂයෙන් 2020 වර්ෂයෙන් පසු සේවායෝජකයන් විසින් බැංකුගත කර ඇති රු. 389,411.90 ක මුදලට අදාළ ගෙවීම් සම්බන්ධ තොරතුරු සේවායෝජකයන් විසින් වරින් වර සපයනු ලබන අතර, ඇතැම් ගෙවීම් පිළිබඳ විස්තර අදාළ බැංකු මගින් ද ලබා ගනු ලැබේ. එම තොරතුරු මත V999 ගිණුමේ ගිණුම්ගත කර ඇති ගෙවීම් නිවැරදි සේවායෝජක ගිණුම් වෙත මාරු කිරීම සිදු කරනු ලබන නමුත් තවදුරටත් එසේ තොරතුරු ලබා ගැනීම ඉතා අසීරු බව නිරීක්ෂණය වේ.

අවිනිශ්චිත ගිණුම්වල ශේෂය අවම කිරීම සහ එම ශේෂය තවදුරටත් වර්ධනය වීම වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

a) 2006 වසරට පෙර සිදු කර ඇති රු. 6,135,719.13 ක බැර කිරීම් මේ වන විට හඳුනාගත නොහැකි බැවින්, 2023.03.29 දින පැවති විගණන කමිටු උපදෙස් අනුව එම ගිණුම් ශේෂ වෙන්කිරීමට කටයුතු කර ඇත. ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විගණන කමිටුවේ උපදෙස් හා නිර්දේශ ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමට නියමිතය.

b) සේවායෝජකයන් විසින් දායක මුදල් හා අධිභාර මුදල් ගෙවීම් කිරීමේදී සෘජුව බැංකුගත කිරීම සඳහා ලබා දී තිබූ පහසුකම් හේතුවෙන් මෙවැනි ගැටලු ඇතිවී තිබූ බැවින්, වර්තමානය වන විට එවැනි සෘජු බැංකුගත කිරීම් සීමා කිරීමට කටයුතු කර ඇත.

c) සේවායෝජකයන් විද්‍යුත් ගෙවීම් ක්‍රමවේද ඔස්සේ දායක මුදල් ගෙවීමට යොමු කිරීම.

(ඒ) ඉදිරියේදී අදාල හිඟ මුදල් අයකර ගැනීම සඳහා අංශ ප්‍රධානීව ලිඛිතව දැනුවත් කර ඇත.

**සෝමසිරි ඒකනායක**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report
# 2025


EMPLOYEES' TRUST FUND BOARD

19 - 23 Floors, "MEHEWARA PIYESA",
P.O.Box 807, Kirula Road, Narahenpita, Colombo 05.
Tel: 011 7747201 | Fax: 011 2503917
Email: finance@etfb.lk
Web: www.etfb.lk